# සංචාරක ගමනාන්තයන්හි ඇති අවදානම් සහ අවදානම් සඳහා මුහුණාදීම පිළිබඳ අත්පොත



Implemented by

තිරසාර සංචාරක සේවා (පුද්ගලික) සමාගම, බදුල්ල



“තිරසාරභාවය යනු තවදුරටත් අඩු හානියක් කිරීම නොවේ.
එය වඩා හොඳ දෙයක් කිරීම ගැනයි...”

- ජොචෙන් සෙයිට්ස්

# ව්‍යාපෘති දායකත්ව කණ්ඩායම

**මහාචාර්ය ජේ.පී.ආර්.සී. රණසිංහ**
අධ්‍යක්ෂ/ සීමාසහිත තිරසාර සංචාරක සේවා පුද්ගලික සමාගම, ප්‍රධානී/මහාචාර්ය සංචාරක අධ්‍යයන අංශය, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය, බදුල්ල, ශ්‍රී ලංකාව
සභාපති/ සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය-ඌව පළාත

**මහාචාර්ය. ආර්.එස්.එස්.ඩබ්ලිව්. ආරච්චි මහතා**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/ සංචාරක කළමනාකරණ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

**සම්පත් නිශ්ශංක මහතා**
ප්‍රධාන විධායක නිලධාරී, ඌව පළාත් සංචාරක මණ්ඩලය

**ඩබ්ලිව්.ජී.එස්.ආර්. විජේසුන්දර මිය**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සංචාරක අධ්‍යයන අංශය, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය, බදුල්ල, ශ්‍රී ලංකාව

**ඒ.සී.අයි.ඩී. කරුණාරත්න මිය**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සංචාරක අධ්‍යයන අංශය, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය, බදුල්ල, ශ්‍රී ලංකාව
ඒ.එම්.ඩී.බී. නවරත්න මහතා
කථිකාචාර්ය, සංචාරක අධ්‍යයන අංශය, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය, බදුල්ල, ශ්‍රී ලංකාව

**සී.පී. දන්තනාරායන මිය**
කථිකාචාර්ය, සංචාරක අධ්‍යයන අංශය, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය, බදුල්ල, ශ්‍රී ලංකාව

**යූ.ජී.ඕ. සම්මානි මිය**
කථිකාචාර්ය, සංචාරක අධ්‍යයන අංශය, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය, බදුල්ල, ශ්‍රී ලංකාව

**ඩබ්ලිව්.එම්.ඒ.එච්. බණ්ඩාර මහතා**
කථිකාචාර්ය, සංචාරක අධ්‍යයන අංශය, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය, බදුල්ල, ශ්‍රී ලංකාව

**පී.ජී.එස්.එස්. පට්ටියගෙදර මිය**
කථිකාචාර්ය, සංචාරක අධ්‍යයන අංශය, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය, බදුල්ල, ශ්‍රී ලංකාව

**ආර්.ඒ.ඩී.ඩී.එන්. රණතුංග මිය**
කථිකාචාර්ය, සංචාරක අධ්‍යයන අංශය, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය, බදුල්ල, ශ්‍රී ලංකාව

**ඒ.එම්.එන්.එම්. ගංගානන්ද මහතා**
කථිකාචාර්ය, සංචාරක අධ්‍යයන අංශය, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය, බදුල්ල, ශ්‍රී ලංකාව

**ජී.එච්.වී. හර්ෂනී මෙනවිය**
කථිකාචාර්ය, සංචාරක අධ්‍යයන අංශය, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය, බදුල්ල, ශ්‍රී ලංකාව

**එච්.එන් ජයවර්ධන මෙනවිය**
කථිකාචාර්ය, සංචාරක අධ්‍යයන අංශය, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය, බදුල්ල, ශ්‍රී ලංකාව

**ඩබ්ලිව්.ටී හංසක මහතා**
කථිකාචාර්ය, සංචාරක අධ්‍යයන අංශය, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය, බදුල්ල, ශ්‍රී ලංකාව

**ඡායාරූප අනුග්‍රහය: එම්.එල්.සී. සයුරංග**
කථිකාචාර්ය, සංචාරක අධ්‍යයන අංශය, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය, බදුල්ල, ශ්‍රී ලංකාව

**නිර්මාණය: එස්.එස්. රෝසා**
අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය

# අන්තර්ගතය


සාරාංශය ........ 2

පෙරවදන ........ 3

01 වන පරිච්ඡේදය - දළ විශ්ලේෂණය 5

1.1 පසුබිම සහ අරමුණ ........ 6
- 1.1.1 අත්පොතෙහි ඉලක්කගත ප්‍රේක්ෂකයින්

1.2 ඔරොත්තු දීමේ හැකියාව සහ DRAG යෙදුම පිළිබඳ සංකල්පමය අවබෝධය ........ 10
- 1.2.1 ගමනාන්තය නිර්වචනය කිරීම
- 1.2.2 සංචාරක ව්‍යාපාරයට ඇති උවදුරු, අවදානම් සහ බලපෑම් හඳුනා ගැනීම
- 1.2.3 ක්‍රියාවන් සඳහා අවදානම් සහ විකල්ප අවබෝධ කර ගැනීම
- 1.2.4 ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීම සඳහා සක්‍රිය කරන්නන් සහ බාධක විශ්ලේෂණය කිරීම
- 1.2.5 ක්‍රියාවන් සඳහා විකල්ප සාකච්ඡා කිරීම සහ ඔරොත්තු දීමේ මූලධර්ම පිළිබිඹු කිරීම
- 1.2.6 පුහුණු වැඩසටහන පැවැත්වීම
- 1.2.7 ගමනාන්ත මට්ටමෙන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

1.3 භාවිතා කරන ක්‍රම ........ 14
- 1.3.1 අතීත සාහිත්‍යය
- 1.3.2 ක්ෂේත්‍ර චාරිකාව සහ ද්විතියික පර්යේෂණ
- 1.3.3 කණ්ඩායම් සාකච්ඡා

2 වන පරිච්ඡේදය - සංචාරක පද්ධතිය 17

2.1 සන්දර්භය ........ 18
- 2.1.1 ඇල්ල ප්‍රදේශයේ ප්‍රධාන සංචාරක ආකර්ෂණ ස්ථාන

2.2 සංචාරක ක්‍රියාකරුවන් ........ 24

2.3 අදාළ මූලාශ්‍ර වෙළෙඳපොළ සහ අමුත්තන්ගේ පැතිකඩ ........ 26

2.4 ගමනාන්ත ඉන්වෙන්ටරි ........ 27
- 2.4.1 6As' මාදිලිය භාවිතා කරමින් ගමනාන්ත ඉන්වෙන්ටරි
- 2.4.2 බට්ලර් ආකෘතිය භාවිතයෙන් ගමනාන්ත ජීවන චක්‍රය
- 2.4.3 ඇල්ලට අදාළව සංචාරක වටිනාකම් දාමය
- 2.3.4 ඇල්ල සඳහා SWOT විශ්ලේෂණය
- 2.4.5 ඇල්ල සඳහා SOAR විශ්ලේෂණය

2.5 පාලන ව්‍යුහයන් ........ 39

3 වන පරිච්ඡේදය - අවදානම් ලේඛනය 41

3.1 සංචාරක ව්‍යාපාරයට ඇති උපද්‍රව සහ බලපෑම් ........ 42
- 3.1.1 ස්වාභාවික උපද්‍රව සහ සංචාරක ව්‍යාපාරයට ඒවායේන් ඇති බලපෑම පිළිබඳ දළ විශ්ලේෂණය
- 3.1.2 මිනිසා විසින් සාදන ලද උපද්‍රව සහ සංචාරක ව්‍යාපාරයට ඒවායේන් ඇති බලපෑම පිළිබඳ දළ විශ්ලේෂණය

3.2 සංචාරක ව්‍යාපාරයට ඇති ප්‍රධාන අවදානම් ........ 63
- 3.2.1 ප්‍රධාන අවදානම් පිළිබඳ දළ විශ්ලේෂණය
- 3.2.2 සම්භාවිතාව - බලපෑම් අවදානම් අනුකෘතිය

4 වන පරිච්ඡේදය - ක්‍රියා සඳහා විකල්ප 79

4.1 ක්‍රියාවන් සඳහා විභව විකල්ප පිළිබඳ දළ විශ්ලේෂණය ........ 80
- 4.1.1 ජල විද්‍යාත්මක සහ භූ විද්‍යාත්මක අවදානම්
- 4.1.2 ජීව විද්‍යාත්මක අවදානම්
- 4.1.3 දේශපාලන අවදානම්
- 4.1.4 මූල්‍ය අවදානම්
- 4.1.5 සමාජ සහ සංස්කෘතික අවදානම්

4.2 සමීක්ෂණ ප්‍රතිඵල ඉදිරිපත් කිරීමට "ක්‍රමානුකූල එකඟතා ගොඩනැගීම" ප්‍රවේශය ........ 86

4.3 ක්‍රියාවන් සඳහා විකල්ප පිළිගැනීම ........ 87

4.4 නිශ්චිත ඔරොත්තු දීමේ හැකියාව සඳහා බාධක ........ 93

4.5 නිශ්චිත ඔරොත්තු දීමේ හැකියාව සඳහා අවස්ථා ........ 95

4.6 සාමාන්‍ය ඔරොත්තු දීමේ හැකියාව සඳහා ප්‍රත්‍යස්ථතා මූලධර්ම ........ 97
- 4.6.1 විවිධත්වය
- 4.6.2 සම්බන්ධතාවය
- 4.6.3 ඉගෙන ගැනීම
- 4.6.4 සහභාගීත්වය
- 4.6.5 බහුත්ව පාලනය

5 වන පරිච්ඡේදය - සංශ්ලේෂණය - සංචාරක ගමනාන්තයේ ඔරොත්තු දීමේ හැකියාව 99

5.1 ක්‍රියාවන් සඳහා විභව විකල්ප පිළිබඳ දළ විශ්ලේෂණය ........ 100

6 වන පරිච්ඡේදය - නිගමනය 111

යොමු කිරීම් ........ 113


## රූප සහ වගු ලැයිස්තුව


රූප සටහන 1.1 අත්පොතෙහි ඉලක්කගත ප්‍රේක්ෂකයින් වර්ගීකරණය ........ 8

රූප සටහන 1.2 ජාතික සංචාරක කර්මාන්ත සභාව වර්ගීකරණය ........ 9

රූප සටහන 1.3 යෝජිත ක්‍රමවේදයේ සාරාංශ රූප සටහන ........ 13

රූප සටහන 2.1 ගමනාන්ත සිතියම - ඇල්ල ........ 19

රූප සටහන 2.2 සංචාරක ක්‍රියාකරුවන් වර්ගීකරණය ........ 25

රූප සටහන 2.3 ගමනාන්ත ජීවන චක්‍රය ........ 28

රූප සටහන 2.4 ඇල්ල සඳහා සංචාරක වටිනාකම් දාමය ........ 33

රූප සටහන 2.5 SWOT විශ්ලේෂණය ........ 35

රූප සටහන 2.6 SOAR විශ්ලේෂණය ........ 37

රූප සටහන 2.7 සංචාරක පාලන රාමුව ........ 40

රූප සටහන 3.1 විශේෂඥ වැඩමුළුව හරහා හඳුනාගත් අවදානම් පිළිබඳ සාරාංශය ........ 63

රූප සටහන 3.2 සම්භාවිතා බලපෑම් අවදානම් අනුකෘතිය ........ 73

රූප සටහන 3.3 ඇල්ලේ ස්වභාවික හා මිනිසා විසින් සාදන ලද අවදානම් සම්භාවිතා බලපෑම් අනුකෘතිය ........ 77

වගුව 2.1 6As' මාදිලිය භාවිතා කරමින් ගමනාන්ත ඉන්වෙන්ටරි ........ 27

වගුව 3.1 ස්වාභාවික උපද්‍රවවල අවදානම්, අවදානම් හේතු සහ බලපෑම් පිළිබඳ සාරාංශය ........ 43

වගුව 3.2 මිනිසා විසින් සාදන ලද උපද්‍රවවල අවදානම්, අවදානම් හේතු සහ බලපෑම් පිළිබඳ සාරාංශය ........ 49

වගුව 3.3 ස්වාභාවික උපද්‍රව, ඒවායේ බලපෑම්, බලපෑමට ලක් වූ පාර්ශ්වයන් සහ රියදුරන්ගෙන් හඳුනාගත් අවදානම් පිළිබඳ සාරාංශය ........ 65

වගුව 3.4 මිනිසා විසින් සාදන ලද උපද්‍රවයන්, ඒවායේ බලපෑම්, බලපෑමට ලක් වූ පාර්ශ්වයන් සහ රියදුරන්ගෙන් හඳුනාගත් අවදානම් පිළිබඳ සාරාංශය ........ 67

වගුව 3.5 සම්භාවිතා අවදානම් න්‍යාසයට අනුව ස්වභාවික අවදානම් වල සාරාංශය ........ 74

වගුව 3.6 සම්භාවිතා අවදානම් අනුකෘතියට අනුව මිනිසා විසින් සාදන ලද උපද්‍රව පිළිබඳ සාරාංශය ........ 75

වගුව 4.1 පිළිගත හැකි විකල්පවල සාරාංශය ........ 88

වගුව 4.2 ඇල්ලේ ක්‍රියා සඳහා විකල්ප පිළිගැනීම ........ 89

වගුව 4.3 ඇල්ලෙහි නිශ්චිත ඔරොත්තු දීමේ හැකියාව සඳහා බාධක ........ 93

වගුව 4.4 ඇල්ලේ නිශ්චිත ඔරොත්තු දීමේ හැකියාව සඳහා අවස්ථා ........ 95

වගුව 5.1 ඇල්ල සංචාරක ගමනාන්තයේ ඔරොත්තු දීමේ සැලැස්ම ........ 101



# සාරාංශය

ගෝලීය සන්දර්භය තුළ ආර්ථික ක්‍රියාකාරකමක් ලෙස සංචාරක කර්මාන්තය අඛණ්ඩව වර්ධනය වෙමින් පවතින අතර 1948 නිදහසින් පසු ශ්‍රී ලංකාව ආර්ථික සංවර්ධනය සඳහා එය විකල්පයක් ලෙස පිළිගෙන ඇත. කෙසේ වෙතත්, දිගුකාලීනව තිරසාර බව සහතික කිරීම සඳහා අවශ්‍ය අවදානම් විශ්ලේෂණයක් සහ ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීමේ සැලැස්මක් රටේ බොහෝ ගමනාන්තයන් සඳහා මෙතෙක් නිසි ලෙස සැලසුම් කර නොමැත. විශේෂයෙන්ම,මෑත වසරවලදී ඇල්ල ප්‍රදේශයේ ආර්ථිකයේ ප්‍රධාන මූලාශ්‍රය බවට සංචාරක කර්මාන්තය පත්ව ඇතත් එය ස්වභාවික විපත් සහ මානව ක්‍රියාකාරකම් නිසා සිදුවන උපද්‍රව ඇතුළු උවදුරු සහ අවදානම් ගණනාවකට මුහුණ දී ඇත. එබඳු ගැටලුවලට වහා අවධානය යොමු කළ යුතු අතර ඇල්ල සංචාරක ගමනාන්තය තුළ ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීම සහ තිරසාර සංවර්ධනය සහතික කිරීම සඳහා පුළුල් අවදානම් කළමනාකරණ උපාය මාර්ග හඳුන්වාදීම කළ යුතුය. මෙහිදී, ප්‍රදේශයේ දිගු කාලීන තිරසාර සංචාරක සංවර්ධනය සහතික කිරීම සඳහා ඇල්ල ප්‍රදේශයේ අවදානම් තක්සේරු කිරීම සහ ඒ සඳහා සැලැස්මක් සංවර්ධනය කිරීමට ආපදා අවම කිරීම සඳහා වන ජර්මානු කමිටුව (DKKV) ඉදිරිපත් වී ඇත. ආපදා අවම කිරීම සඳහා වන ජර්මානු කමිටුව සහ ජර්මානු සංචාරක කර්මාන්තයේ තිරසාර මුලපිරීම වන Futouris ආයතනයන්, සංචාරක ගමනාන්තයන්හි අවදානම් සඳහා ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීම සහ නැගී එන ආර්ථිකයන්හි තිරසාර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගත් ව්‍යාපෘතියක් සඳහා සහයෝග යෙන් කටයුතු කරනු ලබයි. ඒ අනුව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන්නේ ආපදා අවම කිරීම සඳහා වන ජර්මානු කමිටුව ජර්මානු සංචාරක කර්මාන්තයේ තිරසාර මුලපිරීම වන Futouris ආයතනයන් විසිනි.

තරඟකාරී ලංසු තැබීම් සහ යෝජනා ඇගයීම් ක්‍රියාවලියක් හරහා සීමාසහිත තිරසාර සංචාරක සේවා පුද්ගලික සමාගමෙහි විශේෂඥ කණ්ඩායමේ ව්‍යාපෘති ක්‍රියාකාරකම් සඳහා ප්‍රදානය ලබා ගන්නා ලදී. මෙහිදී ව්‍යාපෘතියෙහි පළමු පියවර ලෙස, තෝරාගත් ගමනාන්තයක අවදානම් සහ උපද්‍රව පිළිබඳ සවිස්තරාත්මක දළ විශ්ලේෂණයක් ඉදිරිපත් කිරීමට මෙම අත්පොත සකස් කරන ලදී. ඒ අනුව පර්යේෂණ, විශේෂ කණ්ඩායම් සාකච්ඡා, ක්ෂේත් චාරිකා සහ ව්‍යාපෘති කණ්ඩායමේ අත්දැකීම් මත පදනම්ව විශේෂිත ගමනාන්තය ලෙස "ඇල්ල" තෝරා ගන්නා ලදී. සංචාරක ගමනාන්තයක් ලෙස ඇල්ලෙහි වත්මන් තත්ත්වය, පාර්ශවකරුවන්ගේ අධ්‍යයනය කිරීම, ගමනාන්ත වටිනාකම් දාමය ඇතුළත් ගමනාන්ත විශ්ලේෂණයක් මෙන්ම පූර්ව පර්යේෂණ පත්‍රිකා අධ්‍යයනය සහ කණ්ඩායම් සාකච්ඡා මත පදනම්ව හඳුනාගනු ලැබූ අවදානම් රැසකින් මෙම වාර්තාව සමන්විත වේ. මෙම අත්පොත ආරම්භයේදීම ව්‍යාපෘතියේ පසුබිම සහ අරමුණු නිදර්ශනය කිරීමෙන් අනතුරුව සංචාරක ගමනාන්තයන්හි අවදානම් සහ අවදානම් සඳහා මුහුණදීමෙ හැකියාව ගොඩනැගීම, සංකල්පමය තහවුරු කිරීම් මගින් නිරූපණය කෙරේ. එමෙන්ම පළමු පරිච්ඡේදයේ අවසාන කොටස මෙම අත්පොත නිර්මාණය කිරීමෙ ක්‍රියාවලියේදී අනුගමනය කරන ක්‍රමවේදය පිළිබඳව විස්තර කරයි. සංචාරක ක්‍රමයන්, ක්‍රියාකාරීන් සහ සංචාරක පාලන ව්‍යුහය දෙවන පරිච්ඡේදයේ විස්තාරණය කර ඇති අතර මෙම අත්පොතේ තුන්වන පරිච්ඡේදය සංචාරක ව්‍යාපාරයට බලපාන අවදානම් සහ උපද්‍රව පිළිබඳව විශ්ලේෂණය කරයි. අවදානම් සඳහා ප්‍රතිචාර දැක්වීමේ උපාය මාර්ග හතරවන පරිච්ඡේදයේ දක්වා ඇති අතර ප්‍රතිචාර දැක්වීමේ හැකියාව ගොඩනැගීමේ ශිල්පීය ක්‍රම පස්වන පරිච්ඡේදයේ විස්තර කර ඇත.






# පෙරවදන

ආපදා අවම කිරීම සඳහා වන ජර්මානු කමිටුව සහ Futouris (DKKV) විසිනි

COVID-19 වසංගතය ගෝලීය වශයෙන් ආර්ථික හා සමාජ පද්ධති කෙරෙහි විනාශකාරී බලපෑමක් ඇති කර ඇති අතර එමගින් යම් රටවල අභ්‍යන්තරයේ පවතින දුර්වලතා සහ අසමානතා අනාවරණය කර ගෙන ඇත. COVID-19 හැරුණු විට, ජීවිත, ජීවනෝපාය සහ වත්කම් අහිමිවීම් හරහා සෘජුවම ආර්ථික නිෂ්පාදනයට, සුබසාධනයට සහ සමාජයට සිදුවන හානිය මෙන්ම චක්‍රව දැනෙන දේශගුණය ආශ්‍රිත ව්‍යසනවල අඛණ්ඩ වැඩිවීමක් ලොව පුරා නිරීක්ෂණය කළ හැකිය. විශේෂයෙන්ම සංචාරක කර්මාන්තය නොවෙනස්ව පවතින පරිසර පද්ධති, ගෝලීය ව්‍යාපාරික ක්‍රියාකාරකම්, සමාජීය සහ සංස්කෘතික අත්දැකීම් මත බෙහෙවින් රඳා පවතින බැවින් ඉහත කී ගැටළු සංචාරක කර්මාන්තය කෙරෙහි වැඩි බලපෑමක් කරයි. ඒ අනුව, සංචාරක ව්‍යාපාරය බොහෝ බාහිර සාධක මගින් බලපෑමට ලක්වන විශේෂයෙන් අවදානමට ලක්විය හැකි කර්මාන්තයක් වන අතර, එය ලොව පුරා බොහෝ ප්‍රජාවන්ට, විශේෂයෙන් දුෂ්කර ප්‍රවේශ්‍යතා සහිත, ආර්ථික වෙළඳපොලවලින් දුරස්ථභාවය සහ සීමිත කර්මාන්ත ඇති කලාපවල අත්‍යවශ්‍ය ආදායම් මාර්ගයකි. මේ අනුව, මෙම සංකීර්ණ හා අන්තර් සම්බන්ධිත අවදානම් ආමන්ත්‍රණය කිරීම සංචාරක ගමනාන්ත සඳහා වැදගත් ප්‍රමුඛතාවයක් බවට පත්ව ඇත.

මෙම අවදානම් හි වර්ධනයන් අනුව, අවදානම් සමඟ කටයුතු කිරීමේ ප්‍රධාන සංකල්පයක් ලෙස ඒවාට ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය වී ඇත. ඒ සඳහා අපේක්ෂිත ක්‍රියාව අවධාරණය කරන අතර කෙටි කාලීනව මුහුණ දීමේ පියවර පමණක් නොව, ඉගෙනීම, අනුවර්තනය සහ පරිවර්තනය යන මධ්‍ය කාලීන සහ දිගු කාලීන අංශ ද ඇතුළත් වේ. පොදු මතයන්ට පටහැනිව, අවදානම් සඳහා ඔරොත්තු දීමේ හැකියාව තිරසාරභාවය සමඟ ගැටෙන්නේ නැත, නමුත් එය තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) සාක්ෂාත් කර ගැනීමේ අඛණ්ඩ ප්‍රගතිය සහතික කිරීම සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. තිරසාර සංවර්ධනය අවදානම් කළමනාකරණයේ සෑම අදියරකටම ඒකාබද්ධ කිරීම සීමා කිරීමට වඩා අනාගත ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීමට සහාය විය හැක. අවදානම් මුලින් හඳුනාගැනීම පිළිඹඳව සංකල්පය නිරන්තරයෙන් සාකච්ඡාවට  භාජනය වන මාතෘකාවක් වුවත් බොහෝවිට ඒ සඳහා පිළිගත් සංකල්පීය පැහැදිලි කිරීමක් නොමැත.

සංචාරක ගමනාන්ත මට්ටමින් ප්‍රතිරෝධය යන්නෙන් ඇත්ත වශයෙන්ම අදහස් කරන්නේ කුමක්ද? අවදානම් සඳහා ඔරොත්තු දීමේ හැකියාව විශ්ලේෂණය කර පසුව එය ගොඩනගා ගත හැක්කේ කෙසේද? මෙම ගැටළු පිළිබඳ අවබෝධය වැඩි කිරීමට සහ සංචාරක ගමනාන්තයන් තුළ අවදානම් සඳහා ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීමට දායක වීමට 'Destination Resilence' ව්‍යාපෘතිය ආරම්භ කර ඇත. ජර්මානු ආර්ථික සහයෝගිතා සහ සංවර්ධන අමාත්‍යාංශය (BMZ) වෙනුවෙන් Deutsche Gesellschaft für Internationale Zusammenarbeit (GIZ) GmbH හි සහාය ඇතිව ආපදා අවම කිරීම සහ තමඑදමරසි සඳහා ජර්මානු කමිටුව විසින් ක්‍රියාත්මක කරන ලද මෙම ව්‍යාපෘතිය, ආපදා අවදානම අවම කිරීම සහ තිරසාර සංචාරක ව්‍යාපාරය යන ක්ෂේත්‍රවල පුළුල් පරාසයක විශේෂඥතාවක් ඒකාබද්ධ කරයි. ව්‍යාපෘතිය තුළ, අවදානම් සඳහා ඔරොත්තු දීමේ හැකියාව තක්සේරු කිරීම සහ ගොඩනැගීම සඳහා ක්‍රියාවලි-නැඹුරු සහ සහභාගීත්ව ක්‍රමවේදයක් සපයන පරිපූර්ණ ගමනාන්ත ප්‍රත්‍යස්ථතා විශ්ලේෂණ මාර්ගෝපදේශයක් සකස් කරන ලදී. එම මාර්ගෝපදේශය පියවර 5ක් වටා ව්‍යුහගත කර ඇති අතර, ඒවා දේශීය සන්දර්භය සැලකිල්ලට ගනිමින් අවදානම් පිළිඹඳ දැනුවත් කිරීම් සහ තිරසාර සංචාරක කළමනාකරණය සඳහා ගමනාන්ත ප්‍රත්‍යස්ථතා මාර්ග සංවර්ධනය කිරීමේ පදනම වේ. ඩොමිනිකන් ජනරජයේ, නැමීබියාවේ සහ ශ්‍රී ලංකාවේ සංචාරක ගමනාන්ත තුනක පියවර 5 ප්‍රවේශය සාර්ථකව ක්‍රියාත්මක කර ඇත.

මෙම අවදානම් සහ අවදානම් සඳහා ඔරොත්තු දීමේ අත්පොත ගමනාන්ත විශ්ලේෂණයේ ප්‍රතිඵල සහ ප්‍රධාන නිගමන ඉදිරිපත් කරයි. එය ශ්‍රී ලංකාවේ ඇල්ල ප්‍රදේශයේ අවදානම අඩු කිරීමට සහ ඔරොත්තු දීමේ හැකියාව වැඩි කිරීමට ක්‍රියා කිරීම සඳහා වටිනා විකල්ප හඳුනා ගනී. ශ්‍රී ලංකාවේ ඇල්ල ප්‍රදේශයේ දේශීය සන්දර්භයට ගැලපෙන පරිදි අවදානම් සඳහා ඔරොත්තු දීමේ ක්‍රම විශ්ලේෂණයක් ඉදිරිපත් කිරීම මෙන්ම එම ක්‍රියාවන් සඳහා යෝජිත විකල්පවල අදාළත්වය සහතික කරයි. යෝජිත උපාය මාර්ගවල හිමිකාරිත්වය වැඩි කිරීම සඳහා දැනුමේ සහභාගීත්වය සහ සම-නිර්මාණය කිරීමේ මූලධර්ම මත අත්පොත ගොඩනගා ඇත. අනාගත සංවර්ධනය සෑම පුද්ගලයෙකුටම අදාළ කර්තව්‍යයක් වන බැවින් අදාළ සියලුම ක්‍රියාකාරීන් එකතු කර ගැනීම තුළින් ජීවත්වීමට සහ සංචාරය කිරීමට හැකියාවක් ලබා දෙන සහ තිරසාර සංචාරක ගමනාන්තයන් නිර්මාණය කළ හැකිය.

# දළ විශ්ලේෂණය

1 පරිච්ඡේදය



## 1.1 පසුබිම සහ අරමුණු

සංචාරක කර්මාන්තය ගෝලීය වශයෙන් වේගයෙන්ම වර්ධනය වන ආර්ථික අංශයක් ලෙස පිළිගෙන ඇත. රටෙහි තුන්වන විශාලතම විදේශ විනිමය ඉපැයීමේ විකල්පය ලෙස ශ්‍රී ලංකා රජය දැනට රටේ ආර්ථිකය මුහුණ දී ඇති බොහෝ ගැටලු සඳහා විසඳුමක් ලෙස සංචාරක සංවර්ධනයට ප්‍රමුඛත්වය ලබා දී ඇත. කෙසේ වෙතත්, දිගුකාලීන තිරසාර බව සහතික කිරීම සඳහා අවශ්‍ය අවදානම් විශ්ලේෂණය සහ ඒවාට ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීමේ සැලැස්මක් සමඟ රටේ බොහෝ සංචාරක ගමනාන්ත නිසි ලෙස සැලසුම් කර නොමැත.

මෑතක සිට ඇල්ල ජනප්‍රිය සංචාරක ගමනාන්තයක් ලෙස නැගී එන අතර, අතීතයේ දී ඇල්ලෙහි ප්‍රාදේශීය ප්‍රජාවන් කෘෂිකර්මය, තේ වතු සහ දෛනික වැටුප් වැඩ මත යැපෙන්නට පුරුදුව සිටියහ. මෑත වසරවලදී සංචාරක කර්මාන්තය ඔවුන්ගේ ආර්ථිකයේ ප්‍රධාන මූලාශ්‍රය බවට පත්ව ඇත. ආසන්න වශයෙන් 45,000 ක ජනතාවක් ප්‍රදේශයේ ජීවත් වන අතර මූලික වශයෙන් සංචාරක ක්‍රියාකාරකම් ආශ්‍රිත ස්වභාවික සම්පත් මත යැපෙන නමුත් ඌන සංවර්ධිත යටිතල පහසුකම්, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සහයෝගය නොමැතිකම, වෙළඳපල පිළිබඳ දැනුම හා අවබෝධය නොමැතිකම ස්වභාවික විපත් හේතුවෙන් ප්‍රජාවගේ ජීවන තත්ත්වය දුර්වල මට්ටමක පවතී. කෙසේ වෙතත්, ඇල්ල ප්‍රදේශයේ ප්‍රජාව සංචාරකයින් පිළිග ැනීමට සහ සංචාරක ක්‍රියාකාරකම්වලට සම්බන්ධ වීමට කැමැත්තෙන් සිටිනුයේ දේශීය හා විදේශීය සංචාරකයින් විශාල සංඛ්‍යාවක් මෙම ගමනාන්තයට ආකර්ෂණය වන බැවිනි.

මෑතක සිට ඇල්ල ශ්‍රී ලංකාවේ කුඩා සංචාරක කලාපයක් ලෙස ගැසට් කර ඇත. කෙසේ වෙතත්, නැගී එන සැලසුම් රහිත සංචාරක ක්‍රියාකාරකම් පරිසරයේ ස්වාභාවික සැකැස්ම සහ ප්‍රජාවගේ ජීවනෝපාය ද අවුල් කිරීමේ අවදානමක් ඇති කරයි. තවද, සමාජ-සංස්කෘතික බලපෑමක් ලෙස, සත්කාරක ප්‍රජාව සහ සංචාරකයින් අතර සෘණාත්මක ගැටුම් ප්‍රජා පාදක සංචාරක ව්‍යාපාරයේ (Community Based Tourism) දියුණුවට බලපෑම් ඇතිවීම් පෙන්වා දිය හැකිය.

එපමණක් නොව, දැනට, ඇල්ල ස්වාභාවික විපත් සහ මානව ක්‍රියාකාරකම් නිසා සිදුවන උපද්‍රව ඇතුළු උවදුරු සහ අවදානම් රැසකට මුහුණ දී සිටින අතර, ඒවා වහා විසඳා ගත යුතු අතර, අවදානම් සඳහා ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීමට සහ ගමනාන්තය තුළ තිරසාර සංවර්ධනයක් සහතික කිරීම සඳහා පුළුල් අවදානම් කළමනාකරණ උපාය මාර්ග දක්වා වර්ධනය කළ යුතුය.

මෙම පසුබිම මධ්‍යයේ, ප්‍රදේශයේ දිගුකාලීන තිරසාර සංචාරක සංවර්ධනයක් සහතික කිරීම සඳහා ඇල්ල ප්‍රදේශයේ අවදානම් තක්සේරු කිරීම් සහ ඔරොත්තු දෙන ගොඩනැගිලි සැලැස්මක් සංවර්ධනය කිරීමට ආපදා අවම කිරීම සඳහා වන ජර්මානු කමිටුව ඉදිරිපත් වී ඇත. එම ආපදා අවම කිරීම සඳහා වන ජර්මානු කමිටුව සහ ජර්මානු සංචාරක කර්මාන්තයේ තිරසාර මුලපිරීම වන Futouris, සංචාරක ගමනාන්තයන්හී අවදානම් සඳහා ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීම සහ නැගී එන ආර්ථිකයන්හි තිරසාර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගත් ව්‍යාපෘතියක් සඳහා සහයෝගයෙන් කටයුතු කරනු ලබයි. තවද මේ සඳහා ජර්මානු ෆෙඩරල් ආර්ථික සහයෝගිතා සහ සංවර්ධන අමාත්‍යාංශය (BMZ) වෙනුවෙන් Deutsche Gesellschaft für Internationale Zusammenarbeit (GIZ) GmbH සහය දෙනු ලබයි.

තරඟකාරී ලංසු තැබීම් සහ යෝජනා ඇගයීම් ක්‍රියාවලියක් හරහා සීමාසහිත තිරසාර සංචාරක සේවා පුද්ගලික සමාගමෙහි විශේෂඥ කණ්ඩායමේ ව්‍යාපෘති ක්‍රියාකාරකම් සඳහා මුදල් ප්‍රදානය ලබා ගන්නා ලදී. මෙහිදී ව්‍යාපෘතියෙහි පළමු පියවර ලෙස, තෝරාගත් ගමනාන්තයක අවදානම් සහ උපද්‍රව පිළිබඳ සවිස්තරාත්මක දළ විශ්ලේෂණයක් ඉදිරිපත් කිරීමට මෙම අත්පොත සකස් කරන ලදී. ඒ අනුව පර්යේෂණ, විශේෂ කණ්ඩායම් සාකච්ඡා, ක්ෂේත්‍ර චාරිකා සහ ව්‍යාපෘති කණ්ඩායමේ අත්දැකීම් මත පදනම්ව විශේෂිත ගමනාන්තය ලෙස "ඇල්ල" තෝරා ගන්නා ලදී.සංචාරක ගමනාන්තයක් ලෙස ඇල්ලෙහි වත්මන් තත්ත්වය, පාර්ශවකරුවන්ගේ සිතියම්කරණය, ගමනාන්ත වටිනාකම් දාමය ඇතුළත් ගමනාන්ත විශ්ලේෂණයක් මෙන්ම සාහිත්‍යය සහ කණ්ඩායම් සාකච්ඡා මත පදනම්ව හඳුනාගනු ලැබූ අවදානම් රැසකින් මෙම වාර්තාව සමන්විත වේ.

ඒ අනුව, මෙම අත්පොත සංවර්ධනය කිරීම තුළින් පහත සඳහන් **ප්‍රධාන අරමුණු** සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කෙරේ.

- ඇල්ල සංචාරක ගමනාන්තයේ මූලාශ්‍ර වෙළඳපල සහ අමුත්තන්ගේ පැතිකඩ හඳුනා ගැනීම
- ඇල්ල සංචාරක ගමනාන්තයේ සංචාරක ආකර්ෂණ ස්ථාන සහ වත්කම් හඳුනා ගැනීම
- ඇල්ල සංචාරක ගමනාන්තයේ සංචාරක පද්ධතිය සහ සංචාරක ක්‍රියාකාරීන් විශ්ලේෂණය කිරීම
- සංචාරක ගමනාන්තයක් ලෙස ඇල්ල ප්‍රදේශයේ ඇති වූ ස්වභාවික හා මිනිසා විසින් සිදු කරන ලද අවදානම් සහ උපද්‍රව විශ්ලේෂණය කිරීම



### 1.1.1 අත්පොතෙහි ඉලක්කගත පාර්ශවයන්

ප්‍රධාන වශයෙන් මෙම අත්පොතෙහි ඉලක්කගත පරිශීලකයන් තෝරා ගත යුතු වූයේ අත්පොත භාවිතා කරන්නන්ගේ උපරිම අපේක්ෂිත අරමුණු ඉටු කරන ආකාරයෙන් සහ ව්‍යාපෘති අරමුණු කෙරෙහි අවධානය යොමු කරමිනි. එම නිසා, එය රාජ්‍ය සහ පෞද්ගලික අංශය පදනම් කරගෙන ඉලක්කගත පාර්ශවයන් ලබගෙන ඇත. මෙම අත්පොතෙහි අනාගත ප්‍රතිලාභීන් සහ භාවිතා කරන්නන් පහත පරිදි ධුරාවලියක් ලෙස දැක්විය හැක.



**ඉලක්කගත පාර්ශවයන්**

**රාජ්‍ය අංශය**

1. මහ නගර සභා
2. පළාත් පාලන ආයතන
3. රජයේ සංවිධාන
4. පළාත් ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන
5. ආපදා කළමනාකරණ හා මානව හිමිකම් අමාත්‍යාංශය
6. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය
7. පොලිසිය සහ සංචාරක පොලිසිය
8. විශ්වවිද්‍යාල
9. වෛද්‍ය නිලධාරීන්
10. ප්‍රජා නායකයින්

**පෞද්ගලික අංශය**

11. සංචාරක ව්‍යාපාරයේ ශාස්ත්‍රීය විශේෂඥයින්
12. අධ්‍යාපන ආයතන
13. හෝටල් කළමනාකරුවන්
14. වෘත්තිකයන්
15. ව්‍යවසායකයින
16. අනෙකුත් අදාළ ආයතනවල නිලධාරීන් සහ කළමනාකරුවන්

*රූප සටහන 1.1. ඉලක්කගත ප්‍රේක්ෂකයින් වර්ගීකරණය*

ඊට අමතරව, සංචාරක කර්මාන්තයේ ප්‍රතිපත්ති සම්පාදකයින් සහ විවිධ ආශ්‍රිත ක්ෂේත්‍රවල වෘත්තිකයන් ලෙස, පහත සඳහන් ආයතන මෙම අත්පොතෙන් ප්‍රතිලාභ ලබනු ඇත.

1. සංචාරක අමාත්‍යාංශය
2. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය (SLTDA)
3. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
4. සංචාරක හා ආගන්තුක සත්කාර MSMEs
5. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී (MOH)
6. ග්‍රාම නිලධාරී
7. නාගරික සංවර්ධන අධිකාරිය (UDA)
8. ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන

තවද, ජාතික සංචාරක කර්මාන්ත සභාව සංචාරක ක්‍රියාකාරකම්වල යෙදී සිටින අතර සංචාරක කර්මාන්තය ආශ්‍රිත සිදුවීම් සහ සංසද කිහිපයක් සංවිධානය කර ඇති බැවින් ඔවුන්ටද ප්‍රතිලාභ ලැබෙනු ඇත. එම සභාව පහත පරිදි නිරූපණය කළ හැකිය.



ජාතික සංචාරක කර්මාන්ත සභාව

| | |
|---|---|
| THASL | ශ්‍රී ලංකා හෝටල් සංගමය (THASL) |
| SLAITO | ශ්‍රී ලංකා අභ්‍යන්තර සංචාරක ක්‍රියාකරුවන්ගේ සංගමය (SLAITO) |
| TAASL | ශ්‍රී ලංකා සංචාරක නියෝජිත සංගමය (TAASL) |
| ASMET | ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තයේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ සංගමය (ASMET) |
| NTGA | ජාතික සංචාරක මාර්ගෝපදේශක සංගමය (NTGA) |
| CTGLA | රියදුරු සංචාරක මාර්ගෝපදේශ කථිකාචාර්ය සංගමය (CTGLA) |
| CHSGA | ලංකා හෝටල් පාසල් උපාධිධාරී සංගමය (CHSGA) |
| SLAPCEO | ශ්‍රී ලංකා වෘත්තීය සම්මන්ත්‍රණ, ප්‍රදර්ශන සහ උත්සව සංවිධායකයින්ගේ සංගමය (SLAPCEO) |
| CCC | ලංකා වාණිජ මණ්ඩලය (CCC) |
| NCCSL | ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය (NCCSL) |
| ECCSL | ශ්‍රී ලංකා යුරෝපීය වාණිජ මණ්ඩලය (ECCSL) |
| AMCHAM | ශ්‍රී ලංකාවේ ඇමරිකානු වාණිජ මණ්ඩලය (AMCHAM) |



*රූප සටහන 1.2 ජාතික සංචාරක කර්මාන්ත සභාව වර්ගීකරණය*

## 1.2 ප්‍රත්‍යස්ථතාව පිළිබඳ සංකල්පමය අවබෝධය සහ ගමනාන්ත ඔරොත්තු දීමේ විශ්ලේෂණ මාර්ගෝපදේශය භාවිතය (පියවර 5)

මෙම ව්‍යාපෘතියේ යෝජිත ක්‍රමවේදය පියවර පහක් මත පදනම් වූ ගමනාන්ත ඔරොත්තු දීමේ විශ්ලේෂණ මාර්ගෝපදේශය (DRAG), සිද්ධාන්ත අධ්‍යයනය කිරීම, විශේෂ කණ්ඩායම් සම්මුඛ සාකච්ඡා, අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා සහ සංඛ්‍යාන සමීක්ෂණ ඇතුළු මිශ්‍ර ක්‍රම අනුගමනය කිරීමට මෙය සැලසුම් කර ඇත.

### 1.2.1 සංචාරක ගමනාන්තය නිර්වචනය කිරීම

පළමුව, පර්යේෂණ සහ ව්‍යාපෘති කණ්ඩායමේ අත්දැකීම් මත පදනම්ව සංචාරක ගමනාන්තය නිර්වචනය කර ඇත. මෙහිදී පර්යේෂණයට සමගාමීව, ගමනාන්තය පිළිබඳ ප්‍රායෝගික අවබෝධයක් ලබා ගැනීමට සහ පාර්ශවකරුවන්ගේ සිතියම්කරණය පිළිබඳ විභව පාර්ශවකරුවන් සමඟ අවිධිමත් සාකච්ඡා පැවැත්වීම, සංචාරක ගමනාන්තය සමන්විත විය හැකි ක්‍රියාකාරීන්, පාර්ශවකරුවන් සහ වත්කම් හඳුනා ගැනීම සඳහා අඩවි චාරිකා සිදු කර ඇත.

එකතු කරන ලද තොරතුරු මත පදනම්ව, SWOT විශ්ලේෂණය සහ SOAR විශ්ලේෂණය සිදු කර ඇත. SWOT විශ්ලේෂණය යටතේ, එය ගමනාන්තයක අභ්‍යන්තර ශක්තීන් සහ දුර්වලතා මෙන්ම බාහිර අවස්ථා සහ තර්ජන හඳු නාගෙන ඇත. SOAR විශ්ලේෂණය යටතේ, එය ශක්තීන්, අවස්ථා, අභිලාෂයන් සහ ප්‍රතිඵල කෙරෙහි අවධානය යොමු කර ඇති අතර අදාළ පාර්ශ්වකරුවන්ගේ අදහස් හරහා සමස්ත පද්ධතියම අවබෝධ කර ගැනීමට උත්සාහ කර ඇත.

### 1.2.2 සංචාරක ව්‍යාපාරයට ඇති උපද්‍රව, අවදානම් සහ බලපෑම් හඳුනා ගැනීම

සංචාරක ගමනාන්තයේ නිර්වචනයට යටත් වන උපද්‍රව, අවදානම් සහ සංචාරක ක්‍රියාකාරකම්වලට ඇති බලපෑම් හඳුනා ගැනීමට මෙහිදී සැලසුම් කර ඇත. විශේෂයෙන්ම, පළමු කණ්ඩායම සඳහා සාමාජිකයින් නව දෙනෙකු සහ දෙවන කණ්ඩායම සඳහා සාමාජිකයින් හතර දෙනෙකු ඇතුළත්ව කණ්ඩායම් සාකච්ඡා දෙකක් පවත්වා ඇත. විශේෂ කණ්ඩායම් සාකච්ඡාවල සොයාගැනීම් මත පදනම්ව, සංචාරක ගමනාන්තයට අදාළ අවදානම් සහ උපද්‍රව හඳුනාගැනීම සඳහා වාර්තාව සකස් කරන ලදී. ඉන් අනතුරුව, ගමනාන්තයේ ඇති අවදානම් සහ උපද්‍රව විස්තර කිරීමට සහ සංචාරක මෙහෙයුම් සහ පාර්ශවකරුවන්ට අදාළව ඒවා සිතියම්ගත කිරීමට මෙම අවදානම් අත්පොත සකස් කිරීමට සැලසුම් කර ඇත. එබැවින්, අත්පොත ප්‍රධාන අංශ හතරකින් සමන්විත වේ: දළ විශ්ලේෂණය, සංචාරක පද්ධතිය, අවදානම් පැතිකඩ (ස්වාභාවික සහ මානව ක්‍රියාකාරකම් නිසා සිදුවන), අවදානම් ලේඛනය, හඳුනාගත් අවදානම් වල බලපෑම් සහ නිගමනය.

### 1.2.3 ක්‍රියාවන් සඳහා අවදානම් සහ විකල්ප අවබෝධ කර ගැනීම

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය ඇතුළු දේශීය කර්මාන්ත ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් සහ පාර්ශ්වකරුවන්, අධ්‍යයන අංශයේ විෂය ප්‍රවීණයන්, විවිධ කර්මාන්තවල වෘත්තිකයන් සහ ඇල්ල පළාත් පාලන ආයතන, ඇල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ඇල්ල දුම්රිය ස්ථානය, මාර්ග ප්‍රවාහන අධිකාරිය ඌව පළාත, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය බදුල්ල, ශ්‍රී ලංකා විදුලි බල මණ්ඩලය, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලය ඇල්ල, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ඇල්ල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය, ඇල්ල පොලිස් ස්ථානය, මධ්‍යම පරිසර අධිකාරිය, ඌව පළාත් සංචාරක අමාත්‍යාංශය, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, ඇල්ල වෙළෙඳ සංගමය, ඇල්ල හෝටල් හිමියන්ගේ සංගමය, ඇල්ල සංචාරක මාර්ගෝපදේශකයන්ගේ සංගමය, ඇල්ල ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් සහ සංචාරක තොරතුරු මධ්‍යස්ථානය ඇතුළු අනෙකුත් පාර්ශ්වකරුවන්ගේ අවධානයෙන් පළමු වැඩමුළුව සංවිධානය කරන ලදී.

වැඩමුළුවේදී, හඳුනාගත් එක් එක් අවදානම විවිධ පාර්ශවකරුවන්ට සම්බන්ධ කරන්නේ කෙසේද සහ එම අවදානම්වල බලපෑම පිළිබඳව අවධානය යොමු කරන ලදී. ඒ මත පදනම්ව, අවදානම් බලපෑම් දාමය සංවර්ධනය කිරීමට සැලසුම් කරන ලදී. දෙවනුව, ක්‍රමානුකූල එකඟතා ප්‍රවේශය මත පදනම්ව ඉහළ බලපෑම් අවදානම් සිට අඩු බලපෑම් අවදානම් දක්වා

අවදානම් ශ්‍රේණිගත කිරීම සඳහා අවදානම් ප්‍රමුඛතා විශ්ලේෂණයක් සිදු කරන ලදී. අවදානම් ප්‍රමුඛතා විශ්ලේෂණයේ ප්‍රතිඵල මත පදනම්ව, ප්‍රමුඛතා අවදානම් සඳහා වඩාත් සුදුසු විසඳුම් හඳුනා ගැනීම සඳහා අවදානම් අවම කිරීමේ සැලැස්මක් සකස් කරන ලදී.

### 1.2.4 ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීම සඳහා හිතකර සාධක සහ බාධක විශ්ලේෂණය කිරීම

සිව්වන අදියර යටතේ, ක්‍රම දෙකක් මත පදනම්ව තිරසාර සංවර්ධනය සඳහා අවදානම් තක්සේරු රාමුවක් සංවර්ධනය කිරීමට සැලසුම් කරයි:

Likert පරිමාණ සංඛ්‍යාන ක්‍රමය - ආර්ථික, පාරිසරික, සමාජ-සංස්කෘතික සහ කළමනාකරණ අංශ

අවස්ථා (හිතකර සාධක), අභියෝග (බාධක) සහ ක්‍රියාවන් සඳහා විභව විකල්ප හඳුනා ගැනීම සඳහා අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා

විශ්ලේෂණය අවසානයේ, මෙම අවස්ථා, අභියෝග සහ ක්‍රියාව සඳහා විකල්ප විෂය විශේෂඥයින්ගේ සහභාගීත්වයෙන් ක්‍රමානුකූල එකඟතා ප්‍රවේශයක් මගින් වලංගුතාවය සොයා බලනු ලැබේ.

### 1.2.5 ක්‍රියාවන් සඳහා විකල්ප සාකච්ඡා කිරීම සහ ඔරොත්තු දීමේ මූලධර්ම පිළිබිඹු කිරීම

දෙවන වැඩමුළුව පස්වන අදියර යටතේ සංවිධානය කරන ලද අතර, එය හෝටල් හිමියන්, හෝම්ස්ටේ (Homestay) නවාතැන් හිමියන්, ආපනශාලා හිමියන්, සංචාරක මාර්ගෝපදේශකයින්, කුඩා ව්‍යාපාර හිමිකරුවන්, ගොවීන් යනාදී සංචාරක ක්‍රියාකරුවන්ගෙන් සමන්විත විය. පක්ෂග්‍රාහීත්වය අඩු කිරීම සඳහා එක් එක් කාණ්ඩය නියෝජනය කරමින් අවම වශයෙන් සාමාජිකයින් තිදෙනෙකු සිටිය යුතු විය. ව්‍යාපෘතිය පිළිබඳ මූලික අවබෝධයක් ලබා දීම සඳහා පෙර පියවරවල සොයාගැනීම් (තත්ත්ව වාර්තාව, අවදානම් ලේඛනය, අවදානම් බලපෑම් දාමය සහ අවදානම් අවම කිරීමේ සැලැස්ම) දෙවන වැඩමුළුවේදී, වැඩමුළුවට සහභාගිවන්නන් ඉදිරියේ ඉදිරිපත් කිරීමට සැලසුම් කර ඇත.

### 1.2.6 පුහුණු වැඩසටහන පැවැත්වීම

දෙවන වැඩමුළුව හරහා පුහුණු අවශ්‍යතා සහ හිඩැස් හඳුනා ගැනීමෙන් පසු දෙවන වැඩමුළුවේදී හඳුනාගත් එම අංශ නියෝජනය කරන සාමාජිකයින්ගේ සහභාගීත්වයෙන් නිශ්චිත පුහුණුවක් පැවැත්වීමට සැලසුම් කර ඇත. ඒ සඳහා ප්‍රවීණයන්ගේ දායකත්වයෙන් පුහුණු අත්පොතක් සකස් කරන ලදී.

පුහුණු වැඩසටහන දින දෙකක නේවාසික පුහුණුවක් ලෙස සංවිධානය කරන ලදීත

පළමු දිනය
රාත්‍රී ආහාරය සමඟ හෝටලයේ පැවති වැඩමුළුව

දෙවන දිනය - උදෑසන
ක්ෂේත්‍ර පුහුණුව සහ ස්ථානීය ක්‍රියාකාරකම්

දෙවන දිනය - සවස
සහතික පිරිනැමීම, සමාලෝචනය සහ පසුවිපරම

### 1.2.7 ගමනාන්ත මට්ටමින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කොටසක් ලෙස ගමනාන්ත මට්ටමින් අවදානම් අවම කිරීම සඳහා දායක වීමට සැලසුම් කරයි. අවදානම් ලේඛනයට අනුව ගමනාන්තය තුළ ප්‍රමුඛතා අවදානම් තෝරා ගන්නා ලද අතර එය ප්‍රායෝගික ආකාරයෙන් අවදානම් අවම කිරීමට දායක වේ. එපමනක් නොව, එකතු කරන ලද තොරතුරු බෙදා හැරීම සඳහා ජංගම යෙදුමක් හෝ වෙබ් අඩවියක් සංවර්ධනය කිරීමටත්, ප්‍රජාව සහ අනෙකුත් අදාළ පාර්ශවකරුවන් සමඟ සන්නිවේදන නාලිකාවක් ලෙස අවදානම් යාවත්කාලීන කිරීම් ප්‍රකාශයට පත් කිරීමටත් සැලසුම් කරන ලදී.



සුදුසු සංචාරක ගමනාන්තයක් හඳුනා ගැනීම
කොටස්කරුවන් සිතියම්ගත කිරීම
ගමනාන්තයන්හි අදාළ වත්කම්, සංචාරක නිෂ්පාදන සහ සේවාවන්හි හඳුනා ගැනීම
SWOT විශ්ලේෂණය සහ SOAR විශ්ලේෂණයේ ප්‍රතිපල

**ගමනාන්තය නිර්වචනය කිරීම**

පර්යේෂණ
පුළුල් සාහිත්‍ය විචාරය
ක්ෂේත්‍ර චාරිකාව
කොටස්කරුවන්
සිතියම්ගත කිරීම
SWOT සහ SOAR
විශ්ලේෂණය

**සංචාරක ව්‍යාපාරයට ඇති උවදුරු, අවදානම් සහ බලපෑම් හඳුනා ගැනීම**

විශේෂ කණ්ඩායම් සාකච්ඡාව
පළමු කණ්ඩායම
දෙවන කණ්ඩායම

තත්ත්ව වාර්තාව
අවදානම් අත් පොත සකස් කිරීම
අවදානම් පැතිකඩ
අවදානම් ලේඛනය සහ අවදානම් වල බලපෑම

ප්‍රතිපලය

අවදානම් බලපෑම් දාමය
අවදානම් ශ්‍රේණිගත කිරීම
අවදානම් අවම කිරීමේ සැලැස්ම

ප්‍රතිපලය

**ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීම සඳහා හිතකර සාධක සහ බාධක විශ්ලේෂණය කිරීම**

තිරසාර සංවර්ධනය සඳහා අවදානම් තක්සේරු රාමුවක් සකස් කිරීම
සංඛ්‍යානමය ක්‍රමය
අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා

**ක්‍රියාවන් සඳහා අවදානම් සහ විකල්ප අවබෝධ කර ගැනීම**

දේශීය කර්මාන්ත විශේෂඥයින් සහ පාර්ශවකරුවන් සමඟ පළමු වැඩමුළුව
අවදානම් විශ්ලේෂණය
අවදානම් ප්‍රමුඛතා විශ්ලේෂණය

අවස්ථාවන් (හිතකර සාධක)
අභියෝග (බාධක)
ක්‍රියාවන් සඳහා විභව විකල්ප

ප්‍රතිපලය

විශේෂඥ මණ්ඩලයක සහය ඇතිව බුද්ධි කලම්බනය
ක්‍රීඩා සහ ක්‍රියාකාරකම් පදනම් කරගත් වැඩමුළුව හරහා සහභාගි වන්නන්ගෙන් පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම

ප්‍රතිපලය

**ක්‍රියාවන් සඳහා විකල්ප සාකච්ඡා කිරීම සහ ඔරොත්තු දීමේ මූලධර්ම ඉදිරිපත් කිරීම**

විවිධ වර්ගයේ සංචාරක ක්‍රියාකරුවන් නියෝජනය කරමින් සාමාජිකයින් 30 - 35 දෙනෙකුගේ සහභාගීත්වයෙන් දෙවන වැඩමුළුවදවැර්එදරි

**පුහුණු වැඩසටහන පැවැත්වීම**

දින දෙකක නේවාසික පුහුණුව

පළමු වන දිනය - රාත්‍රී ආහාරය සමඟ හෝටලයේ වැඩමුළුව
දෙවන දිනය - උදෑසන - ක්ෂේත්‍ර පුහුණුව සහ ස්ථානීය ක්‍රියාකාරකම්
දෙවන දිනය - සවස - සහතිකය පිරිනැමීම, සමාලෝචනය සහ පසුවිපරම

පස්වන පියවරේදී හඳුනාගත් පුහුණු අවශ්‍යතා සපුරාලීම

**ගමනාන්ත මට්ටමකින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**
**හඳුනාගත් ප්‍රමුඛ අවදානම් අවම කිරීම සඳහා දායක වීම**

ගමනාන්තයේ අවදානම අවම කිරීම සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
එකතු කරන ලද තොරතුරු බෙදා හැරීමට සහ අවදානම් යාවත්කාලීන ප්‍රකාශයට පත් කිරීමට ජංගම යෙදුමක් හෝ වෙබ් අඩවියක් සංවර්ධනය කිරීම

ප්‍රතිපලය

*රූප සටහන 1.3 යෝජිත ක්‍රමවේදයේ සාරාංශ රූප සටහන*



# 1.3 භාවිතා කරන ක්‍රම

ව්‍යාපෘතිය සඳහා අදාළ දත්ත එක්රැස් කිරීම සඳහා අදාළ සාහිත්‍ය පිළිබඳ පුළුල් සමාලෝචනයන්, ක්ෂේත්‍ර චාරිකාවන් සහ නිරීක්ෂණ, පර්යේෂණ, කණ්ඩායම් සාකච්ඡා සහ විශේෂඥ අදහස් රැස් කිරීම ඇතුළුව පුළුල් ක්‍රමවේදයන් මෙහිදී යොදා ගෙන ඇත.

## 1.3.1 අතීත සාහිත්‍යය

මෙහිදී , ව්‍යාපෘති කණ්ඩායම පූර්ව පර්යේෂණ පත්‍රිකා වෙත අවධානය යොමු කිරීමෙන් තොරතුරු රැස් කිරීම ආරම්භ කරන ලදි. එබැවින්, මූලික වශයෙන්, ව්‍යාපෘති කණ්ඩායම ශ්‍රී ලාංකේය සන්දර්භය තුළ පවතින සහ සංචාරක ගමනාන්තවල දිගුකාලීන පැවැත්ම සඳහා වැඩි බලපෑමක් ඇති කරන අවදානම් සම්බන්ධ පූර්ව පර්යේෂණ පත්‍රිකා පරිශීලනය කළේය. ඉන්පසුව, කණ්ඩායම එය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට තෝරාගත් ගමනාන්තය වන ඇල්ල දක්වා පටු කළ අතර, එහිදී ඇල්ල පසුගිය වසරවල සිට සැලකිය යුතු අවදානම් කිහිපයක් යටතේ පවතින බවත් හඳුනා ගැනීමට හැකි විය.



## 1.3.2 ක්ෂේත්‍ර චාරිකාව සහ පර්යේෂණය

ඉන්පසුව, එකතු කරන ලද පසුගිය පර්යේෂණ වාර්තා සමඟ, ගමනාන්තය තුළ පවතින අවදානම් නිරීක්ෂණය කිරීම සඳහා ව්‍යාපෘති කණ්ඩායම ඇල්ල ප්‍රදේශයේ ක්ෂේත්‍ර චාරිකාවට සහභාගී විය. එයින්, ගමනාන්තයේ දැනට පවතින සහ එහි අනාගත පැවැත්මට බලපෑම් කිරීමට හැකියාවක් ඇති අවදානම් කිහිපයක් හඳුනා ගැනීමට ව්‍යාපෘති කණ්ඩායමට හැකි විය. ක්ෂේත්‍ර චාරිකාවට පසුව, නිරීක්ෂිත ප්‍රතිපල අනුව අවදානම් වර්ගීකරණය කිරීම සඳහා පර්යේෂණය සිදු කරන ලදී. එම පර්යේෂණ ව්‍යුහයේ පරිච්ඡේද 5ක් ඇතුළත් විය.

## 1.3.3 කණ්ඩායම් සාකච්ඡා

ක්ෂේත්‍ර චාරිකාව සහ පර්යේෂණය මගින් එක්රැස් කරගත් පසුබිම් දැනුම සමඟ, සංචාරක කර්මාන්තය හා ඒ ආශ්‍රිත කර්මාන්තවල ප්‍රවීණයන්ගෙන් ප්‍රායෝගික දත්ත කිහිපයක් එක්රැස් කිරීම සඳහා කණ්ඩායම් සාකච්ඡා දෙකක් පවත්වන ලදී. පළමු දිනයේ කණ්ඩායම් සාකච්ඡාව ඇල්ල ප්‍රාදේශීය සභා පරිශ්‍රයේදී පැවැත්වුණු අතර දෙවන දින සාකච්ඡාව



ක්ෂේත්‍ර චාරිකාව - ඇල්ල

කිතල් ඇල්ල විහාරස්ථානයේදී පැවැත්විණි. මෙම සාකච්ඡා දෙක සඳහා සංචාරක කර්මාන්තයේ විවිධ අංශවලින් පාර්ශ්ව ගණනාවක් සම්බන්ධ වූ අතර ඔවුන් පිළිවෙළින් රාජ්‍ය සහ පෞද්ගලික ආයතන නියෝජනය කළහ. එබැවින් මෙම සාකච්ඡා දෙක සඳහා සම්බන්ධ වූ පුද්ගලයින්ගේ නියැදිය පහත පරිදි දැක්විය හැකිය.

## පළමුවන කණ්ඩායම

2022 අප්‍රේල් 04 - 10.00 පෙ.ව - 1.30 ප.ව
ඇල්ල ප්‍රාදේශීය සභා පරිශ්‍රය

වැඩසටහන මෙහෙයවීම
මහාචාර්ය රුවන් රණසිංහ
ප්‍රධානී, සංචාරක අධ්‍යයන අංශය,
ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය

මහාචාර්ය එදිරිසූරිය - භූගෝල විද්‍යාව හා පරිසර කළමනාකරණ දෙපාර්තමේන්තුව, සබරගමුව විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාව

එන්.පී.පී. ලියනගේ - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,
ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය

විදුහල්පති - ඇල්ල මහා විද්‍යාලය
සභාපති - ඇල්ල ප්‍රාදේශීය සභාව
නියෝජිත, ඇල්ල පොලිස් ස්ථානය
නියෝජිත, ඌව සංචාරක අමාත්‍යාංශය
නියෝජිත, සංචාරක තොරතුරු මධ්‍යස්ථානය
ඇල්ල මහජන සෞඛ්‍ය පරීක්ෂක
ආයුර්වේද වෛද්‍ය (දේශීය වෛද්‍ය)







කණ්ඩායම් සාකච්ඡා 01



## දෙවැනි කණ්ඩායම

2022 අප්‍රේල් 05 - 9.00 පෙ.ව - 12.00 ප.ව
කිතල් ඇල්ල විහාරස්ථානය

වැඩසටහන මෙහෙයවීම
මහාචාර්ය රංගන ශාලික
හිටපු ප්‍රධානි/ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සංචාරක කළමනාකරණ දෙපාර්තමේන්තුව,සබරගමුව විශ්වවිද්‍යාලය

ඇල්ල දුම්රිය ස්ථානයේ ස්ථානාධිපති

හෝම්ස්ටේ (Homestay) හිමිකරු

හෝටල් හිමියන්ගේ සංගමයේ සභාපති - ඇල්ල

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ
අධ්‍යක්ෂ - බදුල්ල





කණ්ඩායම් සාකච්ඡා 02

ඔවුන් සෑම අයෙක්ම අපගේ අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීම සඳහා සාකච්ඡා සැසි පුරාම සැලකිය යුතු දායකත්වයක් ලබා දුන්හ. එම අදහස් මගින් ඇල්ල ප්‍රදේශයේ පවතින අවදානම් පිළිබඳව පුළුල් දැනුමක් සහ තොරතුරු ලබා ගැනීමට ව්‍යාපෘති කණ්ඩායමට හැකි වූ අතර අවදානම් තත්ත්වය පාලනය කිරීම සඳහා පිළිපැදිය හැකි යෝජනා ඔවුන්ගේ අන්තයේ සිට ගවේෂණය කරන ලදී.

2 පරිච්ඡේදය

# සංචාරක පද්ධතිය



## 2.1 සන්දර්භය

ශ්‍රී ලංකාව සංචාරකයින්ට විචිත්‍ර දර්ශනයන් සහ නැවුම් අත්දැකීම් ලබා දෙන සංචාරක ගමනාන්තයක් ලෙස ලොවපුරා ප්‍රචලිතය. ශ්‍රී ලංකාවේ විවිධ සංචාරක ගමනාන්ත අතරින් ඇල්ල, සංචාරකයින්ට සුවිශේෂී අත්දැකීමක් ලබා දෙන වඩාත් ආකර්ෂණීය සංචාරක ගමනාන්තයක් ලෙස සැලකේ. ඇල්ල යනු ශ්‍රී ලංකාවේ ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ පිහිටි කුඩා නගරයකි. එය ආසන්න වශයෙන් කොළඹ සිට කිලෝමීටර් 200 ක් දුරින් පිහිටා ඇති අතර මධ්‍ය මුහුදු මට්ටමේ සිට මීටර් 1,041 ක උන්නතාංශයක සහ දශම අංශක 6.867 ක අක්ෂාංශ සහ දේශාංශ 81.050 ක උසකින් පිහිටා ඇත. ඇල්ල, පොහොසත් ජෛව විවිධත්වයකින් යුක්ත වන අතර, විවිධ ශාක හා සත්ත්ව විශේෂ වලින් ඝන වූ අතර වලාකුළු වනාන්තර සහ තේ වතු වලින් වැසී ඇති කඳු වලින් වටවී ඇත (Life of Brit, 2021). නගරය තුළ, එහි උන්නතාංශය නිසා අවට පහත් බිම්වලට වඩා සිසිල් දේශගුණයක් ඇත. එය බදුල්ල දිස්ත්‍රික්කයේ එතරම් ක්‍රියාකාරී නොවූ ගම්මානයක් විය. එමෙන්ම, එය කතරගම දෙසට ගමන් කරන මගීන්ට පහසු නැවතුම්පොළක් ලෙස ප්‍රසිද්ධය. නමුත් වසර 14 කට ආසන්න කාලයකට පසු, එය කාර්යබහුල සංචාරක නගරයක් බවට පරිවර්තනය වී ඇත. එබැවින් ප්‍රාදේශීය ව්‍යාපාරික ප්‍රජාව මෙන්ම පිටතින් පැමිණි ඇතැමුන් ඇල්ල ප්‍රදේශයේ ආපනශාලා, සංචාරක බංගලාවන්, සම්බාහන මධ්‍යස්ථාන සහ වෙනත් සංචාරක ව්‍යාපාරවල ආයෝජනය කර ඇත (The Sunday Times, 2010).

සංචාරක නිකේතන නගරයක් ලෙස ක්‍රමයෙන් වර්ධනය වන ඇල්ල නගරය, එය පිහිටි ඇල්ල ග්‍රාම නිලධාරී වසමේ මායිම් සහ මායිම් නිර්වචනය කරමින් නාගරික සංවර්ධන අධිකාරී පනතේ 3 වැනි වගන්තිය යටතේ රජයේ ගැසට් නිවේදනය අංක 1558/5 යටතේ 2018 ජූලි 08 දින ප්‍රකාශයට පත් කරන ලදී. තවද, 2021 - 2030 කාලසීමාව තුළ ක්‍රමයෙන් වර්ධනය වන

සංචාරක ක්‍රියාකාරකම් සඳහා මගපෙන්වීම සඳහා නීතයානුකූල අවශ්‍යතා සහ නැගී එන අවශ්‍යතා සපුරාලීම සඳහා ඇල්ල නගරය සඳහා සංවර්ධන සැලැස්මක් නාගරික සංවර්ධන අධිකාරිය (UDA) විසින් සකස් කරන ලද අතර 2021 අප්‍රේල් 15 දින ගැසට් පත්‍රය නිකුත් කරන ලදී. (ඇල්ල සංවර්ධන සැලැස්ම, 2021).

එහෙයින්, ඇල්ල ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයින්ගේ ප්‍රමුඛතම ස්ථානයක් බවට පත්ව ඇත. පහතරට වැසි වනාන්තර සහ උස්බිම්, තේ වතු අතර කදිම ස්ථානයක ස්ථානගතව ඇති නගරය, නරඹන්නන්ට සුපිරි අත්දැකීම් ලබා දෙන පරිපූර්ණ ගමනාන්තයක් බවට පත්ව හමාරය. ඇල්ලේ මෙම පරිපූර්ණ භූගෝලීය පිහිටීම ශ්‍රී ලංකාවේ අනෙකුත් සංචාරක ගමනාන්තවලට වඩා මෙම කුඩා පාරාදීසයට විශාල වාසියක් එක් කරන ප්‍රධාන හේතුවක් වී ඇත.

එපමණක් නොව, ඇල්ල ජාත්‍යන්තර සංචාරකයින් අතර ජනප්‍රිය වීමට හේතු කිහිපයක් තිබේ. ඒ අතර ඇල්ලේ පිරිසිදු වාතය ජීවිතය පහසු කරවීමට උපකාරී වන අතර එමඟින් සංචාරකයින්ට පරිපූර්ණ තේ කෝප්පයක් සමඟ සිසිල් සහ විවේකී සන්ධ්‍යාවක් භුක්ති විඳීමට ඉඩ සලසයි. එපමණක් නොව,එය උඩරට දුම්රිය ගමනේ සිට ත්‍රාසජනක ඇල්ල රොක් කඳු නැගීම දක්වා විවිධාකාර අත්දැකීම් ලබා ගැනීමට ඉඩ සලසන බැවිනි. කඳුකරයේ දුම්රිය ධාවනය, දුම්රිය ගමන් සඳහා මහත් වූ ඇල්මක් ඇති පාර්ශවයන් (Locomotive Lovers) මවිත කරන අත්දැකීමක් වන අතර එමඟින් කඳුකරයේ තේ වතුවල සහ මිනිස් පහස නොලද කඳුකර වනාන්තරවල සුන්දරත්වය අත්විඳිය හැකිය. වැදගත්ම දෙය නම්, ඇල්ල විවිධ වර්ගයේ සංචාරකයින් සඳහා පරිපූර්ණ ගමනාන්තයක් ලෙස සැලකිය හැකි වීමයි.

තවද, ඇල්ල යනු බැක්පැකර් (Backpackers) සහ සුඛෝපභෝගී සංචාරකයින් සඳහා අපූරු ගමනාන්තයකි. ඇල්ල පිළිබඳ තවත් ආකර්ශනීය අංගයක් වන්නේ කඳු නැගීමේ අද්විතීය හා ආකර්ෂණීය අත්දැකීමයි. පුංචි ශ්‍රී පාදය (Little Adam's Peak) සහ  ඇල්ල රොක් (Ella Rock) යනු ප්‍රදේශයේ සුප්‍රසිද්ධ විනෝද චාරිකා දෙකකි. ඇල්ල යනු සොබාදහමේ සුන්දරත්වය ගවේෂණය කිරීමට උනන්දුවක් දක්වන එක රැ යකින් කඳු නගින්නන් සහ කඳවුරු කරුවන් සඳහා අපූරු ආරම්භක ස්ථානයකි. තවද, ඇල්ල ගැප් (Ella Gap) යනු පහතරට කැලෑ සහ වැසි වනාන්තරවල දසුන් සමඟ අවට කඳුකරයේ විශ්මයජනක දසුනක් සංචාරකයින්ට අත්විඳීමට ඉඩ සලසන අපූරු ප්‍රදේශයකි.




*රූප සටහන 2.1 ගමනාන්ත සිතියම - ඇල්ල* *මූලාශ්‍රයː Google Earth, 2022*

එමෙන්ම, ඇල්ල වඩාත් කැපී පෙනෙන සංචාරක ගමනාන්තයක් බවට පත් කරන තවත් කරුණක් නම්, අද්විතීය හෝම් ස්ටේ (Homestay) අත්දැකීම ඇතුළත් විවිධ නවාතැන්ය. මෙම අද්විතීය හෝම් ස්ටේ අත්දැකීම සංචාරකයින් ශ්‍රී ලාංකේය සාම්ප්‍රදායික දේශීය ආහාර සංස්කෘතිකයට ඇල්මක් දක්වන පිරිසක් බවට අවසන පත්කරනු ඇත.

ඇල්ලේ ඇති පහසුකම් හැරුණු විට, ඇල්ලේ සිටින සොඳුරු මිනිසුන් ජාත්‍යන්තර සංචාරකයින්ට අමතක නොවන සංචාරක අත්දැකීමක් ලබා දෙනු ලබයි. එමඟින් සංචාරකයින්ට ලෝකයේ වඩාත්ම ප්‍රසිද්ධ ආගන්තුක සත්කාරයට ලැදි රටකින් උණුසුම් පිළිගැනීමක් අත්විඳිය හැකිය. එපමනක් නොව, ඇල්ල සංචාරක කර්මාන්තයේ අන්තර්ගත වර්ධනය සඳහා කදිම ආදර්ශයක් බවට පත්ව ඇත. පසුගිය වසර කිහිපය පුරාවටම ඇල්ල සංචාරක ව්‍යාපාරයේ වර්ධනය සඳහා වැඩි අවස්ථා උත්පාදනය කරමින් ආර්ථික හා සමාජීය අංශවල ශීඝ්‍ර වර්ධනයක් පෙන්නුම් කර ඇත. එහෙයින්, ඇල්ල ප්‍රදේශයේ ප්‍රජාවට වැඩි ආදායමක් උපයා ගැනීමට ඉඩ සලසන වැඩි ව්‍යාපාරික අවස්ථා ප්‍රයෝජනයට ගැනීමට හැකි වී තිබේ.

තවද, ඇල්ලට වැඩි සංචාරකයින් ආකර්ෂණය කර ගන්නා පිළිගත් හෝටල් සන්නාමයන් වැඩි රැකියා අවස්ථා උත්පාදනය කරන වටිනා මාර්ගයක් බවට පත්ව ඇත. ඇල්ලේ මෙම ශීඝ්‍ර වර්ධනයේ ප්‍රතිඵලයක් ලෙස සංචාරක ව්‍යාපාරයේ බලපෑම නිසාවෙන් මිනිසුන්ගේ ජීවන රටාව සහ අනෙකුත් සමාජීය අංශයන් සැලකිය යුතු ලෙස වෙනස් වී ඇත. මේ අනුව, ජනප්‍රිය සංචාරක ගමනාන්තයක් වන ඇල්ල, ප්‍රාදේශීය ප්‍රජාවට සහ අනෙකුත් පාර්ශවකරුවන්ට ඇල්ලේ ඇතුළත් සංචාරක වර්ධනයේ කොටස්කරුවෙකු වීමට වැඩි ඉඩක් නිර්මාණය කිරීමට වැඩි වැඩියෙන් අවස්ථා නිර්මාණය කිරීමට සමත් වී ඇත.

### 2.1.1. ප්‍රධාන සංචාරක ආකර්ෂණ ස්ථාන - ඇල්ල -

ඇල්ල රොක්



පුංචි ශ්‍රී පාදය



## ඇල්ල නගරය



## ආරුක්කු නවය පාලම



## රාවණා ගුහාව



## නිල් දිය පොකුණ



රාවණා ඇල්ල



දෙමෝදර දුම්රිය ගැටය



## 2.2 සංචාරක ක්‍රියාකාරීන්

මෙම කර්මාන්තයේ ගතික ස්වභාවය සහ සංකීර්ණත්වය නිසා, සංචාරක කර්මාන්තය තුළ දිගු කාලීන සාර්ථක සංචාරක ගමනාන්තයක් පවත්වා ගැනීම දුෂ්කර ය. එබැවින්, හොඳින් ස්ථාපිත පළාත් පාලන ආයතන, සහාය දක්වන සංචාරක සංවිධාන, රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ සංවිධාන, ප්‍රාදේශීය ප්‍රජා නායකයින් සහ තිරසාර පොදු දැක්මක් සහ නවෝත්පාදන උපාය මාර්ග සාර්ථක සංචාරක ගමනාන්තයක් සඳහා එකට සම්බන්ධ වේ. ඒ අනුව, ලොව ප්‍රකට සංචාරක ගමනාන්තයක් ලෙස, දිවයිනේ විවිධ අංශ නියෝජනය කරන පාර්ශවකරුවන් සංඛ්‍යාවකින් ඇල්ල පොහොසත් වේ.

සංචාරක කර්මාන්තයේ ප්‍රතිපත්ති, නීති සහ රෙගුලාසි සකස් කිරීම සඳහා රාජ්‍ය අංශය නියෝජනය කරමින්, සංචාරක අමාත්‍යාංශය - ඌව පළාත, සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය - ඌව පළාත, සංචාරක තොරතුරු මධ්‍යස්ථානය, සංචාරක පොලිසිය, ඇල්ල ප්‍රාදේශීය සභාව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, රජයේ විශ්වවිද්‍යාල, රාජ්‍ය බැංකු සහ වෙනත් අදාළ රාජ්‍ය ආයතන ඇතුළු විවිධ සංවිධාන ඇත. වෘත්තිකයන් සහ සංචාරක සේවා සපයන්නන් ලෙස; හෝටල් හිමියන්, සංචාරක නියෝජිතායතන, සංචාරක ක්‍රියාකරුවන්, සංචාරක මාර්ගෝපදේශකයන්, කුලී රථ රියදුරන්, සාප්පු හිමියන්, ආපනශාලා, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්, හෝම්ස්ටේ හිමිකරුවන් සහ විනෝදාස්වාද ක්‍රීඩා සහ ක්‍රියාකාරකම් සපයන්නන් ඇල්ලට පැමිණෙන සංචාරකයින්ගේ විනෝදාස්වාද අවශ්‍යතා සහ මූලික අවශ්‍යතා සපුරාලීම සඳහා එකට සම්බන්ධ වී සිටිති. ඊට අමතරව සංචාරක මගපෙන්වන්නන්ගේ සංගමය, ඇල්ල වෙළෙඳ සංගමය, ඇල්ල හෝටල් හිමියන්ගේ සංගමය වැනි විවිධ සංගම් එකතු වී ඇල්ලේ සංචාරක කටයුතු නගා සිටුවීමට කටයුතු කරයි. තවද, ඇල්ල දුම්රිය ස්ථානය, ඌව පළාත් මාර්ග ප්‍රවාහන අධිකාරිය, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, බදුල්ල, ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, ඇල්ල ප්‍රාදේශීය අධ්‍යාපන කාර්යාලය, ඇල්ල වාරිමාර්ග දෙපාර්තමේන්තුව, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය, ආදිය ප්‍රවාහනය, යටිතල පහසුකම් සහ අනෙකුත් මූලික පහසුකම් වැනි ආධාරක පහසුකම් සපයයි. මෙම සියලු පාර්ශ්වකරුවන් සමඟින්, ප්‍රාදේශීය ප්‍රජාව ඔවුන්ගේ විශිෂ්ට ආගන්තුක සත්කාර, සහයෝගය සහ ආගන්තුක සංස්කෘතීන්ට ගරු කරමින් ප්‍රමුඛ සංචාරක ගමනාන්තයක් ලෙස ඇල්ල සඳහා හිතකර ප්‍රතිරූපයක් නිර්මාණය කරමින් ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරනු ලබයි. එබැවින් ගමනාන්තයේ සාර්ථකත්වය සඳහා සියලුම සංචාරක ප්‍රජාවන්ගේ සහයෝගිතාවය අතිශයින්ම අවැසිය. සංචාරක ගමනාන්තයක් ලෙස ඇල්ල ප්‍රදේශයේ සංචාරක ක්‍රියාකාරකම්වල සෘජුව සහ වක්‍රව සම්බන්ධ වන ප්‍රාථමික සහ ද්විතීයික ක්‍රියාකාරීන් වර්ගීකරණය රූප සටහන 2.2 මගින් නිරූපණය කෙරේ.




*රූප සටහන 2.2 සංචාරක ක්‍රියාකාරීන් වර්ගීකරණය*
*මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යන සහ කණ්ඩායම් සාකච්ඡාව (2022)*



## 2.3 අදාළ මූලාශ්‍ර වෙළෙඳපොළ සහ සංචාරකයින්ගේ පැතිකඩ

ස්වාභාවික සම්පත් රැසකින් පොහොසත් ඌව පළාතේ පිහිටි ඇල්ල නගරය ක්‍රමක්‍රමයෙන් සංචාරක නිකේතන කලාපයක් බවට පත්වෙමින් විවිධ සංචාරක පැතිකඩ සඳහා සුවිශේෂී ගමනාන්තයක් අත්විඳීමට ඉඩ සලසයි. කෙසේ වෙතත්, ඇල්ල ප්‍රදේශයට පැමිණෙන සංචාරකයින්ගේ පැතිකඩ පිළිබඳ නිවැරදි සංඛ්‍යාලේඛන උපුටා ගැනීම සඳහා නිශ්චිත දත්ත සමුදායක් දැනට භාවිතයේ නොමැත. ප්‍රදේශයට පැමිණෙන අමුත්තන්ගේ පැතිකඩ, සම්පත් සහ පහසුකම් ලබා ගැනීම සඳහා ප්‍රදේශයේ පවතින සංචාරක නිෂ්පාදන සහ සේවා සඳහා ඇති ඉල්ලුම සහ රට තුළ අභ්‍යන්තර සහ දේශීය සංචාරකයින්ගේ පැතිකඩ බැලීමෙන් ගොඩනැගිය හැකිය.

ශ්‍රී ලංකාවේ අඩුම වර්ගීකරණය කරන ලද හෝටල් සංඛ්‍යාව ඌව පළාතෙන් වාර්තා වී ඇති අතර එය එක් තරු හතරේ හෝටලයක් සහ එක් තනි තරුවේ හෝටලයක් ලෙස වාර්තා වී තිබීම කැපී පෙනේ (ශ්‍රී ලංකා සංචාරක සංවර්ධනය අධිකාරිය, 2020). එමෙන්ම, මෙම ප්‍රදේශය ඉහළ මට්ටමේ වියදම් කිරීමෙ හැකියාවක් සහිත සංචාරකයින්ගේ ආකර්ෂණය අඩු බව පෙනී යයි. බොහෝ නවාතැන් ස්ථාන අතිරේක හෝ වර්ගීකරණය නොකළ ඒවා වේ; බහුතරයක් හෝම්ස්ටේ  නවාතැන්, ආගන්තුක නිවාස සහ රාත්‍රී නවාතැන් පහසුකම් සහ උදෑසන ආහරය පමණක් සපයන ආයතන (B & B) වන අතර ඒවා බැක්පැකර් සහ අඩු වියදම් සංචාරකයින්ගේ අවධානය යොමු කරයි.

ශ්‍රී ලංකාවට පැමිණෙන සමස්ත අභ්‍යන්තර සංචාරකයින්ගෙන් 6% ක් වාර්ෂිකව ඇල්ලට පැමිණෙන බවත්, ඇල්ල සංචාරක කලාපය සහ ඒ අවට යෝජිත සංවර්ධන ව්‍යාපෘති සමඟින් මෙය වාර්ෂිකව ඉහළ යා හැකි බවත් වාර්තා වේ (නාගරික සංවර්ධන අධිකාරිය, 2021). යෝජිත සැලැස්ම සමඟ 2030 වසර වන විට දළ වශයෙන් ඇල්ලට සංචාරකයින් 2,000,000 පැමිණෙනු ඇති බව, 2021 දී ප්‍රකාශයට පත් කරන ලද ඇල්ල සංවර්ධන සැලැස්ම පිළිබඳ නාගරික සංවර්ධන අධිකාරියෙහි වාර්තාව මගින් එය තවදුරටත් යෝජනා කර ඇත.



ඇල්ලට පැමිණෙන සංචාරකයින්ගෙන් බහුතරයක් (65%ක් පමණ) සාමාන්‍ය ගෘහ ආදායමෙන් අඩු සහ මධ්‍යම මට්ටමේ හොඳ අධ්‍යාපනික පසුබිමක් ඇති (ආසන්න වශයෙන් 77%ක් උපාධිධාරීන්) වයස අවුරුදු 21-40 අතර වයස් කාණ්ඩයට අයත් තරුණයන් වේ (කරුණාරත්න, 2015). කණ්ඩායම් සාකච්ඡාව ද මෙම පැතිකඩ විස්තර තහවුරු කළ අතර ඔවුන් ප්‍රකාශ කළේ සංචාරකයින්ගේ සාමාන්‍ය නවාතැන් කාලය රාත්‍රී 1-2 ලෙස බවයි. සාමාන්‍යයෙන්, ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයින් බහුතරයක් ලෙස වාර්තා වී ඇත්තේ ආසියා පැසිෆික් (ඉන්දියාව සහ චීනය ප්‍රධාන මූලාශ්‍ර වෙලඳපොලවල්), යුරෝපය (එක්සත් රාජධානිය, ප්‍රංශය සහ ජර්මනිය ප්‍රධාන වෙළඳපල මූලාශ්‍ර) යන කලාපයන්ගෙනි. එමෙන්ම, කණ්ඩායම් සාකච්ඡාවට ප්‍රතිචාර දැක්වූවන්ද ඇල්ල වෙත සාමාන්‍යයෙන් පැමිණෙන අමුත්තන්ගේ පැතිකඩ මීට සමාන බව තහවුරු කර ඇත.



## 2.4 ගමනාන්ත ගුණාංග

### 2.4.1 6As' මාදිලිය භාවිතා කරමින් ගමනාන්ත ගුණාංග

සංචාරකයින්ගේ සංජානනයට සහ තෘප්තියට බලපාන අතරම ඇල්ලේ Destination Inventory හෝ ගමනාන්ත ගුණාංග ලොව පුරා සංචාරක පැමිණීම් කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කරයි. පහත සඳහන් පරිදි, බුහාලිස් (2000) විසින් සංවර්ධනය කරන ලද 6As' ආකෘතිය භාවිතා කිරීමෙන් ඇල්ලේ ඇති ගමනාන්ත ඉන්වෙන්ටරිවල ප්‍රමුඛතා ඉදිරිපත් කළ හැක.

*වගුව 2.1 6As' මාදිලිය භාවිතා කරමින් ගමනාන්ත ගුණාංග*

**6As' ආකෘතිය**

| | |
|---|---|
| ආකර්ෂණය | ස්වාභාවික<br><br>දේශගුණය<br>ජල සම්පත්<br>දුන්හිඳ ඇල්ල, බෝඹුරු ඇල්ල, නිල් දිය පොකුණ - ඇල්ලේ දිය යට පොකුණ, කිතල් ඇල්ල, රාවණා ඇල්ල<br>භූ දර්ශන සහ භූ දර්ශන<br>ඇල්ල ගැප්, පුංචි ශ්‍රී පාදය, රාවණා ගුහාව<br>භූ විද්‍යාත්මක සැකැස්ම<br>ඇල්ල පර්වතය, රාවණා කඳුවැටිය, පොරවගල<br><br>මිනිසා විසින් සාදන ලද<br><br>ස්මාරක ඒකක (රාවණා ඇල්ල විහාරය), පුරාවිද්‍යා ස්ථාන (රක්බිත්ත කන්ද ආරණ්‍ය සේනාසනය), අනුස්මරණ ප්‍රදේශ සහ ගොඩනැගිලි, හල්පේ පත්තිනි දේවාලය, ශාන්ත අන්තෝනි දේවස්ථානය, භෞතික ගොඩනැගිලි (ආරුක්කු නවය පාලම, තේ කර්මාන්තශාලා - නිව්බර්ග් හරිත උද්‍යානය, රාවණා ඇල්ල අභයභූමිය, කලාත්මක සම්පත් (සමරු භාණ්ඩ, පුරාවස්තු, පිත්තල ආභරණ, ලී අත්කම් , ශීතකරණ චුම්බක, බුද්ධ ප්‍රතිමා, දේශීය අතින් සාදන ලද චිත්‍ර, සම්ප්‍රදායික සිතුවම්-RMS පෞරාණික හා පිත්තල භාණ්ඩ),<br>දුම්රිය මාර්ගය - දෙමෝදර දුම්රිය ගැටය (Railway Knot) |
| ක්‍රියාකාරකම් | "ෆ්ලයින්ග් රාවණා" සිප් ලයින්, කඳු නැගීම (ඇල්ල රොක්, පුංචි ශ්‍රී පාදය), නමුණුකුල කඳුවුරු බැඳීම, ඇල්ල රොක්, ඇල්ලෙවල දිය ඇල්ල වෙත පාපැදි පැදීම/ රාවණා දිය ඇල්ල/රාවණා ගුහාව සහ වෙනත්, දුම්රිය චාරිකාව, අවයාජ ශ්‍රී ලාංකීය ඉවුම් පිහුම් නිරූපණය සහ අත්දැකීම්, ගම් සංචාරය, උත්සව - සතිපතා නගර පොළ සහ සංස්කෘතික උත්සව, බෞද්ධ, හින්දු සහ වෙනත් ආගමිකයන්ගේ උත්සව, තේ වතු සංචාර |
| පහසුකම් | නවාතැන් පහසුකම්<br>හෝම් ස්ටේස්, සුඛෝපභෝගී හෝටල්, මහල් නිවාස, නේවාසිකාගාර, බුටික් හෝටල්, බංගලා, සහ වෙනත්, සංචාරක තොරතුරු මධ්‍යස්ථානය, ආපනශාලා (මේටි හට් ඇල්ල, කැෆෙ චිල්, ලංකා තේ කර්මාන්ත ශාලාව), සනීපාරක්ෂාව සහ සනීපාරක්ෂාව සහ සනීපාරක්ෂක පහසුකම් (ඇල්ල දුම්රිය ස්ථානයේ නව වැසිකිළි සංකීර්ණය) |
| ප්‍රවේශය | දුම්රිය<br>උඩරට මැණිකේ, පොඩි මැණිකේ සහ කොළඹ සිට සීඝ්‍රගාමී දුම්රිය, ඇල්ල Oddessay නුවර සිට<br>හෝටල් සතු හෙලිපෝට්<br>කතරගම, මත්තල, බදුල්ල, කොළඹ සහ මහනුවර සිට වෙනත් අධිවේගී ප්‍රවේශ<br>ගුවන් තොටුපලවල්<br>මත්තල ජාත්‍යන්තර ගුවන්තොටුපළ ආදිය |
| අනුබද්ධ සේවා | වාණිජ බැංකු, විදුලි සංදේශ, අන්තර්ජාල පහසුකම්, සෞඛ්‍ය සේවය, සංචාරක පොලිසිය ආදිය |
| පවතින පැකේජ් | ගමනාන්තයේ සංචාරක ක්‍රියාකරුවන් හෝ හෝටල්, ප්‍රජාව සහ අනෙකුත් සංචාරක සේවා සපයන්නන් විසින් පෙර සූදානම් කළ සංචාර |

*මූලාශ්‍රය: Buhalis (2000), ක්ෂේත්‍ර අධ්‍යන සහ කණ්ඩායම් සාකච්ඡාව (2022)*

### 2.4.2 බට්ලර් ආකෘතිය භාවිතයෙන් ගමනාන්ත ජීවන චක්‍රය






*රූප සටහන 2.3 සංචාරක ගමනාන්ත ජීවන චක්‍රය - මූලාශ්‍රය: Miller and Gallucci (2004) වෙතින් අනුවර්තනය කරන ලදී*



රූප සටහන 2.3 හි ”ගමනාන්ත ජීවන චක්‍රය” සලකා බැලූ කාලයට අදාළව සංචාරක ගමනාන්තයේ සංවර්ධනය සහ අනුක්‍රමික අවධීන් පැහැදිලි කරයි. ඇල්ල වසර ගණනාවකට පෙර ප්‍රධාන වශයෙන් සිය ජීවන චක්‍රයේ ගවේෂණ සහ සංවර්ධන අවධීන් පසුකර ඇති අතර දැනට ගමනාන්තයට සංචාරක වර්ධන වේගය අඩුවීමක් කරා ආරම්භ වන ඒකාබද්ධතා මට්ටමට පැමිණ ඇත. සංචාරක ගමනාන්තවල ධාරිතාව අඩුවීම, සෞඛ්‍ය ගැටලු, වාහන නැවැත්වීමේ ගැටළු, නවාතැන් පහසුකම් ගැටළු, නුසුදුසු අපද්‍රව්‍ය කළමනාකරණ ගැටළු වැනි යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීමෙ ගැටළු මෙන්ම, රාජ්‍ය අනුග්‍රහය නොමැතිකම, ප්‍රතිපාදන ගැටළු, පරිසර දූෂණය ද COVID-19 වසංගත තත්ත්වයට පෙර ඇල්ලෙහි සංචාරක ගමනාන්ත ජීවන චක්‍රය “ ඒකක වල තීරණාත්මක  ධාරිතා පරාසයට” ඇතුළු වීමට ප්‍රධාන හේතු විය. කෙසේ වෙතත්, COVID-19 ට පසු තත්ත්වය වඩාත් තීරණාත්මක වී ඇත්තේ කර්මාන්තයේ විභව සේවකයින් රඳවා තබා ගැනීම, ව්‍යාපාරික ස්ථානය නැවත ලබා ගැනීම, ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීමේ අභියෝගය, සංචාරක සහ ආගන්තුක සත්කාර කුඩා හා මධ්‍යම සංචාරක ව්‍යවසායකයින්ගේ (SMEs) තිරසාරභාවය, සෞඛ්‍යය සහ ආරක්ෂාව, සමාජ පිළිගැනීම යනාදිය මතය.

එපමනක් නොව, ඇල්ල ඒකාබද්ධ කිරීමේ අදියරේ සිට පුනර්ජීවන අදියර (A, B) වෙත ක්‍රමානුකූලව ගමන් කිරීම සඳහා වැඩි ධාරිතාවයකින් , වැඩි සංචාරකයින් පිරිසක් රැඳවිය හැකි තාක්ෂණය සහ යටිතල පහසුකම් සියලුම පාර්ශ්වකරුවන්ගේ මැදිහත්වීම සමගින් අවශ්‍ය වේ.

## 2.4.3 ඇල්ල සංචාරක වටිනාකම් දාමය

ව්‍යුහාත්මකව, සංචාරක ව්‍යාපාරයට කලාපීය වශයෙන් අගය එකතු කිරීමේ විභවයක් ඇති අතර (Karunarathne, et al. 2018)  එමගින් නැගී එන ආර්ථිකයන් තිරසාර සංවර්ධනයට දායක කරගත හැකිය (Partale, 2020). ඇල්ල දේශීය හා ගෝලීය වශයෙන් වැදගත් සංචාරක ගමනාන්තයක් ලෙස ජාතික හා කලාපීය සංවර්ධනය සඳහා පුළුල් ලෙස දායක වේ.

රූප සටහන 2.4 හි ඉදිරිපත් කර ඇති ඉහත වටිනාකම් දාමය මගින් ඇල්ල ප්‍රදේශයේ සංචාරක මෙහෙයුම් විවිධ ආර්ථික අංශ, ආයතන මෙන්ම පුද්ගලයන් සමඟ ජාලගත වී ඇති ආකාරය මෙන්ම දේශීය ආර්ථිකය නංවාලීම සඳහා බලවත් බලපෑමක් ඇති කරන ආකාරය දෘශ්‍යමාන ලෙස විස්තාරනය කර ඇත.

මෙම සංරචකයන් කර්මාන්තයේ තිරසාරභාවයට සෘජුව හෝ වක්‍රව අත්‍යවශ්‍ය විය හැකි අතර වටිනාකම් නිර්මාණය කර රඳවා තබා ගැනීමට ද හැකිය. ඇල්ලේ හඳුනාගත් සංචාරක වටිනාකම් දාමය, ගමනාන්තයට පැමිණීමට පෙර සංචාරකයින්ගේ හැසිරීම (සම්භව රට සිට ගමනාන්තය දක්වා) සහ ගමනාන්තයට පැමිණීමෙන් පසු සංචාරකයින්ගේ හැසිරීම (ගමනාන්තය තුළ සහ ඒ අවට) ලෙස ප්‍රධාන කොටස් දෙකකින් සමන්විත වේ.

උපන් රටේ සිට ඇල්ල ගමනාන්තය දක්වා සංචාරකයින්ගේ හැසිරීම් පූර්ව පැමිණීමේ අදියරේ දී සමන්විත වන අතර, එයට සංචාරය සංවිධානය කිරීම, වෙන් කිරීම් සිදු කිරීම සහ අවසාන ගමනාන්තය වෙත ළඟාවීම ඇතුළත් වේ. මෙම ක්‍රියාවලියට සංචාරකයින් සඳහා ඔවුන්ගේ සංචාරයේ ආරම්භක අවස්ථාවේ සිට අවසාන ගමනාන්තය කරා ළඟා වන තෙක් වටිනාකමක් නිර්මාණය කිරීමේදී සෘජු සහ වක්‍ර සැපයුම්කරුවන් සම්බන්ධ වේ.

ඇල්ලට පැමිණීමෙන් පසු සංචාරකයින් මුහුණ දෙන ප්‍රධාන අත්දැකීම් සමඟ සම්බන්ධ වන සෘජු හා වක්‍ර පාර්ශවකරුවන්ගේ සම්බන්ධතා ”ගමනාන්තය තුළ සහ අවට” ඇතුළත් වේ. ප්‍රවාහනය, නවාතැන්, ආහාර පාන, නිර්මාණාත්මක කර්මාන්ත, සංචාරක සම්පත්, විවේකය, සංචාර සහ විනෝද චාරිකා සහ සෘජු සහ වක්‍ර වටිනාකම් නිර්මාණය ඇතුළත් උපකාරක සේවා වැනි ගමනාන්තයන් තුළ සංචාරකයින් මුහුණ දුන් අත්දැකීම්වල ප්‍රධාන අදියර කිහිපයකින් ද මෙම රාමුව සමන්විත වේ. ලා කොළ පැහැයෙන් ඇල්ල තුළ දැනට ක්‍රියාත්මක වන සංචාරක ක්‍රියාකාරකම් පෙන්නුම් කරන අතර සංවර්ධනය වෙමින් පවතින සංචාරක ක්‍රියාකාරකම් තද කොළ පැහැයෙන් දැක්වේ.

ඌව පළාතේ සංචාරක අමාත්‍යාංශය, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය (SLTDA), නාගරික සංවර්ධන අධිකාරිය සහ මධ්‍යම පරිසර අධිකාරිය වැනි ආයතන, ඇල්ල ප්‍රදේශයේ සංචාරක අත්දැකීම් සඳහා සහාය වන සංචාරක කර්මාන්තයට සම්බන්ධ ප්‍රධාන ආධාරක  රාජ්‍ය ආයතන වේ. ඌව පළාතට අයත් ඇල්ලෙහි සංචාරක කටයුතු නියාමනය කිරීමේ වගකීම දරන ප්‍රාදේශීය මට්ටමේ රජයේ අධිකාරිය ඌව පළාත් සංචාරක අමාත්‍යාංශයයි. එපමනක් නොව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය යනු ශ්‍රී ලංකාවේ සංචාරක අමාත්‍යාංශය වෙනුවෙන් සංචාරක ව්‍යාපාරය සහ ඒ ආශ්‍රිත කර්මාන්ත සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම, නියාමනය කිරීම සහ ප්‍රතිපත්ති

ක්‍රියාවට නැංවීමේ වගකීම පැවරී ඇති රාජ්‍ය ආයතනයයි. මධ්‍යම පරිසර අධිකාරිය යනු ශ්‍රී ලංකාවේ විවිධ සංචාරක ක්‍රියාකාරකම් සහ ව්‍යාපෘති හේතුවෙන් සිදුවන පාරිසරික බලපෑම් නියාමනය සහ තක්සේරු කිරීමේ වගකීම දරන රාජ්‍ය ආයතනයයි. මීට අමතරව, විවිධ සංචාරක මෙහෙයුම් වලදී බලපත්‍ර, සහතික සහ ප්‍රමිතීන් නියාමනය කරන වාණිජ මණ්ඩලය, බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතන සහ බලපත්‍ර සහ සම්මත ප්‍රමිතී ආයතන වැනි වෙළඳ ප්‍රවර්ධන සංවිධාන ඇල්ල ප්‍රදේශයේ සංචාරක අත්දැකීම වැඩිදියුණු කිරීම සඳහා වක්‍රව සහාය දක්වයි. ඇල්ල ප්‍රදේශයේ සංචාරක කටයුතු සුමටව පවත්වාගෙන යාමට අවශ්‍ය අත්‍යාවශ්‍ය යටිතල පහසුකම් ලෙස වටිනාකම් දාමයේ බලශක්ති, ජලය, තොරතුරු තාක්ෂණය, සන්නිවේදනය, සෞඛ්‍ය, මහජන ආරක්ෂාව සහ අධ්‍යාපනය වටිනාකම් දාමයේ සඳහන් වේ.

සාමාන්‍යයෙන් ඇල්ලේ පවතින ප්‍රවාහන ක්‍රම වන්නේ ඇල්ල හරහා මිනිසුන් ප්‍රවාහනය කරන රජයේ සහ පෞද්ගලික බස් රථ වේ. මීට අමතරව, ප්‍රවාහන මාධ්‍යයක් ලෙස කාර් සහ බයිසිකල් වැනි කුලී රථ සේවාවන් ද ඇත. තවද, සංචාරකයින් සඳහා දර්ශනීය දර්ශන සහිත දුම්රිය ගමනක් සමඟ ඇල්ල හරහා වඩාත් ජනප්‍රිය ප්‍රවාහන මාධ්‍ය වන්නේ දුම්රියයි. ඇල්ල නැරඹීමට පැමිණෙන සංචාරකයින්ගේ විශේෂ අවධානය යොමු කරමින් "Ella Oddessay" නමින් නව දුම්රිය ගමනක් පසුගියදා ආරම්භ කර ඇත. ඒ අනුව, ශ්‍රී ලංකා රේගුව, වරාය හා නාවික අමාත්‍යාංශය, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, ප්‍රවාහන අමාත්‍යාංශය වැනි ආයතන ද ශ්‍රී ලංකාවේ සංචාරක ගමනාන්තයක් තුළ සංචාරකයින් ප්‍රවාහනය සඳහා වක්‍රව සහාය දක්වයි.

නවාතැන් අංශය යටතේ දැනට හෝම්ස්ටේස්, විලාස් (Villas), බුටික් හෝටල් (Boutique Hotels), සංචාරක බංගලා, නිවාඩු නිකේතන වැනි පරිපූරක ආයතන රැසක්ම ඇල්ල ප්‍රදේශයේ ඇත. තවද, වර්ගීකරණය කරන ලද හෝටල්, සංචාරක හෝටල් සහ ගස් මත නිර්මාණය කරන ලද නවාතැන් පහසුකම් (Tree Houses) තවමත් සංවර්ධන මට්ටමේ පවතී. එපමණක් නොව, සංචාරකයින් ගමනාන්තයක රැඳී සිටීම සඳහා ආහාර සහ බීම වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. විශේෂයෙන්ම, ආහාර පාන මූලික අවශ්‍යතාවයක් ලෙස මෙන්ම, විශේෂිත සංචාරක ගමනාන්තයක සංස්කෘතික වටිනාකම විදහා දක්වන අංගයකි. ඒ අනුව ඇල්ලෙහි ආපනශාලා, තැබෑරුම්, රාත්‍රී සමාජශාලා, ක්ෂණික ආහාර අලෙවිසැල් සහ වීදි ආහාර අලෙවිසැල් ආහාර පාන සපයන්නන් ලෙස පවතී. මීට අමතරව, ඇල්ල ගමනාන්තය තුළ ආහාර උත්සව (Food Festivals) සහ ආහාර සිහිවටන (Food Soveniers) දැනට සංවර්ධනය වෙමින් පවතී.

'නිර්මාණාත්මක කර්මාන්ත' යන යෙදුමෙන් නිර්මාණශීලීත්වය ඇති ව්‍යාපාර විස්තර කරයි, උදාහරණ ලෙස, නිර්මාණ, සංගීතය, ප්‍රකාශනය, ගෘහ නිර්මාණ ශිල්පය, චිත්‍රපට සහ වීඩියෝ, අත්කම්, දෘශ්‍ය කලා, විලාසිතා, සාහිත්‍ය, රංග කලාව යනාදිය දැක්විය හැකිය. හස්ත කර්මාන්ත ශිල්පීන් සහ කලාකෘති අලෙවිසල් ඇල්ලේ පවතින නිර්මාණාත්මක කර්මාන්ත සැපයුම්කරුවන් ලෙස සැලකිය හැකිය. ඇල්ල ගමනාන්තයේ සංගීත සහ නැටුම් රඟහල්, කලාකරුවන් සහ වාදකයින් වේදිකා නිර්මාණශීලී සැපයුම්කරුවන් ලෙස සැලකිය හැකිය. තවද, දැනට නවාතැන්, ආහාර පානවලට අදාළ වක්‍ර සැපයුම්කරුවන්, භාණ්ඩ සහ සේවා සැපයුම්කරුවන් වැනි නිර්මාණාත්මක කර්මාන්තඃ (ගෘහ භාණ්ඩ, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ, ආහාර, රෙදිපිළි, කෘෂිකර්මය ආදිය), ගබඩා කිරීම, බෙදා හැරීම, අමුද්‍රව්‍ය සැපයුම්කරුවන්, නඩත්තු කිරීම සහ විකුණුම් සහ අලෙවි සැපයුම්කරුවන් සංවර්ධනය වෙමින් පවතින අදියරයන් තුළ සිටී.

මීට අමතරව, ඇල්ල බොහෝ ස්වභාවික (දිය ඇලි, කඳු, වනාන්තර, ගංගා ආදිය) සහ සංස්කෘතික සම්පත් (ආගමික ස්ථාන - පන්සල්, කෝවිල්, පල්ලිය) වලින් පොහොසත් ය. එහෙත් තවමත් උත්සව, කෞතුකාගාර, ආදර්ශ ගම්මාන වැනි සංස්කෘතික සම්පත් සහ ගෘහ නිර්මාණ ශිල්පය, යටිතල පහසුකම් සහ උපරිව්‍යුහය වැනි ගොඩනඟන ලද සම්පත් සංවර්ධනය වෙමින් පවතී. එසේම, කඳු නැගීම,  බයිසිකල් පැදීම, සිප් ලයින් (පටි, හිස්වැසුම් භාවිතා කරමින් එක් ස්ථානයක සිට තවත් ස්ථානයකට කේබලයක් පැදවීම)සහ සංචාරක පැකේජ සැපයීම වැනි ක්‍රියාකාරකම් ඇල්ලේ දැනට පවතින විවේක, සංචාර සහ විනෝද චාරිකා සැපයුම්කරුවන් ලෙස සැලකිය හැකිය. එහෙත් තවමත් ඇල්ල ප්‍රදේශයේ වෘත්තීය සංචාර මාර්ගෝපදේශ සේවා, අධ්‍යාත්මික සහ සුවතා මධ්‍යස්ථාන සංවර්ධනය වෙමින් පවතී. මීට අමතරව, ස්වභාවික හා සංස්කෘතික ස්ථානවල සංඥා සහ දිශා දැක්වීමේ පුවරු, විවේකය, චාරිකා සහ විනෝද චාරිකා සඳහා වක්‍ර සේවා ප්‍රතිසංස්කරණය, කළමනාකරණය, සංරක්ෂණය සහ සම්පත් ප්‍රවර්ධනය කිරීම ද තවමත් සංවර්ධනය වෙමින් පවතී.

තවද, ඇල්ල ප්‍රදේශයේ දැනට පවතින ආධාරක සේවා අතර රෙදි සෝදන සහ පිරිසිදු කිරීමේ සේවා, බැංකු සේවා, ආරක්ෂක සේවා, අන්තර්ජාල කැෆෙ ආදිය ඇතුළත් වන අතර සංචාරක තොරතුරු මධ්‍යස්ථාන, සාප්පු සංකීර්ණ සංවර්ධනය වෙමින් පවතී. ඒ සමඟම වක්‍ර සැපයුම්කරුවන් වන වෙළඳ සමාගම්, නිෂ්පාදකයින්, බෙදා හැරීම, ඉන්ධන සහ බලශක්ති සැපයුම්කරුවන්, තොරතුරු තාක්ෂණ විශේෂඥයින් සහ මෘදුකාංග (දේපල කළමනාකරණ පද්ධති, සංචාරක කළමනාකරණ පද්ධති), විශේෂයෙන් උසස් අධ්‍යාපන ආයතන විසින් සපයනු ලබන පර්යේෂණ, පුහුණු සහ උපදේශන සේවා සංවර්ධන අදියර යටතේ පවතී.

එපමනක් නොව, දැනට ඇල්ල ප්‍රදේශයේ සංචාරක ක්‍රියාකාරකම් බොහෝ විට සංචාරක සම්පත් අධික ලෙස පරිභෝජනය කිරීම සහ අනිසි ලෙස භාවිතා කිරීම තුළින් සොබාදහමට සහ සමාජයට බරක් පටවයි. එය ප්‍රදේශයකට දැවැන්ත පීඩනයක් එල්ල කළ හැකි අතර විවිධ ආකාරයේ අහිතකර පාරිසරික සහ සමාජ සංස්කෘතික බලපෑම්වලට තුඩු දෙයි. එබැවින් තිරසාර සංචාරක ක්‍රියාකාරකම් හරහා සෘජු හා වක්‍ර සංචාරක ක්‍රියාකාරකම් සිදු කිරීමේදී මෙම සෘණාත්මක සංචාරක බලපෑම් අවම කර ගැනීම පිළිබඳව සැලකිලිමත් වීම අවශ්‍ය වේ. ඒ අනුව, 02 රූපයේ දැක්වෙන අළු පැහැති ඒකක මඟින් ඇල්ල ප්‍රදේශයේ විවිධ සංචාරක ක්‍රියාකාරකම් හරහා නිර්මාණය වී ඇති ස්වභාවික හා සමාජ සංස්කෘතික අහිතකර බලපෑම් පෙන්නුම් කරයි.






සංවර්ධනය වෙමින් පවතී

දැනට ක්‍රියාත්මක වේ

*රූප සටහන 2.4 ඇල්ල සංචාරක වටිනාකම් දාමය*

*මූලාශ්‍රය: පර්යේෂණ සහ කණ්ඩායම් සාකච්ඡාව මත*

*පදනම්ව ව්‍යාපෘති කණ්ඩායම විසින් ITC UNWTO (2015) භාවිතයෙන් සංවර්ධනය කරන ලදී*

## 2.4.4 ඇල්ල සඳහා SWOT විශ්ලේෂණය

### ශක්තීන්

- රට තුළ සංචාරක ගමනාන්තයක් ලෙස ගැසට් කර තිබීම
- සංචාරක සංවර්ධනය සඳහා සුදුසු දේශගුණය
- මනරම් ස්ථාන පැවතීම
- නගරය සහ ඒ අවට ප්‍රදේශය තුළ රජය සතු ඉඩම් තිබීම
- ස්වාභාවික, සංස්කෘතික සහ ඓතිහාසික සංචාරක ආකර්ෂණ ස්ථාන
- සමාජ මාධ්‍යයන්හි සංචාරකයන්ගේ ඉහළ තෘප්තිමත් ඇගයීම් සහ ධනාත්මක අදහස් ප්‍රකාශනයන්
- සංචාරක ව්‍යාපාරය සඳහා සුප්‍රසිද්ධ ගමනාන්තයක් වීම
- කුඩා හා මධ්‍ය පරිමාණ ආගන්තුක සත්කාර ව්‍යවසායන් රැසක් පැවතීම
- මෙරට ඉහළම වායුගෝලීය ඔක්සිජන් සාන්ද්‍රණයක් පැවතීම
- රාවණා වනජීවී සංරක්ෂණ කලාපය පිහිටා තිබීම
- තේ සංචාරක කර්මාන්තය සංවර්ධනය සඳහා විභවතාවයන් සහිත තේ වතු වල පැවැත්ම
- රාවණා පුරාවෘත්තය සහ ප්‍රදේශයේ ඓතිහාසික/සංස්කෘතික වටිනාකම
- ප්‍රාදේශීය ප්‍රජාවගේ දායකත්වයෙන් පාරිසරික හා සංචාරක සංවර්ධන සමිති පිහිටුවීම
- ජාත්‍යන්තර සංචාරක ප්‍රවර්ධන ව්‍යාපාර සහ වෙළඳ දැන්වීම් ක්‍රියාත්මක කිරීම
- යෝජිත "කොෂිමා" ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය

### දුර්වලතා

- ස්වාභාවික විපත් (උදා: නාය යෑම්)
- ස්වාභාවික සම්පත් වැරදි ලෙස කළමනාකරණය කිරීම
- අනාරක්ෂිත සහ අනවසර ඉදිකිරීම්
- ජනාකීර්ණ සංචාරක ස්ථාන
- සංචාරක කළමනාකරණ පද්ධතියක් නොමැති වීම
- රථවාහන තදබදය, දෘශ්‍ය දූෂණය සහ ශබ්ද දූෂණය යන දෙකටම බලපායි
- අපද්‍රව්‍ය කළමනාකරණය සහ ජලාපවහන පද්ධතිය ප්‍රමාණවත් නොවීම
- නගර ප්‍රදේශයේ මූලික පහසුකම් නොමැතිකම
- සමහර ප්‍රධාන සංචාරක ආකර්ෂණ ස්ථානවල අනතුරු ඇඟවීමේ පුවරු, සංඥා පුවරු, දිශා පුවරු නොමැති වීම
- සංචාරක ක්‍රියාකාරකම් පිළිබඳව ප්‍රාදේශීය ප්‍රජාව අතර දැනුවත්භාවය නොමැතිකම
- සංචාරක කටයුතු වලදී නවීන තාක්ෂණයන් භාවිතා නොකිරීම

**ශදුඅත විශ්ලේෂණය (SWOT)**

### අවස්ථාවන්

- ජාත්‍යන්තර සංචාරක සඟරාවල නැගී එන ගමනාන්තයක් ලෙස ප්‍රචලිත වීම
- සංචාරක ව්‍යාපාරයට හිතකර රජයේ ප්‍රතිපත්ති
- දුම්රියෙන්ට ඇල්ලට පහසුවෙන් ප්‍රවේශ වීමේ හැකියාව සහ සංකේතාත්මක දසුන් හරහා මෝටර්
- රථ පැදවීම
  ආරක්ෂිත, නිස්කලංක සහ ස්වාභාවික සංචාරක අත්දැකීම් සඳහා වැඩිවන ඉල්ලුම සහ ප්‍රවණතාවය
- හරිත, භූ, වික්‍රමාන්විත සහ පරිසර සංකල්පවල ප්‍රවණතාවය
- ඇල්ල දෙසට සංචාරක ආයෝජන අවස්ථා
- මාර්ග ජාලය සංවර්ධනය කිරීම
- විවිධාංගීකරණය වූ සංස්කෘතීන් ගවේෂණය කිරීමට සහ බෙදා ගැනීමට ඇති අවස්ථාව
- විවිධාංගීකරණය වූ සංචාරක ආශ්‍රිත ව්‍යාපාර දියත් කිරීමේ අවස්ථාව
- රට තුළ නව සාමාන්‍ය තත්ත්වයෙන් සංචාරක කටයුතු නැවත ආරම්භ කිරීමට අවස්ථාව
- වාණිජ අගනගරය සහ ජාත්‍යන්තර ගුවන් තොටුපළ සඳහා ඉහළ සමීපත්වය
- සංචාරක සංවර්ධනය සහ ප්‍රවර්ධනය සඳහා රජයේ සහයෝගය
- නවීන තාක්ෂණය දියුණු කිරීම

### තර්ජන

- උමා ඔය (ගඟ) ව්‍යාපෘතියේ බලපෑම හේතුවෙන් ජල උල්පත් අතුරුදහන් වීම
- වෘක්ෂලතා අහිමි වීම
- පරිසර දූෂණය
- දර්ශනීය සුන්දරත්වය පිරිහීම
- සංවේදී පාරිසරික ප්‍රදේශ වලට හානි වීම
- පානීය ජල හිඟය සහ භාවිත කළ හැකි ඉඩම් හිඟය
- අධික සංචාරක ව්‍යාපාරය හේතුවෙන් සමාජ-සංස්කෘතික පරිහානිය
- සංස්කෘතික හා ස්වභාවික සම්පත් වෙළඳකරණය
- පාරම්පරික ජීවනෝපාය අහිමි වීම
- නිසි යාන්ත්‍රණයකින් තොරව සම්ප්‍රදායික කෘෂිකර්මාන්තයේ සිට සංචාරක ව්‍යාපාරයට ශ්‍රම හා සම්පත් සංක්‍රමණය වීම
- ගණිකා වෘත්තිය පැතිරීම, ලිංගාශ්‍රිත රෝග සහ මත්ද්‍රව්‍ය භාවිතය
- සංචාරක ප්‍රතිලාභ නිසි ආකාරයෙන් බෙදී නොයාම
- රටේ වත්මන් ආර්ථික අර්බුදය
- නැගී එන තරඟකාරී සංචාරක ගමනාන්ත

*රූප සටහන 2.5 SWOT විශ්ලේෂණ මූලාශ්‍රය: පර්යේෂණ සහ කණ්ඩායම් සාකච්ඡාව මත පදනම්ව ව්‍යාපෘති කණ්ඩායම විසින් සංවර්ධනය කරන ලදී*

## 2.4.5 ඇල්ල සඳහා SOAR විශ්ලේෂණය

### ශක්තීන්

- රට තුළ සංචාරක ගමනාන්තයක් ලෙස ගැසට් කර තිබීම
- සංචාරක සංවර්ධනය සඳහා සුදුසු දේශගුණය
- මනරම් ස්ථාන පැවතීම
- නගරය සහ ඒ අවට ප්‍රදේශය තුළ රජය සතු ඉඩම් තිබීම
- ස්වාභාවික, සංස්කෘතික සහ ඓතිහාසික සංචාරක ආකර්ෂණ ස්ථාන
- සමාජ මාධ්‍යයන්හී සංචාරකයන්ගේ ඉහළ තෘප්තිමත් ඇගයීම් සහ ධනාත්මක අදහස් ප්‍රකාශනයන්
- සංචාරක ව්‍යාපාරය සඳහා සුප්‍රසිද්ධ ගමනාන්තයක් වීම
- කුඩා හා මධ්‍ය පරිමාණ ආගන්තුක සත්කාර ව්‍යවසායන් රැසක් පැවතීම
- මෙරට ඉහළම වායුගෝලීය ඔක්සිජන් සාන්ද්‍රණයක් පැවතීම
- රාවණා වනජීවී සංරක්ෂණ කලාපය පිහිටා තිබීම
- තේ සංචාරක කර්මාන්තය සංවර්ධනය සඳහා විභවතාවයන් සහිත තේ වතු වල පැවැත්ම
- රාවණා පුරාවෘත්තය සහ ප්‍රදේශයේ ඓතිහාසික/සංස්කෘතික වටිනාකම
- ප්‍රාදේශීය ප්‍රජාවගේ දායකත්වයෙන් පාරිසරික හා සංචාරක සංවර්ධන සමිති පිහිටුවීම
- ජාත්‍යන්තර සංචාරක ප්‍රවර්ධන ව්‍යාපාර සහ වෙළඳ දැන්වීම් ක්‍රියාත්මක කිරීම
- යෝජිත "කොෂිමා" ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය

### අභිලාෂයන්

- ස්වභාවික විපත් (උදා: නාය යෑම්)
- ස්වභාවික සම්පත් වැරදි ලෙස කළමනාකරණය කිරීම
- අනාරක්ෂිත සහ අනවසර ඉදිකිරීම්
- ජනාකීර්ණ සංචාරක ස්ථාන
- සංචාරක කළමනාකරණ පද්ධතියක් නොමැති වීම
- රථවාහන තදබදය දෘශ්‍ය දූෂණය සහ ශබ්ද දූෂණය යන දෙකටම බලපායි
- අපද්‍රව්‍ය කළමනාකරණය සහ ජලාපවහන පද්ධතිය ප්‍රමාණවත් නොවීම
- නගර ප්‍රදේශයේ මූලික පහසුකම් නොමැතිකම
- සමහර ප්‍රධාන සංචාරක ආකර්ෂණ ස්ථානවල අනතුරු ඇඟවීමේ පුවරු, සංඥා පුවරු, දිශා පුවරු නොමැති වීම
- සංචාරක ක්‍රියාකාරකම් පිළිබඳව ප්‍රාදේශීය ප්‍රජාව අතර දැනුවත්භාවය නොමැතිකම
- සංචාරක කටයුතු වලදී නවීන තාක්ෂණයන් භාවිතා නොකිරීම

SOAR විශ්ලේෂණය

### අවස්ථාවන්

- ජාත්‍යන්තර සංචාරක සඟරාවල නැගී එන ගමනාන්තයක් ලෙස ප්‍රචලිත වීම
- සංචාරක ව්‍යාපාරයට හිතකර රජයේ ප්‍රතිපත්ති
- දුම්රියෙන් ඇල්ලට ප්‍රවේශ වීමේ හැකියාව සහ සංකේතාත්මක දසුන් හරහා මෝටර් රථ පැදවීම
- ආරක්ෂිත, ලිහිල් සහ ස්වභාවික සංචාරක අත්දැකීම් සඳහා වැඩිවන ඉල්ලුම සහ ප්‍රවණතාවය
- හරිත, භූ, වික්‍රමාන්විත සහ පරිසර සංකල්පවල ප්‍රවණතාවය
- ඇල්ල දෙසට සංචාරක ආයෝජන අවස්ථා
- මාර්ග ජාලය සංවර්ධනය කිරීම
- විවිධාංගීකරණය වූ සංස්කෘතීන් ගවේෂණය කිරීමට සහ බෙදා ගැනීමට ඇති අවස්ථාව
- විවිධාංගීකරණය වූ සංචාරක ආශ්‍රිත ව්‍යාපාර දියත් කිරීමේ අවස්ථාව
- රට තුළ නව සාමාන්‍ය තත්ත්වයෙන් සංචාරක කටයුතු නැවත ආරම්භ කිරීමට අවස්ථාව
- වාණිජ ප්රාගධනය සහ ජාත්යන්තර ගුවන් තොටුපළ සඳහා ඉහළ සමීපත්වය
- සංචාරක සංවර්ධනය සහ ප්‍රවර්ධනය සඳහා රජයේ සහයෝගය
- නවීන තාක්ෂණය දියුණු කිරීම

### ප්‍රතිඵල

- උමා ඔය (ගඟ) ව්‍යාපෘතියේ බලපෑම හේතුවෙන් ජල උල්පත් අතුරුදහන් වීම
- වෘක්ෂලතා අහිමි වීම
- පරිසර දූෂණය
- දර්ශනීය සුන්දරත්වය පිරිහීම
- සංවේදී පාරිසරික ප්‍රදේශ වලට හානි කිරීමේ තර්ජනය
- ඇල්ල ප්‍රදේශයේ පානීය ජල හිඟය සහ භාවිත කළ හැකි ඉඩම්
- අධික සංචාරක ව්‍යාපාරය හේතුවෙන් සමාජ-සංස්කෘතික පරිහානිය
- සංස්කෘතික හා ස්වභාවික සම්පත් වෙළඳ භාණ්ඩකරණය
- පාරම්පරික ජීවනෝපාය අහිමි වීම
- නිසි යාන්ත්‍රණයකින් තොරව සම්ප්‍රදායික කෘෂිකර්මාන්තයේ සිට සංචාරක ව්‍යාපාරයට ශ්‍රම හා සම්පත් සංක්‍රමණය වීම
- ලිංගාශ්‍රිත රෝග සහ මත්ද්‍රව්‍ය භාවිතය
- ඇල්ලෙන් සංචාරක ව්‍යාපාරයේ ප්‍රතිලාභ
- රටේ වත්මන් ආර්ථික අර්බුදය
- නැගී එන තරඟකාරී සංචාරක ගමනාන්ත

*රූප සටහන 2.6 SOAR විශ්ලේෂණ මූලාශ්‍රය: ද්විතියික පර්යේෂණ සහ කණ්ඩායම් සාකච්ඡාව මත පදනම්ව ව්‍යාපෘති කණ්ඩායම විසින් සංවර්ධනය කරන ලදී*

## 2.5 පාලන ව්‍යුහය

සහජීවනය සඳහා පොදු අරමුණු සහ තීරණය කරන ලද අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සම්බන්ධීකරණය සහ සහයෝගයෙන් කටයුතු කරන්නේ කෙසේද යන්න පිළිබඳව සාමූහිකව තීරණය කිරීමට ප්‍රතිපත්ති, සම්මතයන්, ක්‍රියා පටිපාටි සහ භාවිතයන් මත පදනම් වූ ආයතනික හා තාක්ෂණික වශයෙන් ව්‍යුහගත වූ මාර්ගෝපදේශක ක්‍රියාවලියක් පාලනයට ඇතුළත් වේ. මෙහිදී, මොරිසන් (2013) සඳහන් කළේ ගමනාන්ත පාලනය යනු ගමනාන්ත කළමනාකරණ සංවිධානයක් (DMO) හෝ ජාතික සංචාරක සංවිධානයක් (NTO) ගමනාන්තයක් පරිපාලනය කරන්නේ කෙසේද සහ පරිපාලනය කරන්නේ කවුරුන්ද යන්නයි. සංචාරක පාලනයට පැහැදිලිවම සංවර්ධිත ප්‍රතිපත්ති, පද්ධති සහ ක්‍රියාවලීන් ඇතුළත් වන අතර එය සියලුම පාර්ශවකරුවන් සම්බන්ධ බව සහතික කරයි. ඒ අනුව ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරයේ පාලනය සහ පරිපාලනය මට්ටම් තුනක් යටතේ සිදුවේ. පළමුව, සංචාරක සංවර්ධන කැබිනට් අමාත්‍යාංශය රටේ සංචාරක කර්මාන්තය පරිපාලනය කරයි. දෙවනුව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, ගමනාන්ත කළමනාකරණ සංවිධාන සහ ජාතික සංචාරක සංවිධාන ලෙස ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය කළමනාකරණය කිරීම සහ පහසුකම් සපයයි. තෙවනුව, පළාත් සභා සහ පළාත් පාලන ආයතන සංචාරක ව්‍යාපාරය ඒ ඒ මට්ටමින් කළමනාකරණය කරයි.

"ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය පිළිබඳ රෙගුලාසි සලකා බැලීමේදී වැඩි බලයක් මධ්‍යම රජය වෙත ලැබී ඇත. ඒ අනුව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරයේ ප්‍රධාන නියාමන ආයතනය වී ඇත. මීට අමතරව සංචාරක කර්මාන්තයට අදාළ මානව සම්පත් සංවර්ධනය සඳහා ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය වගකීම දරයි. තවද, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යංශය ශ්‍රී ලාංකේය සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් ක්‍රියාත්මක වේ."
(ප්‍රතිචාර දැක්වූ හත්වෙනියා, කණ්ඩායම් සාකච්ඡාව, 2022)

ඉහත ප්‍රතිචාර දැක්වූ හත්වෙනියා සඳහන් කළ පරිදි, සංචාරක කර්මාන්තය  කළමනාකරණය කිරීමේ ප්‍රධාන කාර්යභාරය සංචාරක අමාත්‍යාංශය විසින් ඉටු කරයි. මෙහිදී, අමාත්‍යාංශය යටතේ මණ්ඩල හතරක් ක්‍රියාත්මකයි. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය ශ්‍රී ලංකාවේ ප්‍රධාන ගමනාන්ත කළමනාකරණ සංවිධානය සහ ජාතික සංචාරක සංවිධානය ලෙස ක්‍රියා කරයි. ශ්‍රී ලංකාව ජාත්‍යන්තර සංචාරකයන් සඳහා ප්‍රමුඛ ගමනාන්තයක් ලෙස ස්ථාපිත කිරීම, ස්ථානගත කිරීම සහ සංවර්ධනය කිරීම මෙම ආයතනයට පැවරී ඇත. ආයෝජකයින්ට සහ ප්‍රජාවන්ට ප්‍රතිලාභ ලබා දෙන අතරම එහි සංචාරක අවස්ථා පුළුල් කිරීමට සහ වැඩිදියුණු කිරීමට මෙන්ම ශ්‍රී ලංකාවේ ස්වභාවික විභවතාවයන් ලබා ගැනීම සඳහා එය වගකීම දරයි.

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (SLTPB) යනු ශ්‍රී ලංකාවේ සංචාරක සහ සංචාරක කර්මාන්තයට අදාළ සියලුම අලෙවිකරණ සහ ප්‍රවර්ධන ක්‍රියාකාරකම් හැසිරවීම සඳහා වගකිව යුතු බලයලත් රාජ්‍ය ආයතනයයි. මීට අමතරව, ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය (SLCB) යනු ශ්‍රී ලංකාව MICE (රැස්වීම්, දිරිගැන්වීම්, සම්මන්ත්‍රණ, ප්‍රදර්ශන) ක්‍රියාකාරකම් සඳහා ස්ථානයක් ලෙස ප්‍රවර්ධනය කිරීමේ ප්‍රධාන අරමුණ ඇති ආයතනයකි. ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය (SLITHM) සංචාරක හා සත්කාරක අංශය සඳහා තරුණයින් පුහුණු කිරීම සහ දැනුවත් කිරීම සඳහා ක්‍රියාත්මක වේ. පහත රූපයේ දැක්වෙන්නේ ජාතික සංචාරක පාලන රාමුවයි.

1987 අංක 42 දරන පළාත් සභා පනතට අනුව ශ්‍රී ලංකා රජය මෙහෙයුම් විමධ්‍යගත කිරීම සඳහා අදාළ පළාත්වලට බලතල බෙදා හැරියේය. එබැවින්, අදාළ කලාපවල සංචාරක සංවර්ධනය කළමනාකරණය කරනු ලබන්නේ පළාත් සංචාරක අමාත්‍යාංශය විසින් වන අතර, සමහර පළාත් සංචාරක කාර්‍යාංශය හෝ සංචාරක සංවර්ධන අධිකාරිය වැනි ස්වාධීන ආයතනයක් සංචාරක ව්‍යාපාරයට අදාළ විෂය පථයන් පාලනයට සකස් කර ඇත.

"ශ්‍රී ලංකාවේ පළාත් මට්ටම් සලකා බැලීමේදී සෑම පළාත් සභාවක්ම සංචාරක අමාත්‍යාංශයකින් සමන්විත වේ. ප්‍රාදේශීය මට්ටමින් ගත් විට සංචාරක ව්‍යාපාරය දියුණු කිරීම සඳහා ප්‍රාදේශීය සභාවට යම් අධිකාරියක් සහ නියාමන බලයක් තිබෙන අතර ඔවුන් ප්‍රජාව සමඟ ඉතා සමීපව කටයුතු කරයි."
(ප්‍රතිචාර දැක්වූ හත්වෙනියා, කණ්ඩායම් සාකච්ඡාව, 2022)






*රූප සටහන 2.7 සංචාරක පාලන රාමුව*
*මූලාශ්‍රය: සංචාරක සංවර්ධන අමාත්‍යාංශය, 2017*

කෙසේ වෙතත්, පළාත් අමාත්‍යාංශ සහ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය අතර නිසි සම්බන්ධීකරණ සහ අධීක්ෂණ යාන්ත්‍රණයක් නොමැත. සමහර ක්‍රියාකාරකම් සිදුවන්නේ තාවකාලිකව ය. ප්‍රාදේශීය මට්ටමින් සංචාරක කර්මාන්තය දියුණු කිරීමට ප්‍රාදේශීය සභාවට යම් අධිකාරියක් සහ නියාමන බලයක් ඇති අතර ඔවුන් ප්‍රජාව සමඟ ඉතා සමීපව සහයෝගයෙන් කටයුතු කරයි.

"සමස්තයක් වශයෙන්, ශ්‍රී ලංකාවේ සංචාරක නියාමනය සම්බන්ධයෙන්, විශේෂයෙන්ම ප්‍රධාන ගමනාන්ත වල, යම් යම් ගැටලු අපි නිරීක්ෂණය කළෙමු. උදාහරණයක් වශයෙන්, ඇල්ල ප්‍රදේශයේ සමහර ක්‍රියාකාරකම් නියාමනය කිරීමේදී රජයට, ප්‍රාදේශීය සභාවට සහ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට යම් සීමාවන් තිබේ."
(ප්‍රතිචාර දැක්වූ හත්වෙනියා, කණ්ඩායම් සාකච්ඡාව, 2022)

ඇල්ල ශ්‍රී ලංකාවේ සංචාරක ගමනාන්තයක් ලෙස සලකන විට, සංචාරක පාලන ව්‍යුහයට බලපාන නියාමන ගැටළු, තත්ත්ව ගැටළු සහ හැසිරීම් ගැටළු වැනි පද්ධති ගැටළු කිහිපයක් තිබේ. විශේෂයෙන්ම ඇල්ල ප්‍රදේශයේ සංචාරක සේවා සපයන්නන් ලියාපදිංචි කිරීමට නිසි යාන්ත්‍රණයක් නොමැත. එනිසාවෙන් ශක්තිමත් පරිපාලන සහ නියාමන රාමුවක් අවශ්‍ය වේ. මෙහිදී එක් එක් ආයතනවල රාජකාරිය පැහැදිලිව සඳහන් කළ යුතු අතර, සංචාරක ව්‍යාපාරයේ අවශ්‍යතා සපුරාලීම සඳහා පාලන ව්‍යුහය වෙනස් කළ යුතුය.

"සංචාරක කර්මාන්තයේ සේවා සපයන්නන් ගැන සලකා බැලීමේදී 79%කට වැඩි ප්‍රමාණයක් අවිධිමත් සහ ලියාපදිංචි නොකළ අයයි. කෙසේ වෙතත්, ඔවුන් සංචාරක කර්මාන්තයෙන් ඉවත් කළ යුතු නැත. මන්ද, ඔවුන් තම හැකියාවන් සමඟ සංචාරක කර්මාන්තයට විශාල දායකත්වයක් ලබා දෙන බැවිනි. සේවාවේ ගුණාත්මකභාවය සහ අවම මට්ටමේ ප්‍රමිතීන් සම්බන්ධයෙන් ගැටළු කිහිපයක් තිබේ. මීට අමතරව, සංචාරක කර්මාන්තයේ නියැලෙන පුද්ගලයින්ගේ හැසිරීම් ගැටළු කිහිපයක් අපි නිරීක්ෂණය කර ඇත්තෙමු."
(ප්‍රතිචාර දැක්වූ හත්වෙනියා, කණ්ඩායම් සාකච්ඡාව, 2022)

එබැවින්, සංචාරක ව්‍යාපාරයේ විවිධ අංශවලට සම්බන්ධ රාජ්‍ය ආයතන අතර සහයෝගීතාව සහ ඒකාග්‍රතාවය සාක්ෂාත් කර ගැනීමේදී සහ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ව්‍යවසායන් අතර මෙන්ම සංචාරක ප්‍රතිපත්ති සහ ප්‍රජා අවශ්‍යතා අතරද ගමනාන්ත පාලනය සඳහා හොඳින් ස්ථාපිත සංචාරක ආයතන රාමුවක් අත්‍යවශ්‍ය වේ. එය ප්‍රතිපත්ති සම්පාදකයින්, කළමනාකරුවන්, ප්‍රජා සාමාජිකයින් සහ විද්වතුන් සඳහා බෙහෙවින් වැදගත් වේ.

# අවදානම් ලේඛනය

# 3 පරිච්ඡේදය



## 3.1 සංචාරක ව්‍යාපාරයට ඇති උපද්‍රව සහ බලපෑම්

ලොව පුරා, අවදානම් සහ උපද්‍රව ප්‍රධාන වර්ග දෙකක් ඇත. එනම්, ස්වභාවික සහ මානව ක්‍රියාකාරකම් නිසා සිදුවන අවදානම් සහ උපද්‍රව යනුවෙනි. කර්මාන්තකරණය සහ නාගරීකරණය ගෝලීය වශයෙන් ස්වභාවික අවදානම් සහ උපද්‍රව උග්‍ර කර ඇත (Rossello, Becken, & Santana-Gallego, 2020). මීට අමතරව, තාක්ෂණයන් දියුණු වීම නිසා මානව ක්‍රියාකාරකම් නිසා සිදුවන අවදානම් සහ උපද්‍රව ඉහළ යාමෙන් වඩාත් තීරණාත්මක වෙමින් පවතී. අවදානම් වර්ග දෙකම භෞතික විපත් සඳහා ඉහළ විභවයක් ඇත. සංචාරක ක්‍රියාකරුවන් ලෙස, මෙම අවදානම් කළමනාකරණය කිරීමේදී ප්‍රදේශයේ අවදානම්, උපද්‍රව සහ ධාරිතා ශක්තීන් කෙරෙහි සියලු පාර්ශ්වකරුවන් අවධානය යොමු කළ යුතුය.

වර්තමානයේ, නැගී එන සංචාරක ගමනාන්තයක් ලෙස දැවැන්ත වර්ධනයක් වාර්තා කරමින් ලොව පුරා සංචාරකයින් අතර ඇල්ල ප්‍රමුඛ ගමනාන්තයක් බවට පත්ව ඇත. එබැවින්, සංචාරක ගමනාන්තයක් ලෙස ඇල්ල දිගුකාලීන තිරසාර බව සහතික කිරීම සඳහා භූගෝලීය, රූප විද්‍යාත්මක, ජල විද්‍යාත්මක, කාලගුණ විද්‍යාත්මක සහ දේශපාලන ස්ථාවරත්වය සහ ආරක්ෂාව මෙන්ම සෞඛ්‍ය සහ ආරක්ෂාව සහ අනෙකුත් සාධක මෙම සන්දර්භය තුළ නිතිපතා ඇගයීමට ලක් කළ යුතුය. ඊට පටහැනිව, මෙම ප්‍රදේශයේ වර්තමාන තත්ත්වය සංචාරක ගමනාන්තයක් ලෙස අවදානම සහ ඔරොත්තු දීමේ හැකියාව පිළිබඳව බොහෝ විට අඩු හෝ නොසැලකිලිමත් බවක් පෙන්නුම් කර ඇති අතර එම නිසා බොහෝ නිරීක්ෂණය කළ හැකි තර්ජන මතුවෙමින් තිබේ. නිදසුනක් වශයෙන්, ජල සැපයුම, දේශගුණික විපර්යාස, අපද්‍රව්‍ය කළමනාකරණය, බලශක්ති කළමනාකරණය, ස්වාභාවික විපත් යනාදිය නිසි ලෙස පුරෝකථනය කර නොමැති අතර එවැනි විකාශනය වන ගැටළු

සඳහා විසඳුම් සංචාරකයින්ගේ සහ ප්‍රාදේශීය ජනතාවගේ දෘෂ්ටිකෝණයෙන් ප්‍රමාණවත් ලෙස ප්‍රකාශ කර නොමැත. මේ වන විට ඇල්ල ස්වභාවික විපත් සහ මානව ක්‍රියාකාරකම් නිසා සිදුවන උපද්‍රව ඇතුළු උවදුරු සහ අවදානම් කිහිපයකට මුහුණ දී සිටී. 3.1 සහ 3.2 වගු මගින් අවදානම් සහ උපද්‍රව සහ ඒවායේ හේතු සහ ස්වභාවික සහ මානව ක්‍රියාකාරකම් නිසා සිදුවන ලද අවදානම් හේතුවෙන් ඇල්ල ප්‍රදේශයේ සංචාරක ව්‍යාපාරයට ඇති කරන බලපෑම නිදර්ශනය කරයි.

### 3.1.1 ස්වභාවික උපද්‍රව සහ සංචාරක ව්‍යාපාරයට ඒවායේ බලපෑම් පිළිබඳ දළ විශ්ලේෂණය

*වගුව 3.1 ස්වභාවික උවදුරුවල අවදානම්, අවදානම් හේතු සහ බලපෑම් පිළිබඳ සාරාංශය*

| අවදානම | අවදානමට හේතුව | සංචාරක කර්මාන්තයට ඇති බලපෑම |
|---|---|---|
| **1. ජල විද්‍යාත්මක හා කාලගුණික උපද්‍රව** | | |
| I වායුගෝලයේ හරිතාගාර වායූන් වැඩි වීම සහ ගංගාවල ඛාදනය වැඩි වීම | • දේශගුණික විචල්‍යතාවය<br>• ජනවිකාස ප්‍රවණතා<br>• ඉඩම් ආවරණ වෙනස් කිරීම | වායුගෝලයේ හරිතාගාර වායූන් වැඩිවීම ගෝලීය උෂ්ණත්වය ඉහළ යාමට සහ ජල විද්‍යාත්මක චක්‍රය තිව්‍රකරණය වීමට දීර්ඝකාලීනව හේතු වනු ඇත.<br>මෙම උපද්‍රව හේතුවෙන් ප්‍රදේශයේ ආර්ථිකයට සැලකිය යුතු බලපෑමක් සහ සංචාරක ව්‍යාපාර කෙරෙහි සෘජු බලපෑමක් ඇති කළ හැකිය. |
| **2. භූ රූප විද්‍යාත්මක උපද්‍රව** | | |
| I නායයෑම් | • ඉතා බිඤෙෂන සුළු භූගෝලීය සැකැස්ම<br>• වන විනාශය<br>• ඉඩම් භායනය<br>• ප්රදේශයේ වේගවත් සංවර්ධනය | මිනිස් සමාජයට සෘජුවම බලපානු ලබයි<br>පවතින ගෝලීය දේශගුණික විපර්යාස හේතුවෙන් අනාගතයේ දී නායයෑම් බොහෝ විනාශයන්ඇති කළ හැකිය |
| II දේශගුණික විපර්යාස | • ඇල්ලේ උන්නතාංශය, භූ විෂමතාවය (කඳු, තැනිතලා, අද්විතීය සමමිතික සහ අසමමිතික) පිහිටීම මෙම දේශගුණික විපර්යාසවලට සෘජුවම බලපායි.<br>• 200 mm - 300 mm පමණ අධික වර්ෂාපතනයක් ඇල්ල ප්‍රදේශයේ මෙම ප්‍රවණතාවයට හේතු වේ | ඇල්ල ප්‍රදේශයට ඇදහැලෙන අධික වර්ෂාපතනය සංචාරක ව්‍යාපාරයට සහ ජනාවාසවලට ද අහිතකර ලෙස බලපායි.<br>එනිසාවෙන් දේශගුණය ගමනාන්තය තෝරාගැනීම සලකා බැලීම කෙරෙහි බෙහෙවින් බලපායි. |
| III පාංශු ඛාදනය | • නාය යෑම්<br>• භූමියේ ඉහළ ජල මට්ටම<br>• අධික වර්ෂාපතනය<br>• උමා ඔයේ බලපෑම නිසා ජල උල්පත් අතුරුදහන් වීම | පාංශු ඛාදනය හේතුවෙන් නගර ආශ්‍රිතව මඩ ගලා යයි. එය සංචාරකයන්ගේ පැමිණීම අඩුවීමට හේතු වේ |
| IV කඳු බෑවුම් | • උස් කඳුකර කලාපය අධික වෘක්ෂලතා සහ සත්ත්ව<br>• විශේෂ ඝනත්වය | ඇල්ල - වැල්ලවාය පාරේ ප්‍රපාතාකාර කඳු බෑවුම් රාශියක් ඇත. සමහර විට එය අමුත්තන්ට සහ ප්‍රාදේශීය ප්‍රජාවට භයානක අත්දැකීමක් හෝ වික්‍රමාන්විත අත්දැකීමක් ලබා දෙයි |
| **3. ජීව විද්‍යාත්මක උපද්‍රව** | | |
| I බැක්ටීරියා ක්‍රියාකාරීත්වය නිසා ජලය දූෂණය වීම | • ප්‍රදේශයේ වැසිකිලි භාවිතය ඉහළ මට්ටමක පවතී. ඊට සමගාමීව ඇල්ල ප්‍රදේශයේ නිසි අපද්‍රව්‍ය බැහැර කිරීමේ පද්ධතියක් නොමැතිවීම හේතුවෙන් ජල මූලාශ්‍ර බැක්ටීරියා සහ අසූචි වලින් දූෂණය වී ඇත. | විශේෂයෙන්ම ආපනශාලා ක්‍රියාකරුවන්, හෝම්ස්ටේ ක්‍රියාකරුවන්, නේවාසිකාගාර ක්‍රියාකරුවන් සහ දේශීය වෙළෙන්දන්ගේ සාප්පු වැනි කුඩා පරිමාණ සංචාරක සේවා සපයන්නන් සඳහා මෙන්ම සංචාරකයින්ට ද පානීය අවශ්‍යතා සඳහා පිරිසිදු ජලය සැපයීමට අවශ්‍ය බැවින්. |
| II වෘක්ෂලතා අහිමි වීම | • අධික වර්ෂාව නිසා ඇති වූ නාය යෑම්<br>• ලැව්ගිනි<br>• මානව ක්‍රියාකාරකම්<br>• අවිධිමත් කසළ බැහැර කිරීම | වර්තමානයේ, හරිත වෘක්ෂලතා අතරින් මතු වූ ගොඩනැගිලි ඉදිකිරීම් හේතුවෙන් මනරම් දර්ශන සියල්ලම පාහේ දැන් දෘශ්‍ය දූෂණයට ලක්ව ඇත. |

| | | | |
|---|---|---|---|
| | | • වගා කිරීම සඳහා ඉඩම් එළි පෙහෙළි කිරීම<br>• නීති විරෝධී/සැලසුම් නොකළ ඉදිකිරීම් | එබැවින් වෘක්ෂලතාදිය අහිමි වීම ස්වභාවික සුන්දරත්වය ක්‍රමයෙන් පිරිහීම සමඟ දිගු කාලීනව සංචාරක පැමිණීමේ අඩුවීමට හේතු විය හැක. |
| **4. පාරිසරික උවදුරු** | | | |
| I | ලැව් ගිණි | ලැව්ගිනි සඳහා මානව සහ ස්වභාවික සාධක යන දෙකම බලපායි.<br>ස්වභාවික අවස්ථා;<br>• උෂ්ණත්වය වැඩි වීම<br>• වියළි කාලගුණය<br>• වර්ෂාපතනය අඩු වීම<br>• ආර්ද්‍රතාවය<br>මානව ක්‍රියාකාරකම්;<br>• සිගරට් නොසැලකිලිමත් ලෙස වනාන්තරවලට විසි කිරීම,<br>• මිය ගිය තෘණ සුන්බුන් පිළිස්සීම<br>• සතුන් දඩයම් කිරීම<br>• වගාවන් සඳහා ගිනිතැබීම්<br>ලැව්ගිනි ඇතිවීමට බහුලවම හේතු වේ | පුංචි ශ්‍රී පාද කඳු මුදුනට සහ වෙනත් මංපෙත්වලින් කඳු නැගීමේ මාර්ගවල ගමන් කළ සංචාරකයින් ලැව් ගිනි දැකීමෙන් පලා ගිය සිදුවීම් කිහිපයක් මූලික වශයෙන් වාර්තා වී ඇත<br><br>ඇල්ලේ දර්ශනීය සුන්දරත්වයට කැළඹීමක් ඇති කරමින් ප්‍රදේශයේ වටිනා ජෛව විවිධත්වයට දැඩි ලෙස හානි වී ඇත<br><br>ලැව්ගිනි නිසියාකාරව පාලනය නොකළහොත් ඇල්ලේ දර්ශනීය සුන්දරත්වය විඳගැනීමේ මූලික අරමුණ වන ඇල්ලට සංචාරක පැමිණීම අඩුවීමට එය හේතු විය හැක |

## ජල විද්‍යාත්මක / කාලගුණික උපද්‍රව

### වායුගෝලයේ හරිතාගාර වායු වැඩි වීම සහ ගංගා ඛාදනය වැඩි වීම

ජල විද්‍යාත්මක හා කාලගුණ විද්‍යාත්මක උපද්‍රව අතරට ගංවතුර, නියඟ සහ භූගත ජලය දූෂණය සම්බන්ධ සිදුවීම් ඇතුළත් වේ. ජල විද්‍යාත්මක හා කාලගුණ විද්‍යාත්මක උපද්‍රව හේතුවෙන් නායයෑම් සහ ගංගා කැළඹීම් සහ තැන්පත්වීම් ද සිදුවේ.ජල විද්‍යාත්මක හා කාලගුණ විද්‍යාත්මක උපද්‍රව සහ ඒවායේ බලපෑම් ඇල්ල ප්‍රදේශයේ බහුලව දක්නට ලැබෙන දේශගුණික විචල්‍යතාවය, ජනවිකාස ප්‍රවණතා, භූමි ආවරණ වෙනස්වීම් සහ අනෙකුත් හේතු සාධක සමඟ සම්බන්ධ වේ.

වායුගෝලයේ හරිතාගාර වායූන් වැඩි වීම ගෝලීය උෂ්ණත්වය ඉහළ යාමට සහ ජල චක්‍රය තීව්‍ර කිරීමට අඛණ්ඩව හේතු වනු ඇත. ජල විද්‍යාත්මක හා කාලගුණ විද්‍යා උපද්‍රවයේ බලපෑම ඇල්ල ප්‍රදේශයට ස්ථානගත විය හැක හෝ පුළුල්ව පැතිර යා හැක. සමහර විට මෙම උපද්‍රව පුරෝකථනය කළ හැකි අතර, සමහර අවස්ථාවලදී ඒවා අනපේක්ෂිත විය හැකිය. අනතුරින් සිදුවන හානිය සිදුවීමේ බරපතලකම අනුව අවම සිට විශාල දක්වා පරාසයක පැවතිය හැකිය, ඒවා යටිතල පහසුකම් (ගොඩනැගිලි, මාර්ග, පාලම් සහ උපයෝගිතා) මත දිගුකාලීන බලපෑමක් ඇති කළ හැකිය. මෙම උපද්‍රව හේතුවෙන් ප්‍රදේශයේ ආර්ථිකයට සැලකිය යුතු බලපෑමක් සංචාරක ව්‍යාපාරයට සෘජු



බලපෑමක් ඇති කළ හැකිය. සමාජයට සහ එහි ආර්ථිකයට ජල විද්‍යාත්මක හා කාලගුණ විද්‍යාත්මක උපද්‍රවයන්ගේ අතිමහත් බලපෑම් නිසා, ජල විද්‍යාත්මක උපද්‍රව පුරෝකථනය කිරීම, වැළැක්වීම සහ අවම කිරීම සඳහා නව ප්‍රවේශයන්, ශිල්පීය ක්‍රම හෝ ක්‍රම සලකා බැලීම වැදගත් වේ.

## භූ රූප විද්‍යාත්මක උපද්‍රව

### නායයෑම්

ඇල්ල ආශ්‍රිත සංවේදී පරිසර ප්‍රදේශ කරා සංවර්ධන පීඩනය පැතිරීම මේ සඳහා ඇති ප්‍රධාන සාධකයයි. තවද, විනාශකාරී නාය යෑම් සිදුවීම ශ්‍රී ලංකාවේ ඇල්ල ප්‍රදේශයේ නිතර නිතර සිදුවෙමින් පවතින අතර එහි ප්‍රතිඵලයක් ලෙස, නායයෑම් සඳහා ගොදුරු වූවන් විශාල සංඛ්‍යාවක් වාර්තා වීම සහ සැලකිය යුතු සමාජ-ආර්ථික බලපෑම් ඇති වී තිබේ. ඉතා සංවේදී භූගෝලීය සැකැස්මක් මෙම තත්ත්වය ඇති කරයි. බණ්ඩාර සහ ජයසිංහ (2018) , එදිරිසූරිය (2019) විසින් එවැනි නායයෑම් සඳහා හේතු සොයාගෙන රජයේ බලධාරීන්ගේ සහ වෘත්තිකයන්ගේ සහාය ඇතිව අනුගමනය කළ හැකි නායයෑම් අවදානම් අවම කිරීමේ උපාය මාර්ග කිහිපයක් ඉදිරිපත් කර ඇත. මේවායින් බොහොමයක් මිනිස් සමාජයට සෘජුවම බලපායි. පවතින ගෝලීය දේශගුණික විපර්යාස

හේතුවෙන් අනාගතයේ දී නායයෑම් තවත් විනාශයක් ඇති කළ හැකිය. නාය යෑම් හේතුවෙන් බොහෝ ලෙන් වහලවල් (විවිධ ජනප්‍රවාදවලට සම්බන්ධ වන වනාන්තරවල ද දක්නට ලැබේ) තුනී වී ඇති අතර වැසි කාලවලදී ලෙන් දිය වෙමින් පවතී. එබැවින්, ඉහළ අවදානම් විභවයන් සහිත නායයෑම් අවදානම් ප්‍රදේශ හඳුනා ගැනීම සහ අවදානම අවම කිරීම සඳහා නිසි හා ඵලදායී නායයෑම් අවම කිරීමේ මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය ප්‍රමුඛ අවශ්‍යතාවයක් බවට පත්ව ඇත. තවද භූ රූප විද්‍යාත්මක උපද්‍රව ස්වභාවික හෝ මානව ක්‍රියාකාරකම් නිසා ඇති විය හැක. මානව ක්‍රියාකාරකම් ද ඇල්ල නගරය තුළ කාර්මීකරණය හා ඉඩම් පරිහරණ වෙනස්වීම් තුළින් පරිසරයට සහ භූ දර්ශනයට විශාල බලපෑමක් ඇති කර ඇති අතර එය දේශගුණික විපර්යාසවලට ද හේතු වී ඇත. වනාන්තර විනාශය සහ ඉඩම් හායනය මිනිස් ජීවනෝපාය කෙරෙහි ඉහළ බලපෑමක් ඇති කරයි. පාංශු ඛාදනය සහ නාය යෑම් වැනි භූ රූප විද්‍යාත්මක උපද්‍රව ඇතිවීමට වන විනාශයේ සහ ගොඩබිමේ බලපෑම දැඩි ලෙස සම්බන්ධ වේ.

### දේශගුණික විපර්යාස

විවිධ හැඩතල සහිත කඳු, තැනිතලා සහ අනන්‍ය සමමිතික සහ අසමමිතික වැනි පිහිටීමේ භූ විෂමතාවය ඇල්ල වෙත වැඩි සංචාරකයින් ආකර්ෂණය කර ගැනීම සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ඇල්ලේ උන්නතාංශය දේශගුණික විපර්යාස කෙරෙහි සෘජුවම බලපාන අතර එය හොඳම භූ සංචාරක ගමනාන්තය ලෙස ඇල්ල හඳුනා ගැනීමට ප්‍රධාන හේතුව වේ. ඇල්ල සහ ඒ අවට ප්‍රදේශය සුවපහසු උෂ්ණත්වයක් සහ වර්ෂාපතනයක් සහිත කදිම දේශගුණයක් ඇති අතර එමගින් සංචාරක පැමිණීමද වැඩි වේ. කෙසේ වෙතත්, මිලිමීටර් 200-300 ට වැඩි අධික වර්ෂාපතනයක් ඇල්ල ප්‍රදේශයට විශාල අවදානමක් ඇති කරයි. ඇල්ල ප්‍රදේශයේ වාර්තාගත ආර්ද්‍රතා මට්ටම සියයට 74 ක් වන අතර එය මිනිස් ජනාවාස සඳහා වඩාත් සුවපහසු ආර්ද්‍රතා මට්ටම ලෙස පිළිගැනේ.

### පාංශු ඛාදනය

නාය යෑම් සහ පාංශු ඛාදනය හේතුවෙන් නගර ආශ්‍රිතව මඩ ගලායාමක් ද දක්නට ලැබේ. එය සංචාරකයින්ගේ ආකර්ෂණ ස්ථාන කෙරෙහි ද අහිතකර ලෙස බලපායි. ඇල්ල යනු එක් ජල පෝෂක ගමනාන්තයකි. උමා ඔයේ (ගඟේ) බලපෑම හේතුවෙන් ජල උල්පත් අතුරුදහන් වීම මෑතක දී සිදු වූ අතර එය ප්‍රජාවගේ ජීවනෝපායට සෘජුවම බලපායි. භූ විද්‍යාඥයින්ගේ අදහස වී ඇත්තේ මෙම ප්‍රදේශයේ භූගත ජල මට්ටම පහත බැස ඇති බවයි. මේවා ඇල්ල තුළ සිදුවන භූ රූප විද්‍යාත්මක උපද්‍රවයන්ය. මෙම භූ රූප විද්‍යාත්මක සිදුවීම් ස්වාභාවික විපත් බවට පරිවර්තනය වීම මිනිස් ජීවනෝපායට සමගාමීව සිදු විය. පාංශු ඛාදනය නිසා වෘක්ෂලතාදිය ද අඩු වේ. මිනිස් ජීවිත සහ දේපළ දැඩි අවදානමකට ලක්ව ඇති අතර, අවසානයේදී මෙම ප්‍රදේශයේ සංචාරක කර්මාන්තයට විශේෂයෙන් බලපානු ලබයි (ජයසිංහ සහ වෙනත් අය, 2015).

### බෑවුම් සහිත කඳු

ඇල්ල යනු ශ්‍රී ලංකාවේ කඳුකර ප්‍රදේශයේ උස නගරයකි. විවිධ වෘක්ෂලතා සහ සත්ත්ව විශේෂ සහිත කඳු බෑවුම් ඇත. එමෙන්ම, ඇල්ලට ගමන් කරන විට මීදුමෙන් වට වූ කඳු මුදුන් හමුවේ. තවද, ඇල්ල-වැල්ලවාය මාර්ගයේ බොහෝ බෑවුම් සහිත ගල්පර පිහිටා ඇත. සමහර විට එය අමුත්තන්ට සහ ප්‍රාදේශීය ප්‍රජාවට භයානක අත්දැකීමක් හෝ වික්‍රමාන්විත අත්දැකීමක් ලබා දෙයි.

### අනපේක්ෂිත ලෙස දිය ඇලි වල ජල මට්ටම ඉහල යාම (රාවණා ඇල්ල, කිතල් ඇල්ල, ආදිය)

ඇල්ල අවට ප්‍රකට දිය ඇලි රාශියක් ඇති අතර ඒවා බොහෝ සංචාරකයින් සඳහා ප්‍රධාන ආකර්ෂණයන් බවට පත්ව ඇත. වර්ෂාව ඇති විට, ඕනෑම ස්ථානයක ශක්තිමත් විශාල ජල ධාරාවක් සෑදිය හැක, තත්පර කිහිපයකින් එය මාර්ගයේ ඕනෑම දෙයක් අතුගා දමයි. දිය ඇලි වල ජල මට්ටම හදිසියේ වැඩිවීම නිසා බොහෝ දෙනෙකුට ජීවිත අහිමි වී ඇත (Jayne, 2021). ඇල්ලේ රාවණා දිය ඇල්ල ශ්‍රී ලංකාවේ ජනප්‍රිය දියඇලි වලින් එකක් වන අතර එය ඇල්ලේ ප්‍රධාන ආකර්ෂණයන්ගෙන් එකකි. කෙසේ වෙතත් අනපේක්ෂිත ලෙස කඳුකරයේ අනෙක් පසට ඇද හැලෙන අධික වර්ෂාවත් සමඟ රාවණා දිය ඇල්ලේ ජල මට්ටම ඉහළ ගොස් විනාඩි කිහිපයක් ඇතුළත දිය ඇල්ල රස විඳිමින් සිටින අවට අමුත්තන්ට විශාල තර්ජනයක් ඇති කරමින් දිය ඇල්ල ආක්‍රමණශීලී දිය ඇල්ලක් බවට පත්වේ . නමුත් මේ වන විට මෙම, අවදානම සඳහන් කිරීමට නිසි පුවරු නොමැත.

### පරිසර දූෂණය

ඇල්ල ප්‍රදේශයේ සංචාරක ක්‍රියාකාරකම් හේතුවෙන් ඇති වන ප්‍රමුඛතම අවදානමක් ලෙස පරිසර දූෂණය සැලකිය හැකිය. දුර්වල අපද්‍රව්‍ය කළමනාකරණය ජල දූෂණය, වායු දූෂණය සහ ප්‍රදේශයේ දර්ශනීය සුන්දරත්වය පිරිහීම වැනි දැඩි පාරිසරික ගැටලු රාශියකට හේතු වී ඇත (එදිරිසූරිය, 2019). බොහෝ හෝටල් සහ ආපනශාලා අපජලය අවිධිමත් ලෙස ස්වභාවික ජල මූලාශ්‍ර වෙත මුදාහරියි. පරිසර බලධාරීන්ට අනුව, මෙම අවිධිමත් කසළ බැහැර කිරීම් හේතුවෙන් ජලයේ pH අගය මෑතකදී එහි පහත වැටීමට හේතු වී ඇත (ශාමිනි සහ බන්දුසේන, 2020).

ක්ෂේත්‍ර චාරිකාව - ඇල්ල

පාංශු ඛාදනය



කඳු බෑවුම්







ගල් පෙරළීම්



නායයෑම්

## ජීව විද්‍යාත්මක උපද්‍රව

### බැක්ටීරියා ක්‍රියාකාරීත්වය නිසා ජලය දූෂණය වීම

ඇල්ල යනු ඉහළ සංචාරක ඝනත්වයක් ඇති භූගෝලීය ප්‍රදේශයක් බැවින් ආහාර පාන පරිභෝජනය ඉතා ඉහළ මට්ටමක පවතී. මේ නිසා ප්‍රදේශයේ වැසිකිළි භාවිතය ඉහළ ගොස් ඇත. ඊට සමගාමීව ඇල්ල ප්‍රදේශයේ නිසි අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතියක් නොමැතිවීම හේතුවෙන් ජල මූලාශ්‍ර බැක්ටීරියා සහ මළපහ වලින් දූෂණය වී ඇත. භූගත ජලය බැක්ටීරියා දූෂණය වීම හේතුවෙන් බොහෝ භූගත ජල මූලාශ්‍ර අපිරිසිදු වී ඇති බැවින් ප්‍රදේශවාසීන් පානීය ජලය සොයා ගැනීමේ දුෂ්කරතාවයන්ට මුහුණ දී සිටිති.

### වෘක්ෂලතා අහිමි වීම

ඇල්ල පරිසර සංවේදී ප්‍රදේශයක පිහිටා ඇති අතර කිනිගම වන රක්ෂිතය, පයින් වනාන්තර, ඇල්ල ප්‍රපාතය සහ රාවණා අභයභූමිය පැවතීම හේතුවෙන් එය අද්විතීය ජෛව විවිධත්වයෙන් (වෘක්ෂලතා හා සත්ත්ව විශේෂ) පොහොසත් වේ. කෙසේ වෙතත්, ඇල්ලේ වෘක්ෂලතා අහිමි වීම සඳහා ස්වභාවික සාධක සහ මිනිස් ක්‍රියාකාරකම් යන දෙකම අහිතකර ලෙස බලපායි. අධික වර්ෂාව නිසා ඇති වන නාය යෑම්, ලැව්ගිනි සහ කැළිකසළ බැහැර කිරීම, වගා කිරීමට ඉඩම් එළි කිරීම, අනවසර/සැලසුම් නොකළ ඉදිකිරීම් ආදී මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් ඇල්ල ප්‍රදේශයේ වෘක්ෂලතාදිය විනාශ වී යයි. සංචාරකයින්ගෙන් 30% ක් ඇල්ල නැරඹීමට පැමිණෙන්නේ එහි ඇති ස්වභාවික පාරිසරික සුන්දරත්වය නිසා බව අනාවරණය වී ඇත. එබැවින් වෘක්ෂලතාදිය අහිමි වීම දිගුකාලීනව සංචාරක පැමිණීම අඩුවීමට හේතු විය හැක.

### බැර ලෝහ එකතු වීම

ඇල්ල ප්‍රදේශයේ වැසිකිළි බිත්ති සහ අත්තිවාරම් ඉදිකිරීමේදී බල්බ සහ බැටරි භාවිත කර ඇති බව හඳුනාගෙන ඇත. මෙම අයිතමවල බැර ලෝහ අඩංගු වන අතර මිනිසුන්ට සහ සතුන්ට සෞඛ්‍ය අවදානම් ඇති කළ හැකිය. විශේෂයෙන්, මෙම බැර ලෝහ භූගත ජලය සමඟ ස්පර්ශ වුවහොත්, එය බරපතල සෞඛ්‍ය තර්ජන ඇති කරන අතර ජලයේ ච්‍ය මට්ටමේ වෙනස්වීම් ද ඇති කරයි.

## පාරිසරික උවදුරු

### ලැව් ගිනි

ඇල්ල එහි දර්ශනීය සුන්දරත්වය සඳහා බෙහෙවින් ජනප්‍රිය වන අතර එහි ස්වාභාවික වෘක්ෂලතාදිය, සහ අවට කඳු වැටි එයට වටිනාකමක් එක් කරයි. කෙසේ වෙතත්, ලැව්ගිනි විශාල පාරිසරික අනතුරක් බවට පත් වී ඇති අතර එමගින් සංචාරක ක්‍රියාකාරකම්වලට බලපායි. ලැව්ගිනි ඇතිවීමට මානව සහ ස්වභාවික සාධක යන කරුණු දෙකම බලපායි. පෙර පර්යේෂණ සොයාගැනීම් සහ කණ්ඩායම් සාකච්ඡා හෙළිදරව් කිරීම් අනුව; උෂ්ණත්වය වැඩිවීම, වියළි කාලගුණය, අඩු වර්ෂාපතනය සහ ආර්ද්‍රතාවය වැනි ස්වභාවික අවස්ථා මෙන්ම නොසැලකිලිමත් ලෙස සිගරට් යනාදිය වනාන්තරවලට විසි කිරීම, මිය ගිය තණකොළ සුන්බුන් පුළුස්සා දැමීම, සතුන් දඩයම් කිරීම, වගාවන් සඳහා ගිනි තැබීම් වැනි මානව ක්‍රියාකාරකම් ලැව් ගිනි සඳහා නිතර නිතර හේතු වේ (බණ්ඩාර සහ වෙනත්, 2019; සඳමාලි සහ චතුරංග, 2021). පුංචි ශ්‍රී පාද කඳු මුදුනට සහ වෙනත් මංපෙත්වලින් කඳු නැගීමේ මාර්ගවල ගමන් කළ සංචාරකයින් ලැව් ගිනි දැකීමෙන් පලා ගිය සිදුවීම් කිහිපයක් මුලික වශයෙන් වාර්තා වී ඇත. අනෙක් අතට, ඇල්ලේ දර්ශනීය සුන්දරත්වයට බාධා ඇති කරමින් ප්‍රදේශයේ වටිනා ජෛව විවිධත්වයට දැඩි හානි සිදු වේ. ලැව්ගිනි නිසියාකාරව පාලනය නොකළහොත් ඇල්ලේ දර්ශනීය සුන්දරත්වය විඳගැනීම මූලික අරමුණ වන ඇල්ලට සංචාරකයින් පැමිණීම අඩුවීමට හේතු විය හැක.



## 3.1.2 මානව ක්‍රියාකාරකම් නිසා සිදුවන උපද්‍රව සහ සංචාරක ව්‍යාපාරයට ඒවායේ බලපෑම පිළිබඳ දළ විශ්ලේෂණය

*වගුව 3.2 මිනිසා විසින් සාදන ලද උපද්‍රවවල අවදානම්, අවදානම් හේතු සහ බලපෑම් පිළිබඳ සාරාංශය*

| | අවදානම | අවදානමට හේතුව | සංචාරක කර්මාන්තයට ඇති බලපෑම |
|---|---|---|---|
| **1. දේශපාලන අවදානම්** | | | |
| I | රජයේ අස්ථාවරත්වය සහ නීති සහ ප්‍රතිපත්ති සහ රෙගුලාසි රජයේ බලපෑම නොමැත | • ඇල්ල සංචාරක අංශ පිළිබඳ රජයේ අධීක්ෂණයක් නොමැතිකම<br>• රජයේ සංවර්ධන උපාය මාර්ග නිතර වෙනස් කිරීම | නීති විරෝධී කොන්දේසි හරහා ව්‍යාපාරයේ කෙටි මාර්ග/ ක්‍රම අත්හදා බැලීමෙන් පසු, ප්‍රජා ජනතාව ව්‍යාපාර මෙහෙයුම් නීතිගත කිරීමට පසුබට වෙති. |
| II | පාර්ශවකරුවන් අතර අභ්‍යන්තර ගැටුම් | • විවිධ පාර්ශවකරුවන්ට ඔවුන්ගේම අවශ්‍යතා ඇත | කාර්යක්ෂමතාව අඩු වීම<br>සාමූහික තීරණ ගැනීමේ ගැටළු |
| III | දූෂණය | • අඩු මට්ටමේ ප්‍රජාතන්ත්‍රවාදය, දුර්වල සිවිල් සහභාගීත්වය සහ අඩු දේශපාලන විනිවිදභාවය අකාර්යක්ෂම පරිපාලන ව්‍යුහයන් අඩු ආර්ථික නිදහස | අසමානතාවය වැඩි වීම සහ දේශපාලන ප්‍රතිචාර දැක්වීම අඩු වීම<br>සමාජයේ පුරවැසියන් අතර කලකිරීම<br>සංචාරක මෙහෙයුම් සඳහා ගමනාන්තය තුළ අහිතකර තත්ත්වයක් ඇති කිරීම |
| **2. මූල්‍ය අවදානම්** | | | |
| I | රජයේ බදු ආදායම අහිමි වීම | • ඇල්ලේ ලියාපදිංචි නොකළ සංචාරක ව්‍යාපාරවලින් ඉහළ ප්‍රතිශතයක් පැවතීම<br>• යල් පැන ගිය නීති රීති | බදු ආදායම රජයට අහිමි වීම<br>පළාත් පාලන ආයතනවල අඩු ආදායම් උත්පාදනය |
| II | ණය සහ කාරක ප්‍රාග්ධනය ගැටලු | • COVID-19 වසංගතයේ බලපෑම | ණය ගැතියන් විසින් ණය ආපසු ගෙවීමට අපොහොසත් වීම<br>කාරක ප්‍රාග්ධන ගැටළු<br>අලුතින් ව්‍යාපාර සඳහා ආයෝජනය කිරීමේ දුෂ්කරතා |
| III | COVID -19 හේතුවෙන් මූල්‍ය අවදානම | • සංචාරක ඉල්ලුම නොමැතිකම නිසා ව්‍යාපාර කටයුතු අත්හිටුවීම | කුඩා පරිමාණ සංචාරක ව්‍යවසායකයින් ඔවුන්ගේ ණය ආපසු ගෙවීමට අපොහොසත් වීම සහ කාරක ප්‍රාග්ධන ගැටළු වැනි විවිධ මූල්‍ය අවදානම් වලින් පීඩා විඳිති.<br>ඇල්ල ප්‍රදේශයේ සංචාරක ව්‍යාපාරයේ හිඩැසක් ඇති කරමින් කුඩා පරිමාණ සංචාරක ව්‍යාපාර බොහොමයක් සිය මෙහෙයුම් තාවකාලිකව අත්හිටුවා ඇත. |
| IV | ප්‍රමාණවත් නොවන සහ යල් පැන ගිය මූල්‍ය නීති රීති හේතුවෙන් නව ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීමේ අභියෝගය | • ඇල්ල සංචාරක කර්මාන්තයේ තිරසාර සංවර්ධනයට නිසි ප්‍රධාන සැලැස්මක් නොමැති වීම | ඇල්ල ප්‍රදේශයේ සංචාරක ව්‍යාපාරයේ තිරසාර වර්ධනයට සහයෝගයක් නොමැතිකම<br>සංචාරක ව්‍යාපාර සඳහා ආයෝජකයින් නොමැතිකම |
| V | ගමනාන්තයේ උද්ධමනය සහ ඉඩම් මිල වැඩි වීම | • ඉඩම් හිමියන් විසින් ඉඩම් සඳහා ප්‍රමිතියකින් තොරව මිල ගණන් ඉහළ දැමීම | අවට ගම්මානවලට වඩා ඇල්ලේ සෑම දෙයක්ම ඇල්ලෙහි වාසය කරන්නන්ට ඉතා මිල අධික වීම |

| | | | |
|---|---|---|---|
| | | • සංචාරක සැපයුම්කරුවන් අතර ඉහළ තරඟයක් පැවතීම | ඇල්ල ප්‍රදේශයේ ඉඩම් දේශීය ව්‍යාපාරිකයන්ට දැරිය නොහැකි වන අතර මේ ඉඩම් දැන් සංක්‍රමණිකයන් සතුය. එබැවින් ප්රජාව සහ සංක්රමණිකයන් අතර ගැටුම් ඇති වනු ඇත |

## 3. සමාජ අවදානම්

| | | | |
|---|---|---|---|
| I | මත්ද්‍රව්‍ය සහ මත්පැන් අනිසි භාවිතය | • සංචාරකයින් අතර මත්ද්‍රව්‍ය සහ මධ්‍යසාර සඳහා ඉහළ ඉල්ලුමක් පැවතීම<br>• විරැකියාව සහ පවුල් ප්‍රශ්න වල සංකලනයක ප්‍රතිඵලයක් ලෙස අධික ආතතිය<br>• ඇල්ලේ සංවර්ධන වෙනස්කම් | මත්ද්‍රව්‍ය භාවිතයට පාසල් සිසුන් සම්බන්ධ කර ගැනීම<br>ප්‍රාදේශීය ප්‍රචණ්ඩත්වයට හේතු වීම<br>සංචාරකයින්ට මානසික වශයෙන් බලපෑම් ඇති වීම |
| II | ලිංගිකව සම්ප්‍රේෂණය වන | • HIV සහ වෙනත් ලිංගාශ්‍රිත රෝග ව්‍යාප්තිය වැඩි රටවල් සහ ජනගහන කණ්ඩායම් වලින් ඇල්ලට සංචාර වැඩි වීම<br>• ස්වදේශිකයන් විසින් විදේශිකයන් සමග සමීප අන්තර් සබඳතාවයක් සහ මිත්‍රත්වයක් ගොඩනගා ගැනීමට උත්සාහ කිරීම<br>• විදේශිකයන් සමග මුදල් පදනම් කරගත් සබඳතා (ආර්ථික බලය අනුව අසමානතාවය) | ප්‍රදේශයේ ප්‍රජාව සහ දරුවන් අතර රෝගය පැතිර යා හැක<br>විෂබීජහරණය කළ විදේශිකයන් ලිංගාශ්‍රිත රෝගවලට ගොදුරු විය හැක |
| III | සංස්කෘතික පරිහානිය | • දේශීය කාන්තාවන්, පිරිමින් සහ ළමයින් පවා විදේශීය සංස්කෘතිය අනුකරණය කිරීමට උත්සාහ කරයි<br>• විදේශිකයන්ගේ ප්‍රදේශය තුලට අයථා ප්‍රවේශය | ආසංස්කෘතිකරණ බලපෑම්<br>සංස්කෘතික භාණ්ඩකරණය<br>දෙමුහුන් සංස්කෘතිය |
| IV | ප්‍රදේශවාසීන්ගේ ජීවන රටාව වෙනස් කිරීම | • බටහිර සම්ප්‍රදාය අනුකරණය කිරීම<br>• වතුකරයේ වතු වගාවල නිරත වූ ප්‍රදේශවාසීන් සාම්ප්‍රදායික වතු වගාවන් වලින් ඉවත් වීම<br>• හෝම්ස්ටේ ක්‍රියාත්මක වීම නිසා නිවෙස්වල පෞද්ගලිකත්වය නැති වී පවුල් ඒකක කඩා වැටී ඇත | මිනිසුන්ගේ භාෂාව දියුණු වීම<br>දෙමාපියන්, දරුවන්න්ගේ අධ්‍යාපනය පසුපස පමණක් හඹා යාම |
| V | සෞඛ්‍යයට අහිතකර ආහාර රටා | • සෞඛ්‍ය සම්පන්න ආහාරවල සිට කෘතිම ආහාර දක්වා ගමන් කිරීම<br>• බටහිර සංස්කෘතිය අනුකරණය කිරීම | කුඩා වයසේ දරුවන් පවා දියවැඩියා රෝගීන්ගෙන් පීඩා විඳිති<br>විවිධ බෝ නොවන රෝග වැඩි වීම |
| VI | අවිධිමත් කසල කළමනාකරණය හේතුවෙන් බෝවන රෝග | • අවිධිමත් කසල කළමනාකරණය<br>• ඇල්ල හරහා හතු පිපෙන්නාක් මෙන් ආපන ශාලා සහ හෝටල් ඉදිකිරීම් රැසක් සිදුවෙමින් පැවතීම්<br>• ඇල්ලේ සැලසුම් නොකළ ඉදිකිරීම් | වටපිටාව අපිරිසිදු වීම<br>ඩෙංගු උණ පැතිරීම<br>විෂ සහිත පැතිරීම |
| VII | අධ්‍යාපනය කෙරෙහි ඇති අඩු නැඹුරුව | • සැලකිය යුතු මට්ටමේ සිසුන් ඔවුන්ගේ කුඩා කාලයේ සිටම ආකර්ෂණීය ස්ථාන නැරඹීමට සහ සංචාරකයින් සමග ගමන් කිරීමට පටන් ගෙන ඇත<br>• ඇල්ල ප්‍රදේශයේ සංචාරක ව්‍යාපාරයට සම්බන්ධ රැකියා ඕනෑ තරම් තිබෙන බව ඇතැම් දෙමාපියන්ගේ අදහසයි | රැකියා අනාරක්ෂිත බව<br>අඩු ආදායම<br>තරුණයින්ගේ උපරිම ඵලදායිතාව සහ භාවිතය ලබා ගත නොහැකි වීම |

| | | | |
|---|---|---|---|
| VII | සංචාරක කර්මාන්තය මත පමණක් අධික ලෙස යැපීම | • ඔවුන්ගේ සාම්ප්‍රදායික කෘෂිකාර්මික ව්‍යාපාරවලට වඩා හොඳ ආදායමක් උපයා ගැනීමේ හැකියාව<br>• ඇල්ල මෑතක සිට විශේෂයෙන් යුරෝපීයයන් අතර ප්‍රසිද්ධ සංචාරක ගමනාන්තයක් බවට පත් වූ අතර එය සංචාරක ගමනාන්තයක් ලෙස ගැසට් කර ඇත | දුෂ්කර තත්වයන් තුළ රැකියා අනාරක්ෂිත භාවය ඇති විය (උදා: COVID-19, ආර්ථික අර්බුදය) |

## 4. පාරිසරික අවදානම්

| | | | |
|---|---|---|---|
| I | අවිධිමත් කසල කළමනාකරණය | • නිසි උපාය මාර්ග අනුගමනය නොකිරීම<br>කසළ කළමනාකරණය සඳහා<br>• නිසි ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි නොමැති වීම | ඇල්ල නගරය පුරා දුර්ගන්ධයක් පැතිරීම නිසා ඇල්ලේ පිරිසිදු ඔක්සිජන් ඇති බවට විශ්වාස කිරීම නිසා හොඳ වාතය සඳහා ඇල්ලට පැමිණෙන සංචාරකයන් තුළ සැකයක් ඇති කරයි<br>පසුගිය වසර කිහිපය තුළ සංචාරක පැමිණීම්, ජන ඝනත්වය සහ ඇල්ල ප්‍රදේශයේ හෝටල්, ආපනශාලා සහ අනෙකුත් සේවා සපයන්නන් වැනි සංචාරක ආයතන සංඛ්‍යාව වේගයෙන් ඉහළ යමින් පවතී<br>ඇල්ල-බණ්ඩාරවෙල ප්‍රධාන මාර්ගය හරහා දිවෙන විවෘත කාණුවලට මෙන්ම කුඩා ජලධාරාවලටත් අපජලය සෘජුව මුදාහැරීම |
| II | නිසි ජලාපවහන පද්ධතියක් නොමැතිකම | • කාණු එකිනෙකට සම්බන්ධ නොවේ<br>• මිනිසුන් අපද්‍රව්‍ය විවෘත ජලාපවහනවලට විසි කරන අතර එමගින් ජලාපවහන පද්ධති අවහිර වේ.<br>• වැසි ජල අපවහන පද්ධතියක් නොවීම | මෙම අපිරිසිදු වාතාවරණය සහ විවෘත ජලාපවහනය හේතුවෙන් ඇතැම් ප්‍රදේශවල අප්‍රසන්න පරිසරයක් නිර්මාණය වී ඇති අතර මදුරුවන්, මැස්සන් සහ අනෙකුත් කෘමීන් බෝවීම ඉහළ ගොස් තිබේ |



| | | | |
|---|---|---|---|
| III | ජල උල්පත් අතුරුදහන් වීම | • උමා ඔය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා හේතුවෙන් | හදිසි ගංවතුර, වාරිමාර්ග සඳහා ජල හිඟය, පරිසර දූෂණය සහ ගෘහස්ථ අවශ්‍යතා සඳහා ජල මූලාශ්‍ර ලෙස භාවිතා කරන උල්පත් සිඳී යාම හේතුවෙන් ජල හිඟය<br>ගම් කිහිපයක නිවෙස්වලට බීමට හෝ කෘෂිකර්මාන්තයට මතුපිට ජලය නොමැති වීම |

## 5. වෙනත් අවදානම්

| | | | |
|---|---|---|---|
| I | සැලසුම් නොකළ සහ අසංවිධානාත්මක යටිතල පහසුකම් | • යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රජයේ ආයෝජන නොමැතිකම | ඇල්ල ප්‍රදේශයේ අනාරක්ෂිත මාර්ග හේතුවෙන් අනතුරු සිදුවීමේ හැකියාවක් පවතී<br>අනාරක්ෂිත මාර්ග හේතුවෙන් සංචාරකයින් ගමනාන්තය අනාරක්ෂිත ස්ථානයක් ලෙස නම් කළ හැකි අතර එය දේශීය හා ගෝලීය වශයෙන් ගමනාන්ත ප්‍රතිරූපයට අහිතකර ලෙස බලපානු ඇත |
| II | සංචාරක නිෂ්පාදන සහ සේවාවන් සඳහා ඇති සංචාරක ආකර්ෂණය සහ ඉල්ලුම නැතිවීම | • සංචාරක නිෂ්පාදන හා සේවා සඳහා ගුණාත්මක ප්‍රමිතීන් නොමැතිකම<br>• තිරසාර සංකල්ප සමඟ ඉදිරියට යාමේදී නිසි පරිපාලන ව්‍යුහයක් සහ ප්‍රතිපත්ති නොමැත | ඇල්ල ප්‍රදේශයේ පිරිනමන සේවා සහ නිෂ්පාදන පරාසයන්හි තත්ත්ව ප්‍රමිතීන් කෙරෙහි සෘණාත්මක බලපෑම් ඇතිවීම සංචාරකයින්ගේ මිලදී ගැනීමේ කොන්දේසි මෙන්ම පරිභෝජන හැසිරීම් වල හැසිරීම කෙරෙහි බලපානු ඇත<br>එය තිරසාර හැසිරීම් රටා තුළ සිටින සංචාරකයින් නොමඟ යවනු ඇත. තවද ඇල්ල මෙහෙයුම් පද්ධති ගැන ප්‍රශ්න කිරීමේ හැකියාවක් ඇත |

## රජයේ අස්ථාවරත්වය සහ නීති සහ ප්‍රතිපත්ති සහ රෙගුලාසි නිර්මාණය කිරීමේදී රජයේ බලපෑම නොමැතිකම

හඳුනාගෙන ඇති පරිදි, ගමනාන්තයට උරුම වූ සියලු දුර්වලතා නොතකා ගමනාන්තයට පැමිණීමේ සංචාරක ප්‍රවණතාව ලබා ගැනීමට ඇල්ල තවමත් සමත් වී ඇත. එහෙත්, අනාගත සංරක්ෂණය සඳහා ගමනාන්තයක් ලෙස ඇල්ල සුරැකීම සඳහා අවදානම් ඔරොත්තු දීමේ වැඩසටහන් කෙරෙහි අවධානය යොමු කිරීම ඉතා අවශ්‍ය වේ. මානව ක්‍රියාකාරකම් නිසා සිදුවන උපද්‍රවයන් ගැන සඳහන් කරන විට, දේශපාලන අවදානම් ප්‍රධාන අවධානයට ලක් වේ. රජයේ අස්ථාවරත්වය හේතුවෙන් ගමනාන්ත සංවර්ධනය සඳහා ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතනයට ඇත්තේ ඉතා සීමිත දායකත්වයක් පමණක් බවත් එහි ප්‍රතිඵලයක් ලෙස ජනතාව නීතිවිරෝධී ක්‍රියාකාරකම්වලින් පවා තම එදිනෙදා කටයුතු කරගෙන යාමට පුරුදුව ඇතිබව බව එකතු කරන ලද දත්ත මගින් පැහැදිලි කර ඇත. ඇල්ල ප්‍රදේශය ආශ්‍රිත අනවසර ඉදිකිරීම්වලට එරෙහිව නීති හෝ ප්‍රතිපත්ති සැකසීමට දේශපාලන සහාය නොමැතිකම හේතුවෙන් අනවසර ඉදිකිරීම් (නිවාස, ආපන ශාලා, ලැගුම්හල්) වර්ධනය වී ඇති අතර නාය යෑම් වැනි ස්වභාවික උවදුරුද මේ වන විට සිදුවීමේ ප්‍රවණතාවක් පවතී. එබැවින්, රජයේ ප්‍රතිපත්ති සම්පාදනය සහ සහයෝගය නොමැතිකම සෑම තත්ත්ව සාධකයක් තුළම ගමනාන්තයේ සංවර්ධනය සඳහා අවදානමක් වී ඇත (ජලාපවහන පද්ධතිය, අපද්‍රව්‍ය බැහැර කිරීම යනාදිය සඳහා).

## සම්බාහන මධ්‍යස්ථානවල ප්‍රමිතීන් නොමැතිකම

තවද ඇල්ල ප්‍රදේශය ආශ්‍රිතව සම්බාහන මධ්‍යස්ථාන ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරන අතර දැනට සක්‍රියව ක්‍රියාත්මක වන සම්බාහන මධ්‍යස්ථාන 50ක් පවතින බව හඳුනාගෙන ඇත. එහෙත් ඇල්ල ප්‍රදේශය ආශ්‍රිතව සම්බාහන සංචාරක ව්‍යාපාරය දියුණු කිරීමේ කාර්යය අදාළ බලධාරීන්ට පැවරීමට නිසි ව්‍යවස්ථාදායක ආයතනයක් නොමැත. ඇල්ල ප්‍රදේශයේ දැනට නිපදවා ඇති සම්බාහන මධ්‍යස්ථාන නිසි ප්‍රමිතීන්ට අනුකූලව ක්‍රියාත්මක නොවීම නිසා මෙය සංචාරකයන්ගේ සංචාරයේ අඩුවකට හේතු විය හැකි අවදානමකි. මෙය සම්බාහන මධ්‍යස්ථානවල ගුණාත්මක අත්දැකීමක් ලබා නොදීම පිළිබඳ සංචාරක පැමිණිලිවලට බලපානු ඇත. එබැවින් රජයට නීති සහ ප්‍රතිපත්ති නියාමනය කිරීමට සිදුවනු ඇති අතර එහි අපේක්ෂිත වටිනාකම් සහිත සම්බාහන මධ්‍යස්ථාන පැවැත්වීම සඳහා බලයලත් පුද්ගලයින් පත් කිරීමට සිදුවනු ඇත.

## පාර්ශවකරුවන් අතර අභ්‍යන්තර ගැටුම්

රජය, සැපයුම්කරුවන්, හෝටල් හිමිකරුවන්, ගනුදෙනුකරුවන්, සේවකයින් සහ කළමනාකරණ අධිකාරීන් වැනි විවිධ පාර්ශ්වකරුවන් සංචාරක මෙහෙයුම්වලට සම්බන්ධ වේ. කෙසේ වෙතත්, මෙම පාර්ශවකරුවන්ට ඔවුන්ගේම අවශ්‍යතා සහ අරමුණු ඇත. එබැවින් පාර්ශ්වකරුවන් අතර අභ්‍යන්තර ගැටුම් ඇති වන අතර එය මෙහෙයුම්වල අකාර්යක්ෂමතාව සහ සාමූහික තීරණ ගැනීමේ ගැටලු ඇති කරයි.

## දූෂණය

ශ්‍රී ලංකාවේ දේශපාලන දූෂණය ඇල්ල ප්‍රදේශයේ සංචාරක මෙහෙයුම් වලදී ඉහළ අවදානමක් ඇති කරයි. දූෂණ සංජානන දර්ශකයට (Corruption Perception Index) අනුව ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් විසින් වාර්තා සඳහන් කරන ලද පරිදි, 2021 දී ශ්‍රී ලංකාව අඩුම දූෂිත රටවල් 180 න් 102 ස්ථානය වාර්තා කළේය. ඉහළ මට්ටමේ වෙළඳපල ඒකාධිකාරය සහ දේශපාලන ඒකාධිකාරය, ප්‍රජාතන්ත්‍රවාදය අඩු මට්ටම්, සිවිල් ප්‍රජාව අතර දුර්වල සහභාගීත්වය, අඩු විනිවිදභාවය, අකාර්යක්ෂම පරිපාලන ව්‍යුහයන් සහ අඩු ආර්ථික නිදහස හේතුවෙන් දූෂණය සිදුවනු ඇත. එය අසමානතාවය වැඩි කරන අතර දේශපාලන ප්‍රතිචාර දැක්වීම අඩු කරන අතර එමගින් සමාජයේ පුරවැසියන් අතර කලකිරීම වැඩි වේ. එබැවින් එය සංචාරක මෙහෙයුම් සඳහා ගමනාන්තය තුළ අහිතකර තත්ත්වයක් නිර්මාණය කරනු ඇත





## බදු ආදායම අහිමි වීම

මූල්‍ය අවදානම් වඩාත් වැදගත් අංගයක් ලෙස හඳුනාගත හැකි අතර ඇල්ල ප්‍රදේශය ආශ්‍රිත මූල්‍ය අවදානම් හඳුනාගැනීම සඳහා ප්‍රමුඛත්වය දිය යුතුය. කණ්ඩායම් සම්මුඛ සාකච්ඡා මත පදනම්ව, ඇල්ල ප්‍රදේශයේ ප්‍රධාන මූල්‍ය අවදානමක් ලෙස රජයට ලැබිය යුතු බදු ආදායම අහිමිවීම හඳුනාගත හැකිය. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් ප්‍රකාශයට පත් කරන ලද වාර්තාවලට අනුව, ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයෙන් 60% වැඩි ප්‍රමාණයක් ලියාපදිංචි නොකළ කාණ්ඩයට අයත් වේ. මේ නිසා සංචාරක කර්මාන්තයෙන් ලැබිය යුතු වාර්ෂික බදු ආදායම විශාල ප්‍රමාණයක් රජයට අහිමි වේ. ඇල්ල ප්‍රදේශයේ ද කුඩා පරිමාණ ව්‍යාපාර බොහොමයක් ලියාපදිංචි නොකළ කාණ්ඩයට අයත් වේ. අනෙක් අතට මෙය ඇල්ල ප්‍රදේශයේ සංචාරක කර්මාන්තයේ තිරසාර වර්ධනයට බලපා ඇත. එබැවින් එම ගැටලුව විසඳීමට අවශ්‍ය උපාය මාර්ගික ක්‍රියාමාර්ග ගැනීම පිළිබඳව සාකච්ඡාවලදී අවධාරණය කෙරිණ.

## COVID-19 හේතුවෙන් මූල්‍ය අවදානම

තවද, කණ්ඩායම් සාකච්ඡාවෙන් එකතු කරන ලද දත්තවලින් පෙන්නුම් කරන්නේ, ඇල්ල ප්‍රදේශයේ සංචාරක කර්මාන්තයේ ශීඝ්‍ර වර්ධනයට COVID-19 වසංගතය විසින් ඇති කරන ලද අහිතකර බලපෑමයි. COVID-19 වසංගතයේ බලපෑම හේතුවෙන් කුඩා පරිමාණ සංචාරක ව්‍යවසායකයින් තම ණය ආපසු ගෙවීමට අපොහොසත් වීම සහ කාරක ප්‍රාග්ධන ගැටළු වැනි විවිධ මූල්‍ය අවදානම් වලින් පීඩා විඳිති. වසංගතය හේතුවෙන් ඇල්ල ප්‍රදේශයේ සංචාරක ව්‍යාපාරයේ හිඩැසක් ඇති කරමින් කුඩා පරිමාණ සංචාරක ව්‍යාපාර බොහොමයක් සිය මෙහෙයුම් තාවකාලිකව අත්හිටුවා ඇත.

## ප්‍රමාණවත් නොවන සහ යල් පැන ගිය මූල්‍ය නීති රීති

මූල්‍ය අවදානමක් ලෙස හඳුනාගෙන ඇති තවත් කරුණක් නම් ඇල්ල ප්‍රදේශයේ සංචාරක කර්මාන්තයේ තිරසාර වර්ධනයට සහාය නොදක්වන ප්‍රමාණවත් නොවන සහ යල් පැන ගිය නීති රීති ය. එබැවින් සංචාරක ව්‍යාපාරයේ තිරසාර සංවර්ධනය සඳහා අවශ්‍ය නීති සම්පාදනය කිරීම පිළිබඳව කණ්ඩායම් සාකච්ඡාවේදී අවධාරණය කෙරිණි. එපමණක් නොව, ඇල්ල ප්‍රදේශයේ විවිධ මූල්‍ය අවදානම් හේතුවෙන් වැඩි ආයෝජකයින් ගෙන්වා ගැනීම ඇල්ලට අභියෝගාත්මක කාර්යයක් වී ඇත. තවද ඇල්ල ප්‍රදේශයේ හඳුනාගෙන ඇති මූල්‍ය අවදානම් සඳහා ඇල්ල ප්‍රදේශයේ සංචාරක කර්මාන්තයේ තිරසාර සංවර්ධනය සඳහා නිසි ප්‍රධාන සැලැස්මක් නොතිබීම ප්‍රධාන හේතුවක් වී ඇත.

## ගමනාන්තයේ උද්ධමනය සහ ඉඩම් මිල වැඩි වීම

අවට ගම්මානවලට වඩා ඇල්ලේ සෑම දෙයක්ම ඇල්ලෙහි වාසය කරන්නන්ට ඉතා මිල අධික බව කවුරුත් දන්නා සත්‍යයකි. ප්‍රධාන වශයෙන්, ත්‍රී රෝද රථ කුලී මිල ගණන්, ආපනශාලා මිල ගණන් සහ වීදි වෙළෙන්දන්ගේ මිල ගණන් නිසැකව ම තරමක් මිල අධික වන අතර නිවැසියන්ට ද එය අදාළ වේ. ඇල්ල ගම්මානයේ සහ ඒ අවට ප්‍රදේශයේ ඉඩම් මිල ශීඝ්‍රයෙන් ඉහළ ගොස් ඇති අතර එම නිසා අවට ප්‍රදේශයෙන් ඉඩම් මිලදී ගැනීම ප්‍රදේශවාසීන්ට දරාගත නොහැකි තරම්ය. මේ හේතුව නිසා බොහෝ ඉඩම් දැන් සංක්‍රමණිකයන් සතු වන අතර ඇතැම් විට මෙම කණ්ඩායම් අතර ගැටුම් ඇති වේ.



# සමාජ අවදානම්

මෙම අවදානම විස්තර කර ඇත්තේ ජනගහන පදනම් වූ ක්‍රියාකාරකම් සහ සෘණාත්මක මහජන මතයේ ප්‍රතිඵලයක් ලෙස අහිතකර ප්‍රතිවිපාක විඳීමට ඇති හැකියාව ලෙසය.

ඒ අනුව හඳුනාගත හැකි සමාජ අවදානම් කිහිපයක් පහතින් දැක්වේ.

## අනිසි මත්ද්‍රව්‍ය සහ මත්පැන් භාවිතය

සංචාරක ව්‍යාපාරයේ ප්‍රතිඵලයක් ලෙස ඇල්ල ප්‍රදේශයේ මත්ද්‍රව්‍ය භාවිතය ඉහළ ගොස් ඇත. සංචාරකයින් අතර මත්ද්‍රව්‍ය සහ මධ්‍යසාර සඳහා ඉහළ ඉල්ලුමක් පවතින බැවින්, එය ඇල්ල ප්‍රදේශයේ ප්‍රදේශවාසීන්, විශේෂයෙන් පාසල් සිසුන් සහ සමාජයේ අනෙකුත් අවදානම් කණ්ඩායම් අතර මත්ද්‍රව්‍ය / මධ්‍යසාර භාවිතයට බලපෑමක් ඇති කළ හැකිය. ඇතැම් විට පාසල් සිසුන් ද මත්ද්‍රව්‍ය නඩුවලට සම්බන්ධ වෙති. රස කළ බුලත් භාවිතය වැනි කුඩා අවධිවල සිට ගංජා සහ මත්කුඩු භාවිතය වැනි බරපතල අවස්ථා දක්වා මෙය වර්ධනය විය හැක. ඇල්ල සහ ඒ අවට ප්‍රදේශ දේශීය ගංජා සඳහා ඉතා ජනප්‍රිය ප්‍රදේශ වන අතර මෙම ද්‍රව්‍ය ප්‍රදේශයේ අලෙවිකරුවන් සහ සංචාරකයින් අතර ඉතා රහසිගතව සංසරණය වන බව වාර්තා වේ. කෙසේ වෙතත්, නීතිවිරෝධී මත්ද්‍රව්‍ය විකිණීම සහ නීති විරෝධී මත්ද්‍රව්‍ය භාවිතය ඇල්ල ප්‍රදේශයේ බහුලව දක්නට ලැබෙන අතර සෑම මසකම නිතර නිතර ගණිකා වෘත්තිය සහ මත්ද්‍රව්‍ය ජාවාරම් වාර්තා වේ (ශාමිනි සහ බන්දුසේන, 2020). කෙසේ වෙතත්, කොවිඩ් 19 නිසා මේ දැවැන්ත ප්‍රශ්නය තරමක් දුරට අඩු විණි. මේ වනවිට, සංචාරක ව්‍යාපාරය දියුණු වෙමින් පවතින අතර එබැවින් මත්ද්‍රව්‍ය නඩු වැඩි වීමේ ප්‍රතිඵලයක් ලෙස ගැටලුවලට මුහුණ දීමට සිදුවනු ඇත.

## සම්ප්‍රදායික ජීවනෝපාය වලින් සංක්‍රමණය වීම

සාම්ප්‍රදායික ජීවනෝපාය සංක්‍රමණය ඇල්ලේ ප්‍රධාන අවදානම් වලින් එකකි, එහිදී ඇල්ලෙහි බොහෝ මිනිසුන් තම කෘෂිකාර්මික කටයුතු වැනි සාම්ප්‍රදායික ජීවනෝපායන් සම්පූර්ණයෙන්ම අත්හැර සංචාරක කටයුතු සඳහා සංක්‍රමණය විය (කරුණාරත්න සහ පිරිස, 2021). තවද, සංචාරක ව්‍යාපාර සඳහා සම්පූර්ණයෙන්ම සංක්‍රමණය වූ ජනතාවට කොවිඩ් 19 වසංගතය තුළ ඔවුන්ගේ මූලික ජීවනෝපාය වූ සංචාරක කටයුතුවලින් ලැබෙන ආදායම අහිමි වීම හේතුවෙන් දුෂ්කරතා රාශියකට මුහුණ දීමට සිදු විය. එමෙන්ම ,සත්සරණි, ජයකොඩි සහ රණසිංහ (2020) ට අනුව, සංචාරක ක්‍රියාකාරකම් හේතුවෙන් ඇල්ල ප්‍රදේශයේ සාම්ප්‍රදායික ජීවන රටාවක් අහිමි වීම සහ සංචාරක කර්මාන්තය මත පමණක් අධික ලෙස යැපීම ප්‍රධාන සමාජ සංස්කෘතික අවදානම් ඇති කරනු ලබයි.

## ගණිකා වෘත්තිය සහ ලිංගාශ්‍රිතව සම්ප්‍රේෂණය වන රෝග

ගණිකා වෘත්තිය, අනාරක්ෂිත ලිංගික පුරුදු වැනි සැලසුම් නොකළ, අසංවිධානාත්මක සහ නීති විරෝධී සංචාරක ක්‍රියාකාරකම් සමඟ ලිංගාශ්‍රිත රෝග (STD) පැතිරීම ද ඇල්ල ප්‍රදේශය තුළ දැකිය හැකි බරපතල ගැටළු වේ. ඒ අනුව ඇල්ල ප්‍රදේශයේ ප්‍රජාවෙන් HIV/ AIDS රෝගීන් කිහිප දෙනෙකු වාර්තා වී ඇති අතර, කෙසේ වෙතත්, පෞද්ගලිකත්වයේ ගැටළු හේතුවෙන් බලධාරීන් විසින් එම පුද්ගලයන්ගේ තොරතුරු පහසුවෙන් හෙළිදරව් නොකරන අතර එය වළක්වා ගැනීම සඳහා, සංචාරක ක්‍රියාකාරකම් හේතුවෙන් වෛරස් ව්‍යාප්ත වීමේ විශාල තර්ජනයක් ඇති ග්‍රාම නිලධාරී වසමක්, ලෙස. ඇල්ල ප්‍රධාන මංසන්ධියේ විවෘත පෝස්ටර් කිහිපයක් ප්‍රදර්ශනය කර ඇත.

දැනට පවතින තොරතුරුවලට අනුව, HIV සම්ප්‍රේෂණ උවදුරු කිහිපයක් එකවර වාර්තා වුවත්, සමස්තයක් ලෙස ඇල්ල ප්‍රදේශයේ ඒඩ්ස් වසංගතය දැනට අඩු මට්ටමක පවතී. HIV සහ වෙනත් ලිංගාශ්‍රිත රෝග ව්‍යාප්තිය වැඩි රටවල් සහ ජනගහන කණ්ඩායම් වලින් ඇල්ල වෙත සංචාරය කිරීම වැඩි වීම, මෙම අවදානම් තත්වය උග්‍ර කළ හැකි නිසාවෙන් මේ සඳහා නව අවධානයක් යොමු කර ඇත. විදේශිකයන් සමඟ සමීප අන්‍යෝන්‍ය සබඳතාවක් සහ මිත්‍රත්වයක් ගොඩනගා ගැනීමට දේශීය ජනතාව උත්සාහ කිරීම මෙම තත්ත්වයට එක් හේතුවකි. අනෙක් අතට, මුදල් මත පදනම් වූ සම්බන්ධතාවය ද මෙයට හේතු වේ. එමෙන්ම, එකතු කරන ලද දත්තවලින් හෙළි වන්නේ දේශීය පිරිමින් සහ සංචාරක කාන්තාවන් අතර (සාමාන්‍යයෙන් ආර්ථික බලය අසමාන පුද්ගලයන් අතර) ලිංගික සම්බන්ධතා ඇති බවයි. එබැවින්, නිරීක්ෂණ අනුව ලිංගිකව සම්ප්‍රේෂණය වන රෝග අනාගතයේදී වැඩි වනු ඇත.

## සංස්කෘතික පරිහානිය

ඇල්ල ප්‍රදේශයේ සාම්ප්‍රදායික ජීවන රටාවට හා සංස්කෘතික වටිනාකම්වලට හානි සිදුවී ඇති බව එකතු කරන ලද දත්තවලින් පෙනී යයි. ඇතැම් විට පාසල් සිසුන් ආකර්ශනීය ස්ථාන නැරඹීමට විදේශිකයන් සමඟ සංචාරය කිරීමෙන් හෝ විදේශිකයන්ගේ හැසිරීම් රටා අධ්‍යයනය කිරීමෙන් විදේශීය සංස්කෘතිය අනුකරණය කිරීමට පෙළඹේ. සිසුන් පමණක් නොව, ඔවුන්ගේ මව්වරුන් ද විලාසිතා සහ බටහිර සම්ප්‍රදායන් අනුකරණය කිරීමට උත්සාහ කරති. මිනිසෙකු තම ජීවිතය ගත කරන ආකාරය ප්‍රධාන වශයෙන් ඔහුගේ පවුල් පසුබිම සහ එය වටා බැඳුණු සියල්ලේ බලපෑමකි. මේ අනුව, ඇල්ල ප්‍රදේශයේ සංචාරක ව්‍යාපාරය සහ ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් මගින් සැලකිය යුතු ලෙස සංස්කෘතික පරිහානිය  සිදුව ඇති බව නිරීක්ෂණය විය.

## දේශීය ජනතාවගේ ජීවන රටාව වෙනස් කිරීම

විකල්ප ආදායම් මාර්ගය ලෙස ඇල්ල ප්‍රදේශයේ පවුල් විශාල සංඛ්‍යාවක් හෝම් ස්ටේස් (Homestays), කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර, ආපනශාලා, සංචාරක මාර්ගෝපදේශන සේවා, ප්‍රවාහන සේවා ආදී විවිධ සංචාරක කටයුතුවල නියැලෙමින් සිටිති. එම නිසා පවුලේ සියලු දෙනාම සංචාරක ක්‍රියාකාරකම්වල නිරත වන බැවින් සහ ඔවුන් සංචාරකයින් සමඟ බොහෝ අන්තර් ක්‍රියා කරන බැවින් සංචාරක කර්මාන්තය ඇල්ල ප්‍රදේශයේ පවුල් විශාල සංඛ්‍යාවකගේ දෛනික ජීවන රටාවට බලපා ඇත. කණ්ඩායම් සාකච්ඡාවට සහභාගී වූ වෛද්‍ය නිලධාරීවරයාගේ අත්දැකීමට අනුව වයස අවුරුදු 15-16 ට අඩු දරුවන්ට ඉතා කුඩා දේවල් ඉතා බරපතළ කාරණා ලෙස සලකනු ලැබේ.සමාජ සංස්කෘතික පරිසරයට සංචාරක ව්‍යාපාරයේ අයහපත් බලපෑම් කුමක් වුවද ඔවුන් ජීවත් වන්නේ ඔවුන් විසින් මවාගත් ෆැන්ටසි ලෝකයක වන අතර ඔවුන් බටහිර සම්ප්‍රදායන් අනුකරණය කිරීමට උත්සාහ කරයි. තවද ඔවුන්ගෙන් ඇතැමෙක් හවසට ත්‍රිරෝද රථ පදවාගෙන මුදල් උපයන්නේ පාසල්වල ඉගෙන ගෙන හොඳ රැකියාවක් කරනවාට වඩා මුදල් ඉපයීම පහසු ක්‍රමයක් වන බැවිනි. ඇල්ලේ හෝම්ස්ටේ මෙහෙයුම් හා සම්බන්ධ බොහෝ ගැටලු අතර පෞද්ගලිකත්වය අහිමි වීම සහ පවුල් ඒකකය බිඳ වැටීම නිරීක්ෂණය කළ හැකිය. ග්‍රාමීය අංශයට වඩා නගර ප්‍රදේශයට සංචාරක කර්මාන්තයෙන් වැඩි බලපෑමක් එල්ල වී ඇත. කණ්ඩායම් සාකච්ඡාවට සහභාගී වූ නිදහස් දේශීය වෛද්‍ය මධ්‍යස්ථානයේ වෛද්‍ය නිලධාරී ගේ නිරීක්ෂණයට අනුව, ඇල්ල අතීතයට සාපේක්ෂව වර්තමානයේ විශාල වශයෙන් වෙනස් වී ඇත. කෙසේ වෙතත්, කිතල් ඇල්ල සහ දෙමෝදර වැනි දුෂ්කර ප්‍රදේශවල සිටින ප්‍රජා සාමාජිකයින්, ඇල්ල නගර ප්‍රදේශයට සාපේක්ෂව සංචාරක කර්මාන්තයේ බලපෑම සමඟ එතරම් වෙනස් නොවේ. කෙසේ හෝ ඇල්ල නගර ප්‍රදේශයට වැඩි බලපෑමක් එල්ල වී ඇත්තේ වර්තමානයේ කුඩා දරුවන් පවා අතීතයට වඩා වෙනස් ජීවන රටාවක් ගත කරන බැවිනි. එකතු කරන ලද දත්ත වලට අනුව පුංචි ශ්‍රීපාද කඳු මුදුන, ඇල්ල සම්බන්ධයෙන් වතුකරයේ විශාල වෙනසක් මෑතකදී සිදු විය. මෙහිදී වතුකරයේ වතු වගාවල නිරත වූ ප්‍රදේශවාසීන් සාම්ප්‍රදායික වතු වගාවන් වලින් ඉවත් වීම සිදු විය. විශේෂයෙන්ම, බොහෝ දෙමළ ජනයා හෝටල්වල සහ ආපනශාලාවල වැඩ කිරීමට පටන් ගත්හ. එබැවින්, විශාල සංස්කෘතික වෙනසක් මිනිසුන්ගේ ජීවන රටාව තුළ ධනාත්මක ලෙස ඇති විය. ඇල්ල ප්‍රදේශවාසීන්ගේ සාක්ෂරතාව වර්ධනය වීමත් සමඟ ඔවුන් තම දරුවන් අධ්‍යාපනය සඳහා දිරිමත් කළහ. මේ අනුව, එය ප්‍රාදේශීය ප්‍රජාව තුළ ප්‍රධාන ධනාත්මක සංස්කෘතික වෙනසකි. සංචාරක කර්මාන්තය නිසා ඇල්ල ප්‍රදේශවාසීන් ලෝකයට විවෘත මනසක් ලබා ඇත.

## සෞඛ්‍යයට අහිතකර ආහාර රටා

ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය සලකා බැලීමේදී සෞඛ්‍ය සම්පන්න ආහාර වෙනුවට කෘත්‍රිම ආහාරවලට බහුතර ජනතාව යොමු වී ඇත. තවද, කුකුළු මස්, ඌරු මස් සහ සෝස් වර්ග අධික ලෙස පරිභෝජනය කිරීම ළමුන් අතර සෞඛ්‍ය ගැටලු ඇති කරයි. ළමුන් අතර දියවැඩියා රෝගීන් බහුල වීම ආහාර රටාව මත පදනම් වූ තවත් ගැටලුවකි.

## අවිධිමත් ඝන අපද්‍රව්‍ය කළමනාකරණය හේතුවෙන් බෝවන රෝග

ඝන අපද්‍රව්‍ය සම්පූර්ණයෙන් ම මිනිසා විසින් සාදන ලද බේදවාචකයක් වන අතර ඉදිරියේදී ඇති විය හැකි විපත් රාශියකට මිනිසුන් ද දායක වී ඇත. විශේෂයෙන්ම, ඇල්ල හරහා හතු පිපෙන්නාක් මෙන් ආපන ශාලා සහ හෝටල් ඉදිකිරීම් රැසක් සිදුවෙද්දී පරිසරයට පිළිඹදව අවධානය යොමු කිරීම වැදගත් වේ. ඇල්ල කුණු කන්ද නිසා ඒ අවට අපිරිසිදු වී ඇත. එය නගරයෙන් ප්‍රමාණවත් තරම් දුරින් පිහිටා ඇති අතර, එය හානිකර වායූන් සහ දුර්ගන්ධයෙන් පිරී ඇත. කෙසේ වෙතත්, සංචාරකයන් අතර ඇල්ල පිළිඹඳ නරක හැඟීමක් ඇතිවීම වළක්වා ගත හැකි ප්‍රමාණවත් දුරක හෝ ප්‍රමාණවත් ලෙස සඟවා නැත. නුසුදුසු කසළ ගොඩකිරීම් ස්වභාවික උවදුරුවලට තුඩු දෙන අතරම බෝවන රෝගවලට සහ සමාජයේ ව්‍යාපාරික ආයතන ගොඩනැගීමට ද බලපායි.

## අධ්‍යාපනය සඳහා අඩු නැඹුරුවක් පැවතීම

ඇල්ල ප්‍රදේශයේ බොහෝ ජනතාව සංචාරක

ව්‍යාපාරයේ නියැලෙන බැවින් සැලකිය යුතු මට්ටමේ සිසුන් පිරිසක් තම කුඩා කාලයේදීම ආකර්ශනීය ස්ථාන නැරඹීමට සහ සංචාරකයින් සමඟ සංචාරය කිරීමට පුරුදුව ඇත. මෙවැනි ක්‍රියාකාරකම් හරහා සංචාරකයන්ගෙන් මුදල් උපයා ගැනීමට ද සිසුන් පුරුදුව ඇත. එබැවින් අධ්‍යාපනය නොමැතිව තමන්ට මෙම සංචාරක කර්මාන්තයට පිවිසිය හැකි බව ඔවුන් විශ්වාස කරන අතර බොහෝ සිසුන් සාමාන්‍ය පෙළ විභාගයෙන් පාසලෙන් ඉවත් වී යාමේ ප්‍රවණතාවක් පවතී.

### සංචාරක කර්මාන්තය මත අධික ලෙස යැපීම

ඇල්ල සැලකීමේදී කෘෂිකර්මාන්තය ජනතාව සම්බන්ධ වූ මුල්ම ආර්ථික ක්‍රියාකාරකම වන අතර දැන් එය සංචාරක ව්‍යාපාරය සමඟ බෙහෙවින් බැඳී පවතී. සෑම නිවසකම පාහේ අවම වශයෙන් එක් කාමරයක් සාමාන්‍ය මට්ටමින් සකසා හෝම්ස්ටේ මට්ටමක් ලෙස පවත්වාගෙන යයි. එය දිගු කාලයක් තිස්සේ සිදුවෙමින් පවතී. සංචාරක ව්‍යාපාරය ආශ්‍රිත ක්‍රියාකාරකම් මත මෙම අධික ලෙස යැපීම හේතුවෙන් ඔවුන් COVID-19 වසංගතය වැනි තත්වයන් යටතේ ස්ථිර ආදායම් මාර්ගයක් නොමැතිව දුක් විඳිති.

### සංචාරකයින්ගේ නොසැලකිලිමත්, අවදානම් සහ අනතුරුදායක හැසිරීම්

ප්‍රධාන වශයෙන් රාවණා ඇල්ල, කිතල් ඇල්ල, ඇල්ලේ වල, වැනි දිය ඇලි සහ ඇළ දොළ ආශ්‍රිතව සංචාරකයන්ගේ නොසැලකිලිමත්, අවදානම් සහ අනතුරුදායක හැසිරීම් හේතුවෙන් දියේ ගිලී මිය යාමේ අවාසනාවන්ත සිද්ධීන් රැසක් ඇල්ල සහ ඒ අවට ප්‍රදේශවලින් වාර්තා වේ. විපතට පත් වූවන් අතර දේශීය සංචාරකයින් මෙන්ම විදේශීය සංචාරකයින් බොහෝ දෙනෙක් සිටියහ. සංචාරකයින් මෙම ස්ථානවල දිය නෑමට පුරුදුව සිටින අතර අනතුරු ඇඟවීමේ සලකුණු නොසලකා දිය ඇලි මුදුනට නැගීමට උත්සාහ කරන අතර සමහර ස්ථානවල අනතුරු ඇඟවීමේ පුවරු පවා නොමැත.

## පාරිසරික අවදානම්

### අවිධිමත් අපද්‍රව්‍ය කළමනාකරණය

ඇල්ල ප්‍රදේශයේ ඝන අපද්‍රව්‍ය, අපජලය සහ මලාපවහන සම්බන්ධයෙන් නිසි අපද්‍රව්‍ය කළමනාකරණයක් නොමැති බව නිරීක්ෂණය විය. මේ වන විට දිනකට ඝන අපද්‍රව්‍ය ටොන් 6ක් පමණ එකතු වන අතර ඇල්ල ප්‍රාදේශීය රජය විසින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයක් ස්ථාපිත කර ඇතත් එම ක්‍රියාවලිය අකාර්යක්ෂම වේ. මෙලෙස ඉහළ යන සංචාරක පැමිණීමත් සමඟ ඇල්ල නගරයේ ඝන අපද්‍රව්‍ය වැඩිවීම උග්‍ර ගැටලුවක් වී ඇත. ඇල්ල නගරයේ අවන්හල් සහ හෝටල්වල කාබනික අපද්‍රව්‍ය බැහැර කරනු ලබන්නේ ක්‍රමානුකූල නොවන ආකාරයටය. මෙය ඇල්ල නගරය පුරා දුර්ගන්ධයක් පැතිර යාමට හේතු වී ඇති අතර, ඇල්ලේ පිරිසිදු ඔක්සිජන් ඇති බවට විශ්වාස කරන බැවින් හොඳ වාතය සඳහා ඇල්ලට පැමිණෙන සංචාරකයින් තුළ සැකයක් ඇති කරයි. කාර්යක්ෂමව ක්‍රියාත්මක වන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථාන සහ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථාන රට තුළ ඇතත්, ඉතා ජනප්‍රිය සංචාරක ආකර්ෂණයක් තිබියදීත් ඇල්ලට එවැනි පහසුකම් නොමැත.

තවද ඇල්ල ප්‍රදේශයේ නිසි අපජල පද්ධතියක් සහ මලාපවහන පද්ධතියක් නොමැත. පසුගිය වසර කිහිපය තුළ, අපජලය සහ මලාපවහන එකවර ඉහළ යාමත් සමඟ ඇල්ල ප්‍රදේශයේ සංචාරක පැමිණීම්, ජන ඝනත්වය සහ හෝටල්, ආපනශාලා සහ අනෙකුත් සේවා සපයන්නන් වැනි සංචාරක ආයතන සංඛ්‍යාව අඛණ්ඩව වැඩි වෙමින් පවතී. කෙසේ වෙතත්, තවමත්, නිසි ලෙස සැලසුම් කරන ලද අපජල හා මලාපවහන පද්ධතියක් නොමැත. ඇතැම් අවස්ථාවලදී ඇල්ල-බණ්ඩාරවෙල ප්‍රධාන මාර්ගය හරහා දිවෙන විවෘත කාණුවලට අපජලය සෘජුවම මුදාහරින අතර කුඩා ජලධාරාවලටද මුදා හැරේ.

### නිසි ජලාපවාහන පද්ධතියක් නොමැතිකම

ඇල්ල නගරයට නිසි කාණු පද්ධතියක් සහ අපද්‍රව්‍ය බැහැර කිරීමේ පද්ධතියක් නොමැත. බොහෝ කාණු එකිනෙකට සම්බන්ධ නොවන අතර ඇල්ල නගරයේ බොහෝ ස්ථානවල අපද්‍රව්‍ය පිටවීමේ ස්ථාන ඇත. තවද ඒවා ඇතැම් ස්ථානවල විවෘත කර තිබීම නිසා පදිකයින්ගේ ආරක්ෂිත අවධානම මෙන්ම කානු පද්ධති අවහිර වන පරිදි විවෘත ජලාපවහනවලට අපද්‍රව්‍ය දැමීමද සිදු විය. තවද, ඇල්ල නගරය හරහා දිවෙන ඉහත සඳහන් කළ ජලාපවහන පද්ධතියට අමතරව වැසි ජලය බැස යන කාණු පද්ධතියක් එහි නොමැත.

මෙම අපිරිසිදු වාතාවරණය සහ විවෘත ජලාපවහන හේතුවෙන් ඇතැම් ප්‍රදේශවල අප්‍රසන්න පරිසරයක් නිර්මාණය වී ඇති අතර මදුරුවන්, මැස්සන් ඇතුළු කෘමීන් බෝවීම ඉහළ ගොස් තිබේ.

### උමා ඔය ව්‍යාපෘතියේ බලපෑම හේතුවෙන් ජල උල්පත් අතුරුදහන් වීම

උමා ඔයේ ඉහළ ජල පෝෂක ප්‍රදේශයේ කුඩා ජලවිදුලි ව්‍යාපෘතිය නිසා, හදිසි ගංවතුර, වාරිමාර්ග සඳහා ජල හිඟය, පරිසර දූෂණය සහ ජල මූලාශ්‍ර ලෙස භාවිතා කරන උල්පත් සිඳී යාම නිසා ගෘහස්ත අවශ්‍යතා සඳහා ඇතිවන ජල හිඟය ඇතුළු සෘණාත්මක සමාජ හා පාරිසරික බලපෑම් ගණනාවක් ඇත (තෝරදෙණිය සහ වෙනත් අය, 2007). ඇල්ල අවට ගම්මාන රැසකට මෙම ව්‍යාපෘතියෙන් දැඩි බලපෑම් එල්ල වී ඇති අතර දැනට ගම්මාන කිහිපයක නිවෙස්වලට බීමට හෝ කෘෂිකර්මාන්තයට මතුපිට ජලය නොමැත. කෙසේ වෙතත් ඇල්ල අවට ජල උල්පත් මේ වන විට දැඩි තර්ජනයකට ලක්ව ඇති අතර වසරේ සමහර මාසවලදී එම ප්‍රදේශය දැඩි නියඟ තත්ත්වයන්ට මුහුණ දෙයි.

අවිධිමත් අපද්‍රව්‍ය කළමනාකරණය



නිසි ජලාපවාහන පද්ධතියක් නොමැතිකම





අවිධිමත් අපද්‍රව්‍ය කළමනාකරණය

නිසි ජලාපවාහන පද්ධතියක් නොමැතිකම



## වෙනත් අවදානම්

### සැලසුම් නොකළ සහ අසංවිධානාත්මක යටිතල පහසුකම් හේතුවෙන් අනාරක්ෂිත ගමනාන්තයක් බවට පත් වීම

යටිතල පහසුකම් සංවර්ධනය (මාර්ග ඉදිකිරීම) සඳහා රජයේ ආයෝජන නොමැතිකම අනතුරු ඇති කිරීමට හේතු වී ඇති අතර ගමනාන්තය අනාරක්ෂිත ස්ථානයක් ලෙස සලකුණු කර ඇත. අනාරක්ෂිත ස්ථාන හේතුවෙන් සංචාරකයින් විශේෂයෙන් දේශීය සංචාරකයින් ඇල්ල සංචාරය ගැන උනන්දු නොවන බැවින් මෙය අවදානමක් වී ඇත. එබැවින්, අනාරක්ෂිත ඉදිකිරීම්, මාර්ග සහ ව්‍යාපාර පුළුල් වීමේ ප්‍රවණතාවක් ඇති මෙම ගමනාන්තය සඳහා ප්‍රතිපත්ති සම්පාදනය සහ නීති නියාමනය කෙරෙහි දේශපාලන බලපෑම් නොමැතිකම අවදානමක් වී ඇත. මෙයට අමතරව, ඇල්ල ප්‍රදේශයේ සමහර ක්‍රියාකාරකම් නියාමනය කිරීමේදී මධ්‍යම රජය, පළාත් පාලන සහ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට යම් සීමාවන් ඇති බව නිරීක්ෂණය වී ඇත. තිරසාර සංකල්ප සමගින් ඉදිරියට යාමේදී ප්‍රතිපත්ති පරිපාලනය හා නියාමනය කිරීම සඳහා නිසි ව්‍යුහයක් නොමැතිකම ඇල්ලේ පිරිනමන සේවා සහ නිෂ්පාදන පරාසයන්හි තත්ත්ව ප්‍රමිතීන්ට බලපානු ඇත. තිරසාර යන පදය අනාගත භාවිතය සඳහා ස්වභාවික සම්පත් සංරක්ෂණය කිරීම සහ සංරක්ෂණය කිරීම යන අර්ථය ලබා දෙන බැවින්, සංචාරකයින්ගේ අපේක්ෂාවන් ප්‍රශස්ත ලෙස සපුරාලීම සඳහා ගමනාන්ත ක්‍රියාකරුවන් තිරසාරභාවයට අනුකූල නොවන්නේ නම් එය අවදානමක් වනු ඇත. ඇල්ල ගමනාන්තයක් ලෙස සඳහන් කර ඇති පරිදි තිරසාර ආකාරයකින් ක්‍රියාත්මක වන්නේ නම් තිරසාර සංචාරක කර්මාන්තයට ඇල්මක් දක්වන සංචාරකයන් තම ගමනාන්තයන් තීරණය කිරීමේදී ඇල්ල අනිවාර්යයෙන්ම සලකා බලනු ඇත.

ඇල්ලේ යටිතල පහසුකම් සහ ගමනාන්ත යහපැවැත්ම නඟා සිටුවීමට අවශ්‍ය බලයලත් පාර්ශ්ව සම්බන්ධ කර ගැනීමට අවශ්‍ය ක්‍රමවත් සැකසුම් කිරීමේ උපාය මාර්ග ප්‍රශස්ත කිරීම සහ සක්‍රිය කිරීමෙ ප්‍රධාන පාර්ශ්වකරුවා වන රජය විසින් සිදු එය නොකරන බවත්, එය නීතිවිරෝධී සහ ලියාපදිංචි නොකළ සංවර්ධනයට පැහැදිලිවම තුඩුදෙන කාරණයක් බව ප්‍රකාශ කළ හැකිය.

### සංචාරක ආකර්ෂණය නැතිවීම සහ සංචාරක නිෂ්පාදන හා සේවා සඳහා ඇති ඉල්ලුම අඩුවීම

දේශපාලන, මූල්‍ය, සමාජීය, පාරිසරික සහ අනෙකුත් සියලුම සාධක හේතුවෙන් ඇල්ල සංචාරක ගමනාන්තයක් ලෙස සංචාරක ඉල්ලුම සහ ආකර්ෂණය අඩු වනු ඇත. එය ගමනාන්ත ප්‍රතිරූපයට අහිතකර ලෙස බලපානු ඇති අතර එය සංචාරකයින් අතර අනාරක්ෂිත ගමනාන්තයක් ලෙස සලකුණු කරනු ඇත.



## 3.2 සංචාරක ව්‍යාපාරය සඳහා ඇති ප්‍රධාන අවදානම්

### 3.2.1 ප්‍රධාන අවදානම් පිළිබඳ දළ විශ්ලේෂණය

විශේෂඥ වැඩමුළුවේදී හඳුනාගෙන ඇති අවදානම් පහත පරිදි විශ්ලේෂණය කෙරේ. එම අවදානම් ඇල්ල ප්‍රදේශයේ සිදුවන ස්වභාවික හා මිනිසා විසින් සාදන ලද උපද්‍රව යන කාණ්ඩ දෙකක් යටතේ ගවේෂණය කරන ලදී. සෑම අවදානම් වර්ගයක්ම ගමනාන්තයේ සංචාරක අංශයට සෘජු හෝ වක්‍ර බලපෑමක් ඇති කරයි. පහත රූප සටහන මගින් දැනට ඇල්ල ගමනාන්තයේ සංචාරක ව්‍යාපාරයට බලපාන කෙටි කාලීනව හා දිගු කාලීනව පවතින අවදානම් පිළිබඳ සාරාංශගත කර ඇත

**අවදානම්**

**ස්වභාවික**

ජල විද්‍යාත්මක හා භූ විද්‍යාත්මක අවදානම්
- නායයෑම්
- ඉහළ වාර්ෂික වර්ෂාපතන තීව්‍රතාවය
- පාංශු ඛාදනය

ජීව විද්‍යාත්මක අවදානම්
- බැක්ටීරියා මගින් ජලය දූෂණය වීම
- වෘක්ෂලතා අහිමි වීම
- බැර ලෝහ එකතුවීම



*රූප සටහන 3.1 විශේෂඥ වැඩමුළුව හරහා හඳුනාගත් අවදානම් පිළිබඳ සාරාංශය*

**මානව ක්‍රියාකාරකම් නිසා සිදුවන අවදානම්**

දේශපාලන අවදානම්
- දේශපාලන අස්ථාවරත්වය
- පාර්ශ්වකරුවන් අතර අභ්‍යන්තර ගැටුම්
- දේශපාලනයේ නිරන්තර වෙනස්කම්
- ංචාරක වෘත්තිකයන් අතර සම්බන්ධීකරණයක් නොමැතිකම
- යාවත්කාලීන නොකළ නීති සහ රෙගුලාසි
- නීතිය සමානව ක්‍රියාත්මක කිරීමට
- අපොහොසත් වීම
- දූෂණය

මූල්‍ය අවදානම්
- රජයේ ආදායම් බදු අහිමි වීම
- ණය සහ කාරක ප්‍රාග්ධන ගැටළු
- කඩඑෂෘ-19 හේතුවෙන් ඇති අවදානම
- ප්‍රාමාණවත් නොවන සහ යල් පැන ගිය මූල්‍ය රීති සහ රෙගුලාසි හේතුවෙන් නව ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීමේ අභියෝග

සමාජ සහ සංස්කෘතික අවදානම්
- මත්ද්‍රව්‍ය සහ මත්පැන් අනිසි භාවිතය
- සම්ප්‍රදායික ජීවනෝපාය සංක්‍රමණය වීම
- ගණිකා වෘත්තිය සහ ලිංගාශ්‍රිත රෝග පැතිරීම
- සංස්කෘතික පරිහානිය
- ඩෙංගු උණ පැතිරීම
- විධිමත් අධ්‍යාපනය සඳහා යොමුවීමේ අඩු ප්‍රවණතාවය
- සංචාරක කර්මාන්තය මත පමණක් යැපීම සංචාරකයින්ගේ නොසැලකිලිමත්, අවදානම් සහ අනතුරුදායක හැසිරීම



හඳුනාගත් ස්වභාවික අවදානම් සහ ඒවා ඇල්ල සංචාරක ක්ෂේත්‍රයට බලපාන ආකාරය ප්‍රධාන සාධක සමගින් ඒ සඳහා බලපාන ලද හේතු පහත පරිදි විශ්ලේෂණය කර ඇත.

*වගුව 3.3 ස්වභාවික උපද්‍රව , ඒවායේ බලපෑම්, බලපෑමට ලක් වූ පාර්ශ්වයන් සහ ප්‍රධාන සාධක පිළිබඳ සාරාංශය*

| | උපද්‍රවය | බලපෑම | බලපෑමට ලක් වූ පාර්ශවය | ප්‍රධාන සාධක |
|---|---|---|---|---|
| ජල විද්‍යාත්මක හා භූ විද්‍යාත්මක අවදානම් | නායයෑම් | • හෝටල්, මාර්ග පද්ධති, නිවැසියන්ගේ එදිනෙදා ජීවිතයට,<br>සන්නිවේදනය, සෞඛ්‍ය, අධ්‍යාපන පද්ධති සහ ස්වභාවික සුන්දරත්වය සඳහා වන සෘජු බලපෑම්<br>• සංචාරක කර්මාන්තයෙන් ලැබෙන ආදායම අහිමි වීම<br>• දේපල හානි<br>• මරණ (දේශීය සහ විදේශීය සංචාරකයින්)<br>• මානසික ගැටළු (දේශීය සහ විදේශීය සංචාරකයින්) | • දේශීය හෝටල්, මධ්‍යම හා කුඩා පරිමාණ ව්‍යවසායකයින්<br>• ප්‍රාදේශීය ප්‍රජාව<br>• විදේශීය සංචාරකයින් | • දුර්වල ජලාපවහන පද්ධති<br>• කඳු සහ ගංගා අසල ස්වාරක්ෂක කලාප අහිමි වීම<br>• ප්‍රදේශීය ප්‍රජාව අතර පවතින දුර්වල<br>• දැනුවත්භාවය<br>අදාළ දෙපාර්තමේන්තු අතර පවතින දුර්වල සම්බන්ධීකරණය |
| | අධික වර්ෂාපතනය | • අඛණ්ඩ විදුලිය, ජලය සහ විදුලි සංදේශ සැපයීම සඳහා වන බලපෑම් | • ප්‍රාදේශීය ප්‍රජාව<br>• දේශීය ගොවීන්<br>• විදේශීය සංචාරකයින් | • දේශගුණික විපර්යාස<br>• සමාජ අවභාවිතය |
| | පාංශු ඛාදනය | • මාර්ග පද්ධතිය, කෘෂිකාර්මික පද්ධති, ජලාපවහන පද්ධති සහ ස්වභාවික සුන්දරත්වය කෙරෙහි බලපෑම<br>• දේපල හානි<br>• කෘෂිකර්මාන්තය සඳහා ඛණ්ඩනය කිරීමේ ගැටළු<br>• බෑවුමේ අගය වෙනස් වීම<br>• පසෙහි ආම්ලිකතාවයේ වෙනස්වීම් | • දේශීය හෝටල්, මධ්‍යම හා කුඩා පරිමාණ ව්‍යවසායකයින්<br>• ප්‍රදේශීය ප්‍රජාව<br>• විදේශීය සංචාරකයින්<br>• දේශීය ගොවීන් | • දුර්වල ජලාප්‍රවහන පද්ධති<br>• ඉහළ වාර්ෂික වර්ෂාපතනය |
| ජීව විද්‍යාත්මක අවදානම් | බැක්ටීරියා ක්‍රියාකාරීත්වය නිසා ජලය දූෂණය වීම | • සෞඛ්‍ය ගැටළු | • ප්‍රදේශීය ප්‍රජාව<br>• විදේශීය සංචාරකයින් | • දුර්වල පරීක්ෂණ සහ දුර්වල ජලය ක්ලෝරීන කිරීමේ වැඩසටහන්<br>• අරමුදල් නොමැතිකම<br>• ප්‍රාදේශීය ප්‍රජාව අතර දුර්වල දැනුවත්භාවය |
| | වෘක්ෂලතා අහිමි වීම | • වෘක්ෂලතා හා සත්ත්ව විශේෂ අහිමි වීම<br>• ස්වභාවික සුන්දරත්වය නැතිවී යාම | • අවට පරිසරය<br>• ප්‍රාදේශීය ප්‍රජාව<br>• සංචාරක ආකර්ෂණ ස්ථාන | • මානව ක්‍රියාකාරකම්<br>• ප්‍රමානවත් වන සංරක්ෂණ නිලධාරීන් නොමැතිකම |
| | බැර ලෝහ එකතු වීම | • ආක්‍රමණශීලී ශාක සඳහා වන සෘජු බලපෑම් සහ වැව්වල මාළු බෝවීම සඳහා වන සෘජු බලපෑම්<br>• සංචාරකයින්ගේ හැඟීම කෙරෙහි බලපෑම් | • ස්වභාවික පරිසරය<br>• ප්‍රාදේශීය ප්‍රජාව<br>• විදේශීය සංචාරකයින් | • දුර්වල කසළ කළමනාකරණය<br>• දුර්වල ජලාපවහන කළමනාකරණ පද්ධති |
| | ඩෙංගු උණ පැතිරීම | • සංචාරකයින්ගේ ඉල්ලුම කෙරෙහි සෘණාත්මක බලපෑම්<br>• වසංගත ලෙඩ රෝග සහ ජීවිත මරණ | • ප්‍රාදේශීය ප්‍රජාව<br>• විදේශීය සංචාරකයන් | • අකාර්යක්ෂම පාංශු අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධති |

හඳුනාගත් මානව ක්‍රියාකාරකම් නිසා සිදුවන අවදානම් සහ ඒවා ඇල්ල සංචාරක ක්ෂේත්‍රයට බලපාන ආකාරය ප්‍රධාන සාධක සමගින් ඒ සඳහා බලපාන ලද හේතු පහත පරිදි විශ්ලේෂණය කර ඇත.

වගුව 3.4 මිනිසා විසින් සාදන ලද උපද්‍රව, ඒවායේ බලපෑම්, බලපෑමට ලක් වූ පාර්ශ්වයන් සහ ප්‍රධාන සාධක පිළිබඳ සාරාංශය

| | උපද්‍රවය | බලපෑම | බලපෑමට ලක් වූ පාර්ශවය | ප්‍රධාන සාධක |
|---|---|---|---|---|
| දේශපාලන අවදානම් | දේශපාලන අස්ථාවරත්වය | • රටේ පවතින තත්ත්වය සාමාන්‍ය පරිදි සංචාරක කටයුතු කරගෙන යාම තාවකාලිකව නතර කිරීමට හේතු වී ඇත | • ප්‍රාදේශීය ප්‍රජාව<br>• විදේශීය සංචාරකයින්<br>• පළාත් පාලන ආයතන | • ඩොලර් අර්බුදය රටේ දේශපාලන තත්වයේ අස්ථාවරත්වයට දැවැන්ත ලෙස බලපා ඇති අතර අස්ථායි සංචාරක ක්‍රියාකාරකම් සඳහා ද හේතුවී ඇත |
| | පාර්ශවකරුවන් අතර අභ්‍යන්තර ගැටුම් | • රජයේ නිලධාරීන් සහ සංචාරක වෘත්තිකයන් අතර පවතින ඝට්ටනය | • පළාත් පාලන ආයතන<br>• මධ්‍යම හා කුඩා පරිමාණ ව්‍යවසායකයින්<br>• ප්‍රාදේශීය ප්‍රජාව | • අභ්‍යන්තර හා බාහිර පාර්ශ්වකරුවන් අතර අකාර්යක්ෂම සන්නිවේදනය<br>• පාර්ශ්වකරුවන් අතර සම්බන්ධීකරණයක් නොමැතිකම |
| | ප්‍රතිපත්තීන්ගේ සිදුවන නිරන්තර වෙනස්කම් | • ආන්තික ආර්ථික ප්‍රතිපත්ති පසුබෑම, සංචාරක අංශයට ආදායමක් උපයා ගැනීම කෙරෙහි බලපෑම | • පළාත් පාලන ආයතන<br>• ප්‍රාදේශීය ප්‍රජාව<br>• ප්‍රතිපත්ති සම්පාදකයින්<br>• විභව ආයෝජකයින් | • ස්ථාවර ප්‍රතිපත්ති නොමැතිකම<br>• ප්‍රතිපත්තිවල සිදුවන නිරන්තර වෙනස්වීම් සංචාරක වෘත්තිකයන්ගේ වැඩ කාලසටහන්වලට බාධා කිරීම |
| | සංචාරක වෘත්තිකයන් අතර සම්බන්ධීකරණයක් නොමැතිකම | • අත්‍යාවශ්‍ය පාර්ශව රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයට සෘජුව සම්බන්ධ වීමට අකමැති බැවින් රාජ්‍ය ආයතන අතර ගැටලුකාරී තත්ත්වයන් නිර්මාණය කිරීම | • හෝටල් හිමියන්<br>• මධයම හා කුඩා පරිමාණ ව්‍යවසාය<br>• විදේශීය සංචාරකයින් | • පාර්ශවකරුවන් අතර තොරතුරු ප්‍රවාහයේ අකාර්යක්ෂමතාව |
| | යාවත්කාලීන නොකළ නීති සහ රෙගුලාසි | • විවිධ තත්ත්වයන් යටතේ සේවාවලට අදාළ යාවත්කාලීන නොවන නීති රීති හේතුවෙන් අවශ්‍ය බලධාරීන් සඳහා සේවාව සැපයීමේ අවදානම | • විභව ආයෝජකයින්<br>• පළාත් පාලන ආයතන<br>• ප්‍රතිපත්ති සම්පාදකයින් | • පාර්ශවකරුවන් අතර නිසි දිශානතියක් නොමැතිකම |
| | නීතිය සමානව ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වීම | • නීති රෙගුලාසි අක්‍රිය වීම හේතුවෙන් ප්‍රාදේශීය ප්‍රජාවට දෛනිකව වැඩ කටයුතු සුමටව කරගෙන යාමට අපහසු වීම<br>• ව්‍යාපරිකයන් සඳහා වෙළඳ බලපත්‍රය ලබා ගැනීමට අපහසු වීම | • ප්‍රාදේශීය ප්‍රජාව<br>• විදේශීය සංචාරකයන් | • දේශපාලඥයින් සමඟ ඇති දේශපාලන සබඳතා මත වෙළඳ බලපත්‍රය නිකුත් කිරීම<br>• එක් එක් පාර්ශවකරුවන් සඳහා සමාන අයිතිවාසිකම් පවත්වා ගැනීමට කැපවීමක් නොමැති වීම |
| | දූෂණය | • ශ්‍රී ලංකාව පිළිබඳ ජාත්‍යන්තර ප්‍රතිරූපය හානි කිරීමට තුඩු දෙයි<br>• වාර්තා ලබා ගැනීමේදී රාජ්‍ය අංශයේ ආයතන සහ ව්‍යවසායකයින්ට ඇති වන දුෂ්කරතා | • පළාත් පාලන ආයතන<br>• විභව ආයෝජකයින් | • සම්පත් ඵලදායී කළමනාකරණයක් සම්බන්ධයෙන් රාජ්‍ය අංශයේ සේවකයින්ගේ වගකීම නොමැතිකම |

| | | | | |
|---|---|---|---|---|
| මූල්‍යමය අවදානම් | රජයේ බදු ආදායම අහිමි වීම | • බදු ප්‍රතිපත්තිය ලිහිල් කිරීම රාජ්‍ය ආයතන සහ ආර්ථිකය අස්ථාවර කරයි | • පළාත් පාලන ආයතන<br>• ප්‍රාදේශීය ප්‍රජාව | • වත්මන් බදු ප්‍රතිපත්තියේ විනිවිදභාවයක් නොමැති වීම<br>• මහා පරිමාණ ව්‍යවසායකයන්ගෙන් අයකරනු ලබන බදු අඩු කිරීම |
| | ණය සහ කාරක ප්‍රාග්ධන ගැටළු | • කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට තම ණය ගැටළුවලට මුහුණ දීමට සිදුවේ | • මධ්‍යම හා කුඩා පරිමාණ ව්‍යවසායකයින් | • රටේ ආර්ථික පසුබෑම ඩොලර් අනුපාතිකයේ අධික ලෙස ඉහළ යාම |
| | COVID-19 වසංගතය සහ වත්මන් ආර්ථික අර්බුදය හේතුවෙන් ව්‍යාපාරවල පවතින අස්ථාවරත්වය | • මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ දුෂ්කරතා | • විදේශීය සංචාරකයින්<br>• ප්‍රාදේශීය ප්‍රජාව<br>• මධ්‍යම හා කුඩා පරිමාණ ව්‍යවසායකයින් | • සංචාරක අංශයට වෙන්කර ඇති මහජන අරමුදල් ප්‍රමාණවත් නොවීම<br>• සංචාරක කලාපවල ගැසට් නොවන අඩු මූල්‍ය අවශ්‍යතා පවතින ක්‍රියාකාරකම් සඳහා රාජ්‍ය අරමුදල් භාවිතා කිරීම |
| | ප්‍රමාණවත් නොවන සහ යල් පැන ගිය මූල්‍ය නීති රීති හේතුවෙන් නව ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීමේ අභියෝගය | • ශ්‍රී ලංකාවෙ ව්‍යාපාර සඳහා ආයෝජනය කිරීමේදී ව්‍යවසායකයින්, රාජ්‍ය අංශයේ වෘත්තිකයන් සහ ආයෝජකයින් කෙරෙහි දැඩි බදු ප්‍රතිපත්ති බලපෑම්<br>• ශ්‍රී ලාංකීය ව්‍යාපාර නගා සිටුවීමේදී දේශීය හා ජාත්‍යන්තර ධනපතියන් අහිමි වීම | • පළාත් පාලන ආයතන<br>• ප්‍රතිපත්ති සම්පාදකයින් | • රජයේ සහ මහ කොමසාරිස් කාර්යාලවල මැදිහත් වීමක් නොමැතිකම<br>• යල් පැන ගිය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම |
| සමාජ සහ සංස්කෘතික අවදානම් | මත්ද්‍රව්‍ය භාවිතය සහ මත්පැන් පානය කිරීම | • යෞවනයන් මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහි වීම | • පාසල් දරුවන්<br>• ප්‍රාදේශීය ප්‍රජාව | • ප්‍රජා සංස්කෘතීන් තුළ මධ්‍යසාර නිෂ්පාදන භාවිතය ඉහළ ව්‍යාප්තිය |
| | සාම්ප්‍රදායික ජීවනෝපායවලි-න් සංක්‍රමණය වීම | • විවිධ ව්‍යාපාර සමඟ සම්බන්ධ වන විට සම්ප්‍රදායික වාසස්ථාන සහ ජීවන රටාව වෙනස්වීම | • ප්‍රාදේශීය ප්‍රජාව | • නව සහ පහසු ආදායම් උත්පාදන ක්‍රමවල නිරත වීමට ඇති ආකර්ෂණය |
| | ගණිකා වෘත්තිය සහ ලිංගාශ්‍රිත සම්ප්‍රේෂණය වන රෝග පැතිරීම | • තරුණ පරම්පරාවේ ජීවන රටා නොමග යවන රැ කියා වලට අනුගත වෙමින් පැවතීම | • ප්‍රාදේශීය ප්‍රජාව<br>• විදේශීය සංචාරකයන් | • ලිංගිකව සම්ප්‍රේෂණය වන රෝග පිළිබඳ අවබෝධයක් නොමැතිකම |

| | | | |
|---|---|---|---|
| සංස්කෘතික පරිහානිය | • දේශීය හරවත් සංස්කෘතිය විනාශවීම | • ප්‍රාදේශීය ප්‍රජාව | • ප්‍රාදේශීය ප්‍රජාවගේ සම්ප්‍රදායික ජීවන රටාව වෙනස්වීම |
| අධ්‍යාපනය කෙරෙහි ඇති  අඩු නැඹුරුව | • නීතිගත කරන ලද ව්‍යාපාරික අවස්ථා සමග සම්බන්ධ වීමට උගත් ශ්‍රම බලකායක් හිඟවීම | • පාසල් ළමුන්<br>• ප්‍රාදේශීය ප්‍රජාව | • වෙළෙඳපොළ තුළ ව්‍යාපාරවල දිගුකාලීන පැවැත්ම පිළිබඳ දැනුවත්භාවය නොමැතිකම |
| සංචාරක කර්මාන්තය මත පමණක් යැපීම | • නව කර්මාන්ත පිළිබඳ හඳුනාගැනීමක් නොමැතිකම නිසාවෙන් සංචාරක ව්‍යවසාය බිඳවැටුනහොත් සංචාරක කර්මාන්තයෙන් පමණක් නියැලෙමින් සිටින ජන කොටස්වල පැවැත්මට බලපෑමක් ඇති කරනු ලබයි | • ප්‍රාදේශීය ප්‍රජාව<br>• මධ්‍යම හා කුඩා පරිමාණ ව්‍යවසායකයින් | • පටු අදහස් සහ පහසුවෙන් ආදායම් උත්පාදනය කළ හැකි මාර්ගයන් අපේක්ෂා කිරීම |
| අධ්‍යාපනය කෙරෙහි ඇති අඩු නැඹුරුව | • නීතිගත කරන ලද ව්‍යාපාරික අවස්ථා සමග සම්බන්ධ වීමට උගත් ශ්‍රම බලකායක් අඩු, පරම්පරාවක් පැවතීම | • පාසල් ළමුන්<br>• ප්‍රාදේශීය ප්‍රජාව | • වෙළෙඳපොළ තුළ ව්‍යාපාරවල දිගුකාලීන පැවැත්ම පිළිබඳ දැනුවත්භාවය නොමැතිකම |



## 3.2.2 අවදානම් සම්භාවිතාව සහ බලපෑම් ආකෘතිය

අවදානම් සම්භාවිතාව සහ බලපෑම් ආකෘතිය ජනප්‍රිය ගුණාත්මක ඇගයීම් ක්‍රමයකි. එය අවදානම් විචල්‍ය දෙකක් මත පදනම් වේ. එනම් සිදුවීමේ හැකියාව සහ එය සිදුවුවහොත් අරමුණු කෙරෙහි ඇති බලපෑම මතය. පහත රූප සටහනින් අවදානම් සම්භාවිතාව සහ බලපෑම් ආකෘතිය විස්තර කරයි, එය එක් එක් හඳුනාගත් අවදානම් සාධකය සඳහා අවදානම් කලාපය තීරණය කරයි. න්‍යාසය 5০5 වන අතර, එහි බලපෑම තිරස් අක්ෂයේ ඉතා පහළ සිට ඉතා ඉහළ සහ සිරස් අක්ෂයේ සම්භාවිතාව දක්වා විහිදේ (Dumbrava, 2013).

| | |
|---|---|
| රතු කලාපය (අඳුරු) | මෙම කලාපයේ අවදානම් තීරණාත්මක වැදගත්කමක් ඇති අතර ඒවා වළක්වා ගත යුතු හෝ මාරු කළ යුතුය; මේවා ප්‍රමුඛතා වන අතර ඒවා කෙරෙහි දැඩි අවධානයක් යොමු කළ යුතුය. |
| රතු කලාපය (ළා පැහැති) | මෙම කලාපයේ අවදානම් තීරණාත්මක වැදගත්කමක් ඇති අතර ඒවා වළක්වා ගැනීම, අඩු කිරීම, මාරු කිරීම හෝ වෙනත් ඇල්මැති පාර්ශවයන් සමඟ බෙදා ගත යුතුය, මේවා ප්‍රමුඛතා වන අතර ඒවා කෙරෙහි ද දැඩි අවධානය යොමු කළ යුතුය. |
| කහ කලාපය | මෙම කලාපයේ අවදානම් මධ්‍යස්ථ වැදගත්කමක් ඇති අතර ඒවා පාලනය කළ යුතුය. |
| හරිත කලාපය (අඳුරු) | මෙම කලාපය තුළ පිහිටා ඇති අවදානම් සාධක පහත් මට්ටමේ බලපෑම් ලෙස සලකනු ලබන අතර ඒවා විශේෂයෙන් තද කොළ කලාපයේ තිබේ නම් ඒවා පාලනය කළ හැකිය. |
| හරිත කලාපය (ළා පැහැති) | මෙම කලාපයේ අවදානම් නිරීක්ෂණය කළ හැකි, පාලනය කළ හැකි හෝ නොසලකා හැරිය හැකි ඉතා අඩු බලපෑමක් ඇති කරයි(Kassem et al, 2019). |




*රූපය 3.2 අවදානම් සම්භාවිතාව සහ බලපෑම් ආකෘතිය*
*මූලාශ්‍රය: Kassem et al, 2019*

අවදානම් සම්භාවිතාව සහ බලපෑම් ආකෘතිය භාවිතයෙන් විශේෂඥ වැඩමුළුවේදී ඉදිරිපත් කරන ලද ස්වභාවික අවදානම් තත්ත්ව සාරාංශය පහත වගුව මගින් නිරූපනය කෙරේ.

*වගුව 3.5 අවදානම් සම්භාවිතාව සහ බලපෑම් ආකෘතිය ස්වාභාවික අවදානම් සාරාංශය*

| ස්වභාවික අවදානම් | | | |
|---|---|---|---|
| අවදානම | | අවදානම් තත්වය | වර්ණය |
| ජල විද්‍යාත්මක හා භූ විද්‍යාත්මක අවදානම් | නායයෑම් | ඉඉ, ඉඉ | |
| | අධික වර්ෂාපතන සිදුවීම් | ඉ, ඉ | |
| | පාංශු ඛාදනය | ඉ, ම | |
| ජීව විද්‍යාත්මක අවදානම් | බැක්ටීරියා ජලය දූෂණය වීම | ම, ඉ | |
| | වෘක්ෂලතා අහිමි වීම | ම, ම | |
| | බැර ලෝහ සමුච්චය | ම, ම | |
| ඉතාම ඉහළයි = ඉඉ, ඉහළයි = ඉ, මධ්‍යස්ථයි = ම, අවමයි = අ, ඉතාම අවමයි = ඉඅ | | | |



පහත වගුව සම්භාවිතා බලපෑම් අවදානම් අනුකෘතිය භාවිතයෙන් විශේෂඥ වැඩමුළුවේදී ඉදිරිපත් කරන ලද මිනිසා විසින් සාදන ලද අවදානම් තත්ත්ව සාරාංශය පහත වගුව මගින් නිරූපානය කෙරේ.

*වගුව 3. අවදානම් සම්භාවිතාව සහ බලපෑම් ආකෘතිය අනුව මිනිසා විසින් සාදන ලද උපද්‍රව පිළිබඳ සාරාංශය*

| මිනිසා විසින් සාදන ලද උපද්‍රව | | | |
|---|---|---|---|
| අවදානම් | | අවදානම් තත්ත්වය | වර්ණය |
| දේශපාලන අවදානම් | දේශපාලන අස්ථාවරත්වය | ඉඉ, ඉඉ | |
| | පාර්ශවකරුවන් අතර අභ්‍යන්තර ගැටුම් | ම, ඉ | |
| | ප්‍රතිපත්තිවල නිරන්තර වෙනස්කම් | ඉ, ම | |
| | සංචාරක වෘත්තිකයන් අතර සම්බන්ධීකරණයක් නොමැතිකම | ඉ, ම | |
| | යාවත්කාලීන නොකළ නීති සහ රෙගුලාසි | ඉ, ඉ | |
| | නීතිය සමානව ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වීම | ඉ, ම | |
| | දූෂණය | ඉඉ, ඉඉ | |
| මූල්‍යමය අවදානම් | රජයේ බදු ආදායම අහිමි වීම | ඉ, ඉ | |
| | ණය සහ කාරක ප්‍රාග්ධන ගැටළු | ඉ, ම | |
| | COVID-19 වසංගතය හේතුවෙන් ව්‍යාපාරයේ අස්ථාවරත්වය සහ වත්මන් ආර්ථික අර්බුදය | ම, ඉ | |
| | ප්‍රමාණවත් නොවන සහ යල් පැන ගිය මූල්‍ය නීති රීති හේතුවෙන් නව ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීමේ අභියෝගය | ම, ම | |
| සමාජ සහ සංස්කෘතික අවදානම් | මත්ද්‍රව්‍ය භාවිතය සහ මත්පැන් පානය කිරීම | ම, ම | |
| | සම්ප්‍රදායික ජීවනෝපාය සංක්‍රමණය | ම, ම | |
| | ගණිකා වෘත්තිය සහ ලිංගිකව සම්ප්‍රේෂණය වන රෝග පැතිරීම | අ, ඉඅ | |
| | සංස්කෘතික පරිහානිය | ම, ම | |
| | ඩෙංගු උණ පැතිරීම | ම, ම | |
| | අධ්‍යාපනය කෙරෙහි ඇති අඩු නැඹුරුව | අ, ඉඅ | |
| | සංචාරක කර්මාන්තය මත පමණක් යැපීම | ඉ, ඉඉ | |
| | සංචාරකයින්ගේ නොසැලකිලිමත්, අවදානම් සහ අනතුරුදායක හැසිරීම | අ, ම | |

ඉතාම ඉහළයි = ඉඉ, ඉහළයි = ඉ, මධ්‍යස්ථයි = ම, අවමයි = අ, ඉතාම අවමයි = ඉඅ



## අවදානම් සම්භාවිතාව සහ බලපෑම් ආකෘතිය ඇල්ල සංචාරක ප්‍රදේශයට අදාලව සම්භාවිතා ශ්‍රේණිගත කිරීම

සම්භාවිතා ශ්‍රේණිගත කිරීම

| සම්භාවිතා ශ්‍රේණිගත කිරීම | | | | | |
|---|---|---|---|---|---|
| 5<br>ඉතාම ඉහළය | | | | • රජයේ බදු ආදායම අහිමි වීම<br>සංස්කෘතික පරිහානිය<br>• සංචාරක කර්මාන්තය පමණක් මත යැපීම | • නාය යෑම්<br>• දේශපාලන අස්ථාවරත්වය දූෂණය<br>• ඩෙංගු උණ පැතිරීම |
| 4<br>ඉහළයි | | | • බැක්ටීරියා ක්‍රියාකාරීත්වය නිසා ජලය දූෂණය වීම<br>• පාර්ශවකරුවන්අ තර අභ්‍යන්තර ගැටුම් | • අධික වර්ෂාපතනය<br>• යාවත්කාලීන නොවන නීති සහ රෙගුලාසි<br>• COVID-19 වසංගතය හේතුවෙන් ඇතිවූ අවදානම අධ්‍යාපනය කෙරෙහි ඇති අඩු නැඹුරුව | |
| 3<br>මද්‍යස්ථයි | | • සංචාරකයින්ගේ නොසැලකිලිමත්, අවදානම් සහ අනතුරුදායක හැසිරීම | • වෘක්ෂලතා අහිමි වීම<br>• මත්ද්‍රව්‍ය භාවිතය සහ මත්පැන් පානය<br>• සම්ප්‍රදායික<br>• ජීවනෝපායවලින් සංක්‍රමණය වීම | • පාංශු ඛාදනය<br>• ප්‍රතිපත්තිවල නිරන්තර වෙනස්වීම්<br>• සංචාරක වෘත්තිකයන් අතර සම්බන්ධීකරණයක් නොමැතිකම<br>• නීතිය සමානව ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වීම<br>• ණය සහ කාරක ප්‍රාග්ධන ගැටළු<br>• නව ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීමේ අභියෝගය | |
| 2<br>අවමයි | | | | | |
| 1<br>ඉතාම අවමයි | | • ගණිකා වෘත්තිය<br>ලිංගිකව සම්ප්‍රේෂණය වන රෝග පැතිරීම | | | |
| | 1<br>ඉතාම අවමයි | 2<br>අවමයි | 3<br>මද්‍යස්ථයි | 4<br>ඉහළයි | 5<br>ඉතාම ඉහළය |

බලපෑම් ඇගයීම

*රූපය 3.3 ඇල්ලේ ස්වභාවික හා මිනිසා විසින් සාදන ලද අවදානම් සම්භාවිතා බලපෑම් අනුකෘතිය*

# අවදානම් අවම කිරීමේ ක්‍රියාමාර්ග

4 පරිච්ඡේදය



## 4.1 හඳුනාගත් ක්‍රියාවන් සඳහා විභව විකල්ප පිළිබඳ දළ විශ්ලේෂණය

### 4.1.1 ජල විද්‍යාත්මක සහ භූ විද්‍යාත්මක අවදානම්

#### 1. නායයෑම්

මෙම උපද්‍රව අවම කර ගැනීම සඳහා නායයෑම් වළක්වා ගැනීම සඳහා පසෙහි ගුණාත්මක මට්ටම සංරක්ෂණය කළ හැකි හොඳින් සැලසුම් කළ ජලාප්‍රවහන පද්ධතියක් ඇල්ල ප්‍රදේශයේ ක්‍රියාත්මක කළ යුතු බව වැඩමුළුවට සහභාගි වූ විශේෂඥයෝ නිර්දේශ කළහ.

#### 2. අධික වර්ෂාපතනය

අධික වර්ෂාපතනය නිසා පාංශු ඛාදනය, නාය යෑම් සහ ගංගා පතුලෙහි මඩ තැන්පත් වීම සිදු විය හැක. එබැවින් භූගත ජලය කාන්දුවීම පාලනය කිරීමසහ නැවත වන වගාව කිරීම මගින් ඇල්ලේ සංවේදී කඳුකර ප්‍රදේශය සංරක්ෂණය කිරීම වෘත්තිකයන්ගේ උපදෙස් විය. මීට අමතරව, සුදුසු භෝග තෝරාගැනීම ද මේ සඳහා උපකාර විය හැක. තවදුරටත්, නව වාරිමාර්ග සංවර්ධනය සහ ඇල්ල ප්‍රදේශයේ ජලය ආශ්‍රිත අනෙකුත් යටිතල පහසුකම් සංවර්ධනය මගින් ද ආපදා අවදානම් අවම කිරීම කළ හැක.

#### 3. පාංශු ඛාදනය

විශේෂඥයින්ගේ අදහස්වලට අනුව, පාංශු ඛාදනය අවම කර ගැනීම සඳහා ඇල්ල ප්‍රදේශයේ ගොඩනැගිලි ඉදිකිරීම සඳහා ප්‍රමාණවත් නියාමනයක් අවශ්‍ය බව යෝජනා විය. ඒ අනුව සංවේදී භූමි ප්‍රදේශවල හෝටල්, ආපනශාලා සහ අනෙකුත් විශාල ගොඩනැගිලි

සංවර්ධනය කිරීම වැළැක්වීම වැදගත් වේ. මීට අමතරව, ඉඩමේ ගුණාත්මක මට්ටම පවත්වා ගැනීම සඳහා ඇල්ල ප්‍රදේශයේ සිදු කෙරෙන අධික ඉදිකිරීම් සහ අනවසර ඉදිකිරීම් හැකි ඉක්මනින් නතර කළ යුතු බවත් යෝජනා විය.

### 4.1.2 ජීව විද්‍යාත්මක අවදානම්

#### 1. බැක්ටීරියා ක්‍රියාකාරීත්වය නිසා ජලය දූෂණය වීම

ඇල්ල ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාට අනුව, ඇල්ල ප්‍රදේශයේ ජල සාම්පල පරීක්ෂා කිරීමේදී *E. coli* බැක්ටීරියාව සොයාගෙන ඇත. මෙය ඇල්ල ප්‍රදේශයේ සංචාරකයන්ගේ සහ පදිංචිකරුවන්ගේ සෞඛ්‍යයට අහිතකර බලපෑමක් ඇති කළ හැකි බැවින් මෙය ඉතා බරපතළ කාරණයකි. මෙම තීරනාත්මක උවදුර අවම කිරීම සඳහා, නිතිපතා ජල සාම්පල පරීක්ෂා කිරීම සහ පිළිගත් ජල මට්ටම පවත්වා ගැනීම සඳහා ජල පරීක්ෂණ සහ පිරිසිදු කිරීමේ කම්හලක් ස්ථාපිත කිරීම සඳහා වෘත්තිකයන්ගේ උපදෙස් අතර විය.

#### 2. වෘක්ෂලතා අහිමි වීම

විශේෂඥයින්ගේ පර්යේෂණ අධ්‍යයනයට අනුව අනාවරණය වූයේ ඇල්ලේ දේශගුණය ස්වභාවිකව ඇති වන ලැව්ගිනි සඳහා අහිතකර නොවන බැවින් ඇල්ලේ ලැව් ගිනි ඇතිවීමට එකම හේතුව මිනිස් ක්‍රියාකාරකම් බවයි. එම නිසා අදාළ සියලු පාර්ශවකරුවන් සඳහා හේතු පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම අවශ්‍ය බව යෝජනා විය. එබැවින්, ඇල්ල ප්‍රදේශයේ පාසල් සිසුන්, ව්‍යාපාරික පාර්ශ්වකරුවන්, පුරවැසියන් සහ අනෙකුත් ප්‍රජා සාමාජිකයින් ඇතුළු ප්‍රදේශයේ වෘක්ෂලතා තිරසාර සංරක්ෂණය සම්බන්ධව සියලුම අදාළ පාර්ශ්වකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමෙන් වෘක්ෂලතා හානිය අවම කර ගත හැක.

#### 3. බැර ලෝහ එකතුවීම

බැර ලෝහ එකතු වීම සහ අනෙකුත් අකාර්යක්ෂම අපද්‍රව්‍ය කළමනාකරණ පිළිවෙත් අවම කිරීම සඳහා ඇල්ල ප්‍රදේශයේ අපද්‍රව්‍ය පවිත්‍රාගාරයක් ස්ථාපිත කිරීමට විශේෂඥයින් උපදෙස් දෙන ලදී. තවද, බැර ලෝහ එකතු වීම සහ අනෙකුත් අපද්‍රව්‍ය අවම කිරීම සඳහා නිසි අපද්‍රව්‍ය කළමනාකරණ පිළිවෙත් පිළිබඳව ප්‍රජාව, ව්‍යාපාරිකයන්, රාජ්‍ය සේවකයින් සහ අනෙකුත් අදාළ පාර්ශ්වකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම ද අවශ්‍ය යෝජනා විය.

#### 4. ඩෙංගු (බෝවන රෝග) පැතිරීමේ අවදානම

කසළ බැහැර කිරීමේ ඒකක සැලකිය යුතු සංඛ්‍යාවක් ස්ථාපිත කිරීමෙන්, නියමිත පරිදි ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම යම් ප්‍රමාණයකට අවම කර ගත හැක. එමෙන්ම, ඝන අපද්‍රව්‍ය එකතු කර පොලිතින්, කාබෝඩ් සහ ආහාර අපද්‍රව්‍ය ලෙස වර්ග කර ප්‍රතිචක්‍රීකරණය කිරීම හෝ කොම්පෝස්ට්, ජීව වායුව යනාදිය නිෂ්පාදනය ලෙස නගර සභාවලටද සිදුකළ හැකිය. ඊට අමතරව, අනිසි ලෙස කසල බැහැර කරන පුද්ගලයන්ට එරෙහිව නීතිමය පියවර ගත යුතුය.

### 4.1.3 දේශපාලන අවදානම්

#### 1. දේශපාලන අස්ථාවරත්වය

පවතින අස්ථාවර දේශපාලන තත්ත්වය සංචාරක කර්මාන්තයට බොහෝ අයහපත් බලපෑම් ඇති කළ හැකිය. මෙම තත්ත්වය අවම කර ශ්‍රී ලංකාව ජාතියක් ලෙස සංවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලාංකේය දේශපාලන සම්ප්‍රදාය මත පදනම් වූ ස්ථාවර ජාතික ප්‍රතිපත්ති ස්ථාපිත කිරීම වෘත්තිකයන් විසින් ඉදිරිපත් කළ ප්‍රධාන යෝජනාව විය. රට පාලනය කරන දේශපාලන පක්ෂයට අනුව ජාතික ප්‍රතිපත්ති වෙනස් නොකරන දේශපාලන ස්ථාවර රටක් නිර්මාණය කිරීමට මෙය ඉවහල් වනු ඇත.

#### 2. පාර්ශ්‍රවකරුවන් අතර අභ්‍යන්තර ගැටුම්

ඇල්ල ප්‍රදේශයේ සංචාරක කර්මාන්තයේ නියැලෙන පාර්ශ්‍රවකරුවන් අතර ඵලදායී සහයෝගීතා ජාලයක් ක්‍රියාවට නංවා ඔවුන්ගේ අවශ්‍යතා බෙදාහදා ගැනීම, නිසි අවබෝධය ඉහළ නංවාලීම තුළින් සහ එක් එක් පාර්ශවයන් අදාළ රාජ්‍ය බලධාරීන්ගේ නායකත්වය සමග සම්බන්ධ කිරීම මගින් සංචාරක ව්‍යාපාරය හා සම්බන්ධ විවිධ පාර්ශ්‍රවකරුවන් අතර පවතින අභ්‍යන්තර ගැටුම් අවම කරගත හැක.

#### 3. ප්‍රතිපත්තිවල නිරන්තර වෙනස්වීම්

මෙරට ජාතික සංචාරක ප්‍රතිපත්තිවල අඛණ්ඩ උච්චාවචනයන් විශේෂඥ වැඩමුළුවේදී හඳුනාගත් තවත් ප්‍රධාන දේශපාලන අවදානමකි. රටේ පාලක දේශපාලන පක්ෂය වෙනස් වීමත් සමග ප්‍රතිපත්ති උච්චාවචනය වන අතර එය සංචාරක කර්මාන්තයට අහිතකර බලපෑම් රාශියක් ඇති කරයි. එබැවින්, සංචාරක කර්මාන්තය තිරසාරව පවත්වාගෙන යාමට සහ ජාතික ආර්ථිකයට එහි ධනාත්මක බලපෑම වැඩි කිරීමට තිරසාර සහ ස්ථාවර ජාතික සංචාරක ප්‍රතිපත්ති සකස් කිරීම අවශ්‍ය වේ. දේශපාලන තත්ත්වය සමග වෙනස් කළ නොහැකි වෘත්තිකයන් විසින් මෙම ප්‍රතිපත්ති සකස් කළ යුතුය.

#### 4. සංචාරක වෘත්තිකයන් අතර සම්බන්ධීකරණයක් නොමැතිකම

රාජ්‍ය සේවකයින්ගේ සහ අනෙකුත් සංචාරක පාර්ශවකරුවන්ගේ දැනුම හා කුසලතා වර්ධනය කිරීම සඳහා අඛණ්ඩ වැඩසටහන් සංවිධානය කිරීම සහ අවශ්‍ය දැනුම හා කුසලතා වැඩි දියුණු කිරීම සඳහා කර්මාන්තයේ පාර්ශවකරුවන් අඛණ්ඩව දැනුවත් කිරීම සඳහා ඉගෙනුම් වැඩසටහන් ආරම්භ කිරීම අවශ්‍ය වේ.

#### 5. යාවත්කාලීන නොකළ නීති සහ රෙගුලාසි

සංචාරක ව්‍යාපාරයේ ප්‍රවණතා කෙතරම් ඉක්මනින් වෙනස් වෙමින් පවතීද යන්න සලකා බලා ජාතික හා කලාපීය වශයෙන් වෙළඳපොලේ පවතින සහ අනාගත ප්‍රවණතා සහ අවස්ථා අනුව වෙනස් කළ හැකි තිරසාර නීති සහ රෙගුලාසි රාමුවක් නිර්මාණය කිරීම අත්‍යවශය වේ.

#### 6. නීතිය සමානව ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වීම

සෑම කෙනෙකුටම නීතිය යටතේ සමාන ආරක්ෂාවක් ලබා දීම සඳහා ලිඛිත නීති සම්පාදනයක් සහ නීතිමය ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම විශේෂඥයින් විසින් නිර්දේශ කරන ලදී.

#### 7. දූෂණය

ජාතියේ දූෂණය අවම කිරීම සඳහා විශේෂඥයන්ගේ නිර්දේශය වූයේ දැඩි හා දැඩි නීති රීති පද්ධතියක් පැනවීමයි.

### 4.1.4 මූල්‍ය අවදානම්

#### 1. රජයේ බදු ආදායම අහිමිවීම

ඇල්ල ප්‍රදේශයේ ලියාපදිංචි නොවූ සංචාරක ආයතන රැසක් පැවතීම නිසා රජයේ බලධාරීන්ට බදු ආදායම අහිමි වීම සංචාරක කර්මාන්තයේ දියුණුවට බාධාවක් විය. එබැවින් ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය කෙරෙහි අවධානය යොමු කරමින් සාධාරණ සහ තිරසාර බදු ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම අනිවාර්ය අවශ්‍යතාවයකි. තවද, විශේෂඥයන්ගේ යෝජනාවට අනුව, අදාළ බදු ගෙවීමට සංචාරක සංචාරක කර්මාන්තයේ නියැලෙන පුද්ගලයින් දිරිමත් කිරීම සඳහා බදු ප්‍රතිපත්තිය ස්ථාවර හා සරල ස්වභාවයකින් යුක්ත විය යුතුය.

#### 2. ණය සහ කාරක ප්‍රාග්ධන ගැටළු

COVID-19 වසංගත තත්ත්වය හේතුවෙන් ණය ආපසු ගෙවීමට නොහැකි වීම කාරක ප්‍රාග්ධන ගැටළු වලින් එකකි. රටේ අස්ථාවර ආර්ථික තත්ත්වය තුළ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් දැඩි ලෙස අවදානමට ලක්වන බැවින්, විශේෂයෙන් සංචාරක කර්මාන්තය තුළ සිටින කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසායකයින් සඳහා දීර්ඝ කාලීන අරමුදල් යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට විශේෂඥයෝ යෝජනා කළහ.

තවද, ඇල්ල ප්‍රදේශයේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් බොහෝ දෙනෙක් අදාළ රාජ්‍ය බලධාරීන් සමග ලියාපදිංචි වී නොමැති බැවින් ඔවුන් අවිධිමත් අංශයට අයත් වේ. එබැවින්, මෙම කුඩා හා මධ්‍ය පරිමාණ ක්‍රියාකරුවන් අරමුදල් මූලාශ්‍ර සෙවීම සඳහා ක්ෂුද්‍ර මූල්‍ය ආයතන වෙත ගමන් කරයි. මෙයට හේතුව වනුයේ,හොඳින් ස්ථාපිත මූල්‍ය ආයතනවලින් අරමුදල් සෙවීම සම්බන්ධයෙන් බොහෝ ගැටලු සහ අභියෝග පැවතීමයි. නමුත් මේ ක්ෂුද්‍ර මූල්‍ය

ආයතන අධීක්ෂණය කිරීමට නිසි යාන්ත්‍රණයක් රට තුළ නොමැතිකම ඇතැම් විට අසාධාරණ සහ අත්තනෝමතික ක්‍රියා පටිපාටිවලට තුඩු දෙයි. එබැවින් මෙම ක්ෂුද්‍ර මූල්‍ය ආයතනවල අත්තනෝමතික ක්‍රියා පටිපාටි අවම කිරීම සඳහා ඒවා අධීක්ෂණය කිරීමේ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ.

මීට අමතරව, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් සඳහා ඔවුන්ගේ අරමුදල් අවශ්‍යතා සපුරාලීම සඳහා උපදේශන සේවාවක් දියත් කිරීමට විශේෂඥයෝ යෝජනා කළහ.

### 3. COVID-19 හේතුවෙන් අවදානම

වසංගත සහ වෙනත් අස්ථායී තත්ත්වයන් නිසා ඇති වන ගැටලු අවම කර ගැනීම සඳහා සුදුසු මූල්‍ය ආයෝජන රාමුවක් අනුගමනය කළ යුතු බව විශේෂඥයෝ පවසති. ප්‍රමාණවත් නොවන සහ යල් පැන ගිය මූල්‍ය ප්‍රමිති සහ රෙගුලාසි නිසා නව ආයෝජකයින් ආකර්ශනය කර ගැනීම දුෂ්කර ය. ශ්‍රී ලංකාවේ සංචාරක සමාගම් දිගු කාලීනව සාර්ථක වීමට නම් දේශීය හා විදේශීය ආයෝජකයින් රට වෙත ඇදී යා යුතුය. ඒ අනුව දේශීය හා විදේශීය ආයෝජකයින් ශක්තිමත් කළ යුතුයි. ඒ සඳහා බදු ප්‍රතිපත්තියේ කොටස් දෙකම ලිහිල් කළ යුතුය. රජයේ මැදිහත් වීමක් නොමැතිකම සහ සංචාරක ක්ෂේත්‍ර සඳහා ඉහළ කොමිස් මුදල් ලබා දීම හේතුවෙන්, ආයෝජකයින්ගෙන් බහුතරයක් තවදුරටත් ලංකා සංචාරක සමාගම්වල ආයෝජනය කිරීමට නැඹුරු නොවේ. මෙම දැඩි බදු රෙගුලාසි ශ්‍රී ලංකාවේ සමාගම්වල ආයෝජනය කිරීමට තීරණ ගත් ආයෝජකයින්ට, ව්‍යාපාර හිමිකරුවන්ට, රාජ්‍ය අංශයේ සේවකයින්ට ක්ෂණික බලපෑමක් ඇති කරයි. යල්පැන ගිය නීති රීති හේතුවෙන්, බදු ප්‍රතිපත්තිය ලිහිල් වන අතර, එමගින් ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයට රටේ ආර්ථිකයේ වර්ධනයට උපකාර වන දේශීය හා විදේශීය ආයෝජකයින් අහිමි වනු ඇත.

## 4.1.5 සමාජ සහ සංස්කෘතික අවදානම්

### 1. මත්ද්‍රව්‍ය භාවිතය සහ මත්පැන් භාවිතය

මත්පැන් භාවිතය, මද්‍යසාර භාවිතය නිසා සිදුවන හානිය සහ මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ මහජන ප්‍රතිචාරවල වෙනස්කම් නිරීක්ෂණය කිරීම මෙන්ම එම තොරතුරු විශ්ලේෂණය කිරීම සහ බෙදා හැරීම අදාළ පියවරයන් ගැනීම සඳහා තීරණාත්මක වනු ඇත. හානිකර මධ්‍යසාර භාවිතයේ ප්රමාණය මෙන්ම භාවිතය වැළැක්වීමේ ක්‍රම , ප්‍රතිකාර ක්‍රමවල ඵලදායීතාවය සහ පිරිවැය ඵලදායීතාවය පිළිබඳ තොරතුරු ප්‍රජා මට්ටමින් ක්රමානුකූලව ඒකාබද්ධ කර පුළුල් කළ යුතුය. විශේෂයෙන්ම ආර්ථික හා සමාජ සංවර්ධනය සඳහා මද්‍යසාර භාවිතය, මද්‍යසාර ආශ්‍රිත හානිය සහ බලපෑම පිළිබඳ ක්‍රමානුකූල සමාලෝචනයක් කළ යුතුය. ඊට සමගාමීව, දෘශ්‍යමාන දැනුවත්භාවය (උදා: ජනාකීර්ණ ප්‍රදේශවල ප්‍රදර්ශනය කළ හැකි LED දැන්වීම් පුවරු) ප්‍රභල උපාය මාර්ගයක් විය හැකිය. එමෙන්ම අදාළ ප්‍රතිපත්ති වර්තමාන තත්ත්වය මත පදනම් විය යුතු අතර නිශ්චිත අරමුණු, උපාය මාර්ග සහ ඉලක්ක ඇතුළත් විය යුතුය. ප්‍රතිපත්තියක් සමඟ නිශ්චිත ක්‍රියාකාරී සැලැස්මක් ප්‍රතිපත්තියක් මෙන්ම ඵලදායි හා දිගුකාලීන ක්‍රියාත්මක කිරීමේ සහ ඇගයීම් පද්ධති ද මේ සඳහා තිබිය යුතුය. සිවිල් සමාජය සහ ආර්ථික ක්රියාකාරීන් ඵලදායී ලෙස එක්ව කටයුතු කිරීම ද ඉතා වැදගත් වේ. තවද දැනට පවතින පුළුල් ජාතික සහ උපජාතික උපාය මාර්ග, ක්‍රියාකාරී සැලසුම් සහ සියළුම මුලපිරීම් හානිකර මත්පැන් භාවිතය වළක්වා ගැනීම සඳහා ශක්තිමත් කළ යුතුය

එපමණක් නොව, ඇල්ල ප්‍රසිද්ධ සංචාරක ගමනාන්තයක් වන අතර, සංචාරක පොලිසියක් මෙහි ස්ථාපිත කර නොමැත. එබැවින් සංචාරකයින්ගේ ආරක්ෂාව සහ ආරක්ෂාව සහතික කිරීම සඳහා සංචාරක පොලිසියක් ස්ථාපිත කිරීම අවශ්‍ය වී තිබේ. වගකීම් සහගත රාජ්‍ය ආයතනවලට යොවුන් වියේ සිටම මත්පැන් සහ මතද්‍රව්‍යවල අයහපත් ප්‍රතිවිපාක පිළිබඳව ජනතාව දැනුවත් කිරීමට, ප්රවර්ධනය කිරීමට සහ දිරිගැන්වීමට හැකිය. මන්ද ඔවුන් මත්ද්‍රව්‍ය භාවිතය වැලැක්වීමට පහසුවෙන් සම්බන්ධ විය හැකි අය වන බැවිනි. මෙහිදී ඔවුන් හට මත්පැන්වල අයහපත් ප්‍රතිවිපාක පිළිබඳ දැනුවත්ව සිටින අතරම, සෞඛ්‍ය සම්පන්න ආහාරවල වැදගත්කම සහ යෝග සහ භාවනා වැනි සෞඛ්‍ය සම්පන්න ජීවන රටාවන් ප්‍රවර්ධනය කළ හැකිය.

### 2. සම්ප්‍රදායික ජීවනෝපායන්ගෙන් සංක්රමණය වීම

ඇල්ල ප්‍රදේශය සංචාරක ව්‍යාපාරය මත යැපීම ආරම්භ වන තුරු, ප්‍රජාවගේ ප්‍රධාන ආදායම් මාර්ගය වූයේ කෘෂිකර්මාන්තයයි. ඇල්ල ප්‍රජාවගේ පාරම්පරික ජීවනෝපායන් අතර මැටි භාණ්ඩ, කිරි ගොවිතැන සහ එළවළු වගාව ද විය. මෙම සාම්ප්‍රදායික ජීවනෝපායන් ඇල්ල ප්‍රජාවට සාමාන්‍ය සංචාරක නිෂ්පාදනවලට වඩා වැඩි ආදායමක් උපයන සංචාරක නිෂ්පාදන බව නිසි මඟපෙන්වීමක් සමඟින් තහවුරු කළ හැකිය. ප්‍රජාවගේ සම්ප්‍රදායික අතින් සාදන ලද මැටි බඳුන්, වියන ලද පැදුරු ආදිය සංචාරකයින්ට සිහිවටන ලෙස අලෙවි කළ හැකිය. ඒ අතරම, එය සමාජයේ සාම්ප්‍රදායික නිර්මාණ අඛණ්ඩව පවත්වා ගැනීමට උපකාරී වේ.

### 3. ගණිකා වෘත්තිය සහ ලිංගාශ්‍රිත රෝග

ප්‍රජා දැනුවත් කිරීමේ වැඩසටහන්වල ප්‍රධාන අරමුණ විය යුත්තේ HIV/AIDS සහ වෙනත් ලිංගාශ්‍රිත රෝග පිළිබඳව ගම්වාසීන්ගේ දැනුම වැඩි දියුණු කිරීම මෙන්ම මෙ ම රෝග වලින් ආරක්ෂා වන්නේ කෙසේද දැනුවත් කිරීමයි. එම දැනුවත් කිරීම් සඳහා විද්‍යුත් මාධ්‍ය, විද්‍යුත් නොවන මාධ්‍ය සහ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් යොදා ගත හැකි අතර, ඒ සමඟම ප්‍රජාව සඳහා රෝග නිශ්චය කර ගැනීම සඳහා සෞඛ්‍ය ප්‍රචාරක කඳවුරු කිහිපයක් ද පැවැත්විය හැකිය. සංචාරකයින් සමඟ සෘජුව සම්බන්ධ වන හෝටල් හිමියන්, සංචාරක නියෝජිතයන් වැනි පිරිස් එම ප්‍රචාරණ සහ දැනුවත් කිරීමේ සැසිවලට සහභාගී වන්නේ නම් එය වඩාත් ඵලදායී විය හැකිය. ඒ අනුව ලිංග ාශ්‍රිත රෝග රෝගීන් සිටින ප්‍රධාන ප්‍රදේශයක් වන ඇල්ල ප්රදේශය වෙත අවශ්‍ය සෞඛ්‍ය පහසුකම් සහ වෛද්‍ය ආධාර වැඩිදියුණු කළ යුතුය.

### 4. සංස්කෘතික පරිහානිය

මෙහිදී අදාළ රාජ්‍ය ආයතන, ප්‍රාදේශීය ප්‍රජාව සංස්කෘතික පරිහානිය පිළිබඳව දැනුවත් විය යුතුය. තවද, සාම්ප්‍රදායික සංස්කෘතියේ වටිනාකම ගැන ඔවුන් සතු දැනුම ඔවුන්ව සාම්ප්‍රදායික සංස්කෘතියේ භාරකරුවන්, ආරක්ෂකයින් වීමට බල ගන්වයි. ඉන්පසුව, සාම්ප්‍රදායික සංස්කෘතික අයිතම සහ කර්මාන්ත අනාගත පරම්පරාවන් සඳහා සුරක්ෂිත කරමින් අත්දැකීම් මත පදනම් වූ සංචාරක නිෂ්පාදන ලෙස සංවර්ධනය කිරීමට දිරිමත් කළ හැකිය.

ඇල්ල ප්‍රදේශයේ බහුතරයක් හෝම් ස්ටේස් (Homestay) ඉදිකර ඇත්තේ නිවැරැදිවම හෝම් ස්ටේ සංකල්පය නොදැනය. එය සංචාරකයින්ට අව්‍යාජ ශ්‍රී ලාංකීය සංස්කෘතිය අත්විඳිය හැකි ස්ථානයක් විය යුතු අතර, එය ඇල්ල ප්‍රජාවගේ අව්‍යාජ සංස්කෘතිය අත්විඳීමට කැමති සංචාරකයින්ගේ පරම අපේක්ෂාව වනු ඇත. එබැවින් අත්දැකීම් මත පදනම් වූ සංචාරක අත්දැකීමක් සැපයීම සඳහා අව්‍යාජ සාම්ප්‍රදායික සංස්කෘතියට අනුකූලව හෝම් ස්ටේස් ප්‍රතිසංස්කරණය කළ යුතුය.

### 5. ප්‍රදේශවාසීන්ගේ ජීවන රටා වෙනස් කිරීම

මෙහිදී ඇල්ල ප්‍රදේශවාසීන්ගේ සාම්ප්‍රදායික ජීවන රටාව පවත්වා ගැනීමේ වැදගත්කම සහ ඔවුන්ගේ ජීවන රටාවට සෘජුවම සම්බන්ධ වන නැටුම්, මැටි භාණ්ඩ වැනි සාම්ප්‍රදායික භාණ්ඩ සඳහා ඇති ඉල්ලුම පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම වැදගත් වේ. එපමණක් නොව, සංචාරකයින්ගේ බටහිරකරණය වූ ජීවන රටාවන්ට වඩා ස්වදේශීය සම්ප්රදායික ජීවන රටාව පරම්පරාවෙන් පරම්පරාවට පවත්වාගෙන යාමට ඇල්ල ප්‍රදේශවාසීන් බලගැන්වීම ද කළ යුතුය.

### 6. අධ්‍යාපනය කෙරෙහි ඇති අඩු නැඹුරුව

රජයේ සංචාරක ව්‍යාපාරයට සම්බන්ධ ආයතන සහ ඇල්ල ප්‍රදේශයේ හෝටල් මඟින් විධිමත් අධ්‍යාපනයක් සහ සංචාරක ව්‍යාපාරය පිළිබඳ අධ්‍යාපනයක් ඇති අයට පමණක් සංචාරක ව්‍යාපාරයට අදාළ ව්‍යාපාරවල නියැලීමට අවස්ථාව සලසා දෙන්නේ නම්, ඔවුන් බොහෝ විට විධිමත් අධ්‍යාපනයක් ලබනු ඇත. එසේම සංචාරක ව්‍යාපාරය ආශ්‍රිත වෘත්තීන්හි (උදා: සංචාරක මඟපෙන්වීම) අධ්‍යාපන මට්ටමට අනුකූලව වැටුප් විභේදනය හඳුන්වා දීමෙන් අධ්‍යාපනය සඳහා නිරායාස වටිනාකමක් නිර්මාණය වනු ඇත.

### 7. සංචාරක කර්මාන්තය මත අධික ලෙස රඳා පැවතීම

ඇල්ල ප්‍රදේශයේ බහුතරයක් ප්‍රජාව සංචාරක ව්‍යාපාරය ආශ්‍රිත ව්‍යාපාරවල නියැලෙන්නේ තමන්ට ඉහළ ආදායමක් උපයා ගත හැකි එකම ජීවනෝපාය සංචාරක ව්‍යාපාරය බව ඔවුන් විශ්වාස කරන බැවිනි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ඔවුන් සංචාරක කර්මාන්තයෙන් උපයාගත් සියලුම මුදල් සංචාරක ව්‍යාපාරයට සම්බන්ධ ව්‍යාපාරයක නැවත ආයෝජනය කරනු ලබයි. නමුත් වසංගත තත්වයන් වැනි අවස්ථා කිහිපයක් සඳහා එය වඩාත් හොඳ තේරීමක් නොවේ. එබැවින්, උපයාගත් මුදල් ආයෝජන කළඹක සහ විවිධාංගීකරණය වූ ව්‍යාපාරවල ආයෝජනය කරන්නේ නම්, සංචාරක ව්‍යාපාරය මත අධික ලෙස යැපීමේ අවදානම අවම කර ගත හැකිය. එසේම, බිම් මට්ටමේ සංචාරක සහ සත්කාරක පහසුකම් සපයන්නන් සඳහා මූල්‍ය කළමනාකරණය ඉගැන්වීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්විය යුතුය.

## පාර්ශවකරුවන් සඳහා වැඩමුළුව











## 4.2 සමීක්ෂණ ප්‍රතිඵල ඉදිරිපත් කිරීම සඳහා "ක්‍රමානුකූල එකඟතා ගොඩනැගීම" ප්‍රවේශය



වත්මන් අධ්‍යයනයෙන් ඇල්ල ප්‍රදේශයේ ආපදාවන්ට ඔරොත්තු දීමේ හැකියාව සඳහා අවැසි ක්‍රියාවන්, බාධක සහ ප්‍රවේශ ස්ථාන සඳහා විකල්ප හඳුනා ගැනීම සඳහා "ක්‍රමානුකූල එකඟතා ගොඩනැගීම" ප්‍රවේශය භාවිතා කරන ලදී. මෙම ප්‍රවේශය මඟින් බහුතරයේ ප්‍රියතමයන් වෙනුවට සියලුම පාර්ශවකරුවන් විසින් ඉහළම සහ අවම ප්‍රතිරෝධී විකල්පයන් සෙවීමට සහ අභියෝග/ප්‍රමුඛතා සහ යනාදී වශයෙන් වඩාත්ම අවශ්‍ය විකල්පය තෝරාගැනීමට ගැනීමට ඉඩ සලසයි. එයට පහත පියවර ඇතුළත් වේ.

**පියවර 1** — **සන්දර්භය නිර්වචනය කිරීම**

සමතුලිතතාවය, සහභාගීත්වය, දිගුකාලීන දිශානතිය සහ සහයෝගීතාවය සහතික කරමින් ලබා දී ඇති ප්‍රදේශය/ගැටළු/අභියෝග පිළිබඳව දැනුවත් භාවය සහ පසුබිම් සෙවීම.

**පියවර 2** — **විකල්ප එකතු කිරීම**

අ) හඳුනා ගැනීම - බුද්ධි කලම්බනය, මනස අධ්‍යයනය (පසබා ජව), කණ්ඩායම් සාකච්ඡා ආදිය.
ආ) හඳුනාගත් විකල්ප විශ්ලේෂණය කිරීම

**පියවර 3** — **සමාන විකල්ප නියෝජනය කරන නියමයන් සම්පාදනය කිරීම**

අ) වර්ගීකරණය
ආ) මෙටා කාණ්ඩ සාරාංශ කිරීම

**පියවර 4** — **ප්‍රතිරෝධය-නැඹුරු ඡන්දය**

## 4.3 අවදානම් අවම කිරීම සඳහා වූ ක්‍රමෝපායන්

4.1 වගුවට අනුව, ඇල්ල ප්‍රදේශයේ හඳුනාගත් අවදානම් සඳහා ක්‍රියාවන් සඳහා අවම කිරීමේ උපාය මාර්ග/විකල්ප දෙකකට වඩා සම්බන්ධ වූ බැවින් තීරණය සඳහා පද්ධතිමය එකඟතා ප්‍රවේශය භාවිතා කරන ලදී. එය මතභේදාත්මක තීරණ සමඟ ගැටුම් අවම කර ඇති අතර සරල ඡන්දය ප්‍රකාශ කිරීමට වඩා සහභාගිවන්නන් සතුටු විය.

